FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

# රංගිරි ශ්‍රී ලංකා

RANGIRI SRI LANKA NEWSPAPER



FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු



ශ්‍රී.බු.ව. 2563- ක්‍රි.ව. 2020
පෙබරවාරි (නවම්)

මාසික බෞද්ධ සාර සංග්‍රහය - අන්තර්ජාල කලාපය

15




**සිතගිරි තුරු මතින් ළා හිරු කිරණ විදා
රන්වන් දඹුල සෑ මළුවම කරයි උදා
පින්දම් කරන දෙස් දෙස් දන මලින් පුදා
රන්ගිරි වෙහෙර නමදිති බැති සිතින් සදා**

## ඇතුළු පිටු.......

- නවම් පොහොය වර්ණාව
- බුදු සසුන එකලු කළ නවම් පොහොය
- එදා බණ අසන වෙනස අද
- නිවන් මග නියත වීමට නම්
- සත්වයාගේ පැවැත්ම සඳහා භෞතික පරිසරය දායකවන ආකාරය පිළිබඳ බෞද්ධ විග්‍රහය
- "සුරස" අතිරේකය


රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය

RSL TELEVISION

UHF CH 60
PEO TV CH 22
Dialog Tv 21
Dish Tv 2532

රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය
දේශයේ රන් හඬ

RSL RADIO

FM 104.4 - 105.7

වෙබ් : www.rangirisrilanka.lk



# නවම් පෝය වර්ණාව

වසරක් ගෙවී නව වසරක් උදාවෙන මේ අවස්ථාවේ එළඹෙන නවම් පොහෝදිනය බෞද්ධ ජනතාවට ශාසනික වශයෙන් වැදගත් සිදුවීම් රැසක් ඇතිකරන ලද්දකි. සම්මා සම්බුද්ධත්වයෙන් පසු ලෝකාර්‍ථ චරියාවේ යෙදුණු අප බුදුරජාණන් වහන්සේ කෙරෙහි පැහැදුණු බොහෝ ජනයා ශාසනයට ඇතුල් වී ප්‍රව්‍රජ්‍යා භූමියට පත්වූහ. මේ හේතුවෙන් භික්ෂූන් වහන්සේලා විශාල පිරිසක් ශ්‍රාවකයන් බවට පත්වූහ. තමන් වහන්සේගේ ශ්‍රාවක පිරිස ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි යෙදවීම පිණිස පළමුවරට රජගහනුවර වේළුවනාරාමයට රැස්කරවන ලද්දේ, නවම් පොහෝ දිනකය.

මෙය සම්බුද්ධ ශාසනයෙහි සඳහන්වෙන පළමු සංඝ සම්මේලනය ලෙස සැළකේ.භික්ෂූන් වහන්සේලාගේ චිර පැවැත්ම සඳහා අවශ්‍යවන ප්‍රාතිමෝක්ෂ දේශනාව පැවැත්වීම සිදුවූයේද නවම් පොහෝදකය. මෙය ශාසනික වශයෙන් ඉතාවැදගත් වන්නේ සංඝ සමාජයට අවශ්‍ය විනය නීති රැසක් මෙමගින් ඇතිවීම හේතු කොට ගෙනය. ''ඕවාද ප්‍රාතිමෝක්ෂ දේශනාව'' යනුවෙන් හඳුන්වාදී තිබේ. මේ හේතුවෙන් සංඝ සමාජය තුළ පිබිදීමක් ඇතිවිය. විනයධර, ධර්මධර, භික්ෂුපිරිසක් බිහිවිය. මිථ්‍යා දෘෂ්ටිගතව විහාල ශ්‍රාවක පිරිසක් පිරිවරාගෙන සිටි උරුවේල කාශ්‍යප,නදී කාශ්‍යප,ගයාකාශ්‍යප යන තුන්බෑ ජටිලයන් වෙතට වැඩම කෙට ධර්ම මාවතට යොමුකරවය ලද්දේ නවම් පොහෝදාය.සංඝ සමාජය දියුණු තත්වයකට පත්වීමට මෙය ප්‍රධාන හේතුවක් වූ බව ශාසන ඉතිහාස තොරතුරු වලින් පැහැදිලි වෙයි.

සම්බුද්ධ ශාසනයේ ශ්‍රාවක පිරිස වැඩිවෙන්නට වූයෙන් අගතනතුරු ප්‍රදානය කිරීමේ අවශ්‍යතාවයක් ඇතිවිය. සංඝ සමූහයා අතරින් ඉතා සුදුසුකම් ලැබූ දකුණත්සව් තනතුර සැරියුත් මහරහතන් වහන්සේටත් වමත්සව් තනතුර මුගලන් මහරහතන් වහන්සේටත් පිරිනැමූයේ නවම් පොහෝ දිනකය. ධර්මසේනාධිපති තනතුර සැරියුත් මහරහතන් වහන්සේට පිරිනැමීමද සිදුවිය. මෙම වැදගත් පොහොය නිමිති කරගෙන ලක්දින බොහෝ විහාරස්ථානයන්හි ආමිස පූජා ප්‍රතිපත්ති පූජාවන්හි යෙදෙන ජනතාවගෙන් පිරීපවතී.

මහනුවර ශ්‍රී දළදා මාලිගාවද අනුරපුර සොළොස්මස්ථාන යන්හි ද විවිධ පිංකම් සිදුකෙරේ. ලක්දිව අගනුවර වූ කොළඹ හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයෙහි වාර්ෂික මහා සංස්කෘතික පෙරහැර පැවැත් වෙන්නේද නවම් පොහොය මූලික කරගෙනය. දෙස් විදෙස් බෞද්ධ ජනයාගේ සිත් බුද්ධාලම්භන ප්‍රීතිය ඇතිකරවීමට සමත් පෙරහැරක් බවත් එය මනා සංවිධානයකින් සිදුකරන බවත් ප්‍රකාශ කල හැකිය. ඉහත සදහන් කරුණු පදනම් කරගත් නවම් පොහොය බෞද්ධ වූ අපගේ ජීවිත ධර්මකරුණු වලින් පෝෂණය කරගැනීමට උත්සුක විය යුතුවේ.

ඇම්.ඩී.විජයවර්ධන

පුදබිමක අසිරිය

# ලංකාතිලක විහාරය

ගම්පොළ රාජධානියේ ඇති ඓතිහාසික පූජනීය ස්ථාන අතරින් සුවිශේෂී විහාරස්ථානයක් වශයෙන් ''ලංකා තිලක විහාරය'' හඳුන්වාදීමට පුළුවන. කොළඹ-නුවර ප්‍රධාන පාරෙන් හැරී දවුලගල මාර්ගයෙන් මඳදුරක් ගියවිට මෙම ඓතිහාසික පුදබිම හමුවේ. ගල්තලාවක් මත පිහිටා ඇති මෙම විහාරය සිව්වන බුවනෙකබාහු රජුගේ කාලයේදී සේනාධිලංකාර අගමැතිවරයාගේ පුරෝගාමිත්වයෙන් ගොඩනගන ලද බව ඉතිහාසගත තොරතුරුවල සඳහන්වේ. ලංකාවට තිලකයක් බඳු යන අර්ථයෙන් ''ලංකා තිලක විහාරය'' යන නම යොදා ඇතැයි විශ්වාසයක් ජනයා අතර පවතී.

ගඩලාදෙණි විහාරයත්,ලංකා තිලක විහාරයත් එකම දිනක විවෘත කළ බවට තොරතුරු සඳහන්වේ. ඉන්දියානු සම්භවයට අනුව මෙම විහාරයේ ඉදිකිරීම් කටයුතු සිදුකර ඇති ඉවට තොරතුරු සදහන් වෙයි. පොළොන්නරු යුගයේ ගෘහ නිර්මාණ ශිල්පය ඇසුරු කරගෙන දේශීය නිර්මාණ කලාවත්, හින්දු බලපෑමත් මිශ්‍රව මෙය ගොඩනගා ඇති බවයි. පුරාවිද්‍යාඥයින් පවසන්නේ තෙමහල් මන්දිරයක් ලෙස පෙනෙන මෙම විහාරයට අයත් බිත්ති කුහරවල දේවාල නිර්මාණය වී තිබේ. මුල් යුගයේ මහල් හතරක් පැවැති බවත් පසුව, එය මහල් තුනක් දක්වා අඩු වූ බවත් සදහන් වේ. එයට හේතුව වශයෙන් සැළකෙන්නේ කාලයාගේ ඇවෑමෙන් අභාවයට පත්වීමයි. කෝට්ටේ රාජධානියෙහි රජකළ හයවන පරාක්‍රමබාහු රජතුමා නවීන ආකාරයෙන් ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකළ බවත් ඉතිහාසගත තොරතුරැවල දැක්වේ.



විහාරයේ විහාරාංගයන් කිහිපයකින් සමන්විත වී ඇති බව නරඹන කෙනෙකුට පැහැදිලි ව පෙනේ. හේවිසි මණ්ඩපය,අන්තරාලය,ගර්භය මේ අතර ප්‍රධාන වේ. හේවිසි මණ්ඩපයට අයත්වන ''ගජසිංහ'' රූප දෙක සුවිශේෂී නිර්මාණයක් ලෙස සැළකේ. අභ්‍යන්තරයෙහි වැඩ සිටින අලංකාර බුද්ධ ප්‍රතිමාවන්ද සුවිශේෂී චිත්‍රයන්ගෙන්ද අලංකාර කර තිබේ. සමාධි ප්‍රතිමාවන්ද, සුවිශේෂී චිත්‍රයන්ගෙන්ද,අලංකාරකර තිබේ. සමාධි ප්‍රතිමාවක්ද හිටි පිළිම දෙකක්ද, විහාරමන්දිරයෙහි දක්නට ලැබේ. දර්ශනීය මකර තොරණින්ද එහි තැන්පත් කර ඇති බුද්ධ ප්‍රතිමාවෙන්ද , මෙය අලංකාරවී පවතී. මෙම විහාරය අවට පිහිටා ඇති නිර්මාණ රාශියකි.ශ්‍රීපාද සටහන, දැඩිමුණ්ඩ දේවාලයක්ද,පොකුණු,පියගැට පන්ති, පෝය සීමාගෙය යන ස්ථාන මේ



අතර වේ. ගම්පල යුගයේ ඓතිහාසික තොරතුරු දැන ගැනීම සඳහා ශිලා ලේඛණ, සන්නස් පත්‍ර උපකාර වනු ඇත. තුන්වන වික්‍රමබාහු රාජ්‍ය සමයේ ද මෙම විහාරස්ථානය දියුණු තත්වයකට පත්ව තිබුණ බවට තොරතුරු ඇතුළත් ග්‍රන්ථ ගැන සදහන් කළ හැකිය. මේවා ඓතිහාසික වශයෙන් ඉතා වැදගත් වේ. විවිධ විහාරස්ථානයන්ගෙන් සමන්විත දැකුම්කළු මෙම ඓතිහාසික පිංබිම ගම්පොළ යුගයේ පැවැති ශ්‍රී විභූතිය මැනවින් පෙන්වා දෙන ස්ථානයක් ලෙෂ සදහන් කිරීමට පුළුවන. මෙවැනි ඓතිහාසික පුදබිම් වන්දනා කිරීමටත් නැරඹීමටත් යෑමේදී පරිසරයට හානිවන කිසිවක් සිදු නොකිරීමට වගබලාගත යුතුය. වර්තමානයේ මෙන්ම අනාගතයේද ජීවත්වන ජනයාට වැඳුම් පිදුම් කිරීමටත් දැකබලා ගැනීමටත් අවස්ථාව සලසාදීම අප සැමගේ යුතුකම වන්නේය. ඓතිහාසිකත්වයට හානිවන කිසිවක් නොකිරීමටත් මෙම ස්ථානය වන්දනා කර නැරඹීමටත් පැමිණෙන සැදැහැවත් ජනතාව අධිෂ්ඨාන කරගත යුතු වන්නේය. එය අප සැමගේ වගකීම වන්නේය.

ඇම්.ඩී.විජයවර්ධන
තලවත්තේගෙදර



# බුදු සසුන එකලු කළ නවම් පොහොය

**වර්ෂයක් උදා වී එහි දෙවෙනි පොහොය වශයෙන් එළඹෙන්නේ නවම් පුර පසළොස්වක පොහොයයි. එය පෙබරවාරි මාසය තුළ අපට සිහිකළ හැකි උතුම් පුන් පොහෝ දිනයකි. නවම් පුන් පොහෝ දිනය බෞද්ධයින්ට වැදගත් වන්නේ කුමන සිදුවීම් මුල් කරගෙනද යන්න විමසා බැලීම වැදගත් වේ.**

ශාසන ඉතිහාසයේ ඉතා වැදගත් සිදුවීම් කීපයක්ම සිදුවී ඇති නවම් පුර පසළොස්වක පුන් පොහෝ දිනය ලෝක බෞද්ධ ජනයාට අනුස්මරණීය දිනයකි. එයට හේතුන් ලෙස සැලකෙන්නේ,

1. භික්ෂූන් වහන්සේලා පළමුවරට එක් රැස් කොට මහා සංඝ සම්මේලනයක් පැවැත්වීම.
2. සැරියුත් මුගලන් මහරහතන් වහන්සේලාට අග්‍ර ශ්‍රාවක තනතුරු ප්‍රදානය කිරීම.
3. භික්ෂූන් වහන්සේලාට ඕවාද ප්‍රතිමෝක්ෂය දේශනා කිරීම.
4. බුදුරජාණන් වහන්සේ මෙයින් තෙමසකට පසු පිරිනිවන් පානා බව භික්ෂූන් වහන්සේලාට දැනුම් දීම.

යන කරුණු නවම් පුර පසළොස්වක පුන් පොහෝ දිනය තුළ සිදුවී ඇත.

පළමු කාරණය පිළිබඳව අවධානය යොමු කර බැලීමේදී බුදුරජාණන් වහන්සේ අනුගමනය කළ පිරිස ප්‍රධාන වශයෙන් කොටස් 4කට බෙදා දැක්විය හැකිය.

- භික්ඛු
- භික්ඛුණී
- උපාසක
- උපාසිකා ආදි වශයෙනි.

මෙම පිරිස සිව්වනක් පිරිස හෙවත් සිවුවැදෑරුම් ශ්‍රාවක යනුවෙන් හැඳින්විය හැකිය. මෙම චතුරංගනී පිරිසේ නායකත්වය දැරුවේ ශාස්තෘන් වන අපේ බුදුරජාණන් වහන්සේය. උන්වහන්සේ පාලනය කළේ ධර්ම රාජ්‍යයයි. භික්ඛු, භික්ඛුනී, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිස මුල් වරට 1250 කට වැඩි නොවුන බව සඳහන් වේ.

බුදුරජාණන් වහන්සේ මෙම පිරිස සියල්ලම රජගහ නුවර වේළුවනාරාමයට එක්රැස් කොට මහා සංඝ සම්මේලනයක් පවත්වන ලදී. එය සිදුවූයේ නවම්පුර පසළොස්වක පොහෝ දිනය තුළයි.

බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ මෙම භික්ෂු සම්මේලන ක්‍රමය රාජ්‍ය පාලනය තුළටද ආදර්ශයක් වූවාට කිසිඳු සැකයක් නොමැත. රාජාණ්ඩු හා සමූහාණ්ඩු තුළ එම ක්‍රමය දැකගත හැකිය.

සමූහාණ්ඩුවක් වූ ලිච්ඡවි රාජ්‍යය තුළ සමඟියෙන් රැස්ව සමඟියෙන් කටයුතු කොට සමඟියෙන් විසිරයෑමේ දේශපාලනමය න්‍යාය ඉස්මතුවී පැවතුණි.

වර්තමාන පාලන තන්ත්‍ර තුළ ඒ ඒ රටවල් වල පාර්ලිමේන්තු ක්‍රමයද ඊට අනුගතව පවතී. රටේ නායකයා හා මැති ඇමතිවරුන් මසකට වතාවක් දෙවතාවක් එකම තැනකට එකතු වී රටේ ප්‍රශ්න ජනතාවගේ ප්‍රශ්න සාකච්ඡා කිරීම හා ඒ සඳහා ගතයුතු පියවර ගැනීම රටක සමාජයක අභිවෘද්ධිය පිණිස හේතු වේ. එම උතුම් පණිවිඩය පළමු වරට අපට කියා දුන්නේ අද වාගේ පොහෝ දිනක අපේ ශාස්තෘවරයාණන් වහන්සේ බව සිහිපත් කළ යුතුව ඇත.

දෙවෙනි කාරණයෙන් පැහැදිළි වන්නේ සුදුස්සාට සුදුසු තැන දීමේ පිළිවෙතයි . මංගල සූත්‍රය තුළ "පූජාච පූජනීයාං" පිදිය යුත්තන් පිදීමේ උතුම් ගුණාංගයට දෙවෙනි කාරණය තරමක් දුරට සමානය. බුදුරජාණන් වහන්සේ දකුණත් සවු වශයෙන් සැරියුත් මහරහතන් වහන්සේද වමත් සවු වශයෙන් මුගලන් මහරහතන් වහන්සේද පත් කරන ලදී.

එම අග්‍ර ශ්‍රාවක තනතුරු මුහුණ බලා හෝ වෙනත් සම්බන්ධතාවයක් මත පදනම් වූවක් නොවේ. උපරිම සුදුසුකම් අනුවත් සසර කරන ලද ප්‍රාර්ථනා බල මහිමයත් මත බුදුරජාණන් වහන්සේ එම තනතුර මෙසේ පිරිනමන ලදී. ඒ අනුව මුලින් සඳහන් කළ මහා සංඝ සංවිධානයේ ධර්ම සේනාධිපති තනතුරට සැරියුත් රහතන් වහන්සේද ධර්ම පුරෝහිත බවට මුගලන් රහතන් වහන්සේද පත්වූහ.

මෙම සුදුස්සාට සුදුසු තැන දීමේ බෞද්ධ ප්‍රතිපදාව නොහොත් බෞද්ධ සම්ප්‍රදාය අද සමාජයටද ගතයුතු ආදර්ශයකි. අද බහුතරයක් නොසුදුසුකම් මත තානාන්තර නිලතල හොබවති. මේ ක්‍රමය මත සිදු වන්නේ දක්ෂයාට, සුදුස්සාට අවශ්‍ය තැන අහිමි වීමයි.

ඒ අනුව තම හදවතට අවංකව තමාට ඇති හැකියාවන් හා සුදුසුකම් අනුව තනතුරු ලබා එතුළින් රටට සමාජයට යම් සේවය කිරීමට අධිෂ්ඨාන කර ගන්නේ නම් මෙම පොහෝ දිනයේ බුදුරජාණන් වහන්සේ දේශනා කළ එම බෞද්ධ සම්ප්‍රදාය ආරක්ෂා කළා වන්නේය.

තෙවැනි කරුණ තුළින් බුදුරජාණන් වහන්සේ ධර්ම රාජ්‍යය පවත්වාගෙන යාමට අවශ්‍ය විනය නීති මාලාවක් ඉදිරිපත් කොට ඇත. බුදු සසුනේ මුල් යුගය තුළ එය අවවාදාත්මක ස්වරූපයෙන් පැවතුණි. බුදුරජාණන් වහන්සේ එය පවත්වාගෙන ආවේ,

"සබ්බ පාපස්ස අකරණං
කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝදපනං
ඒතං බුද්ධානුසාසනං"

යනාදී වශයෙනි.

එනම් සියලු පව් නොකරන්න. කුසල් දහම් රැස් කරන්න. සිත පිරිසිදු කරගන්න. යන ඕවාද ප්‍රාතිමෝක්ෂයයි.

මෙම ක්‍රමය බුදුවී මුල් විසිවසර තුළම පවත්වාගෙන ආ නමුත් ඊට පසු එහි සංශෝධනයක් කරමින් බුදුරජාණන් වහන්සේ විනය ප්‍රාතිමෝක්ෂය දේශනා කළ සේක.

ඒ කෙසේ වෙතත් මුල් කාලයේ භික්ෂු සංස්ථාව තුළ මෙම ඕවාද ප්‍රාතිමෝක්ෂය තුළින් නිසි සංවරයක් ඇති වූ බවක් දක්නට ලැබේ. පසු කාලීන බුදු සසුනට ඇතුළත් වූ ඡබ්බග්ගිය, උදායි, සුදින්න වැනි භික්ෂූන් වහන්සේලාගේ යම් යම් වැරදි ක්‍රියාකාරකම් නිසා විනය නීති ස්ථිර වශයෙන්ම පැනවීමට සිදුවිය. රටක සමාජයක වුවද නීති පද්ධතියක් තිබිය යුතු අතර එය කඩ කරන්නන්ට එරෙහිව දඬුවම් පැනවීමද සිදුවිය යුතුය.

අද මොන තරම් නීති රීති තිබුණද එය ආරක්ෂා කිරීම පිළිබඳ ප්‍රශ්නයක් උද්ගතව ඇත. රටක විනය ආරක්ෂා වන්නේ නීති රීති අනුගමනය කිරීම තුළිනි. බුදුරජාණන් වහන්සේ පනවන නීති විනය නීති තුළින් අද දක්වාම සාසනයේ පැවැත්ම සිදුවිය. "විනයො නාම සාසනස්ස ආයු" එය බුදු සසුනේ චිර පැවැත්ම නොහොත් ආයුෂයි.

ඒ අනුව රටක ඇති නීති පද්ධතියත් ආරක්ෂා කර රටේ පැවැත්ම උදෙසා සිත, කය, වචනය යන තිදොරින්ම සංවරයක් ඇති පුද්ගලයෙකු වශයෙන් කටයුතු කළ යුතුය. එය බුදුරජාණන් වහන්සේ දේශනා කළ විනය නීති ආරක්ෂා කිරීමේ මූලික පිළිවෙතයි. තිදොරින් සංවර වූවා යනු අනුනට හා සමාජයට යහපත කැදවන්නෙකු වන්නේය. එවිට අලුතෙන් නීති ආරක්ෂා කිරීමක් අවශ්‍ය නැත. මේ උතුම් පුන් පොහෝ දිනය තුළ බුදුරජාණන් වහන්සේ උගන්වා වදාළ එම උතුම් ගුණාංගයත් ආරක්ෂා කිරීමට අපි සිතට ගනිමු.

හතර වෙනි කාරණයෙන් පැහැදිළි වන්නේ අනාගතයේ සිදුවිය යුතු දේ කලින් ප්‍රකාශ කර සිටීමකි. බුදුරජාණන් වහන්සේ පන්සාලිස් වසක් ලෝක සත්වයාට (දෙවි මිනිසුන්ට) ධර්මය දේශනා කළහ. එසේ ධර්මය දේශනා කළ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑමට මාස තුනක් තිබියදී චාපාල චෛත්‍යය අසලදී ආයු සංස්කාරය අත්හැර මෙයින් තෙමසකට පසු පිරිනිවන් පාන බව භික්ෂූන් වහන්සේලාට දේශනා කළ සේක. එයින් සැබෑ ශාස්තෘවරයෙකුගේ ලක්ෂණ පෙන්නුම් කරති.

අද සමාජය තුළ වුවද ඕනෑම පුද්ගලයෙකුට තමන්ගේ ජීවිතය පිළිබඳ ස්ථිර වශයෙන් යමක් කිව නොහැකි වුවද තමන් ලැබූ පදවි තානාන්තර වලින් සමුගැනීමේ දිනය, විශ්‍රාම යන දිනය කිව හැකිය. ඒ සඳහා කල්වේලා ඇතිවම සූදානම් වී සිටීම ඉතාම වැදගත් වේ. ජනතාවගේ වැඩි කැමැත්තක් නැතිව ආරාධනාවක් නැතිව එම තානාන්තර වල ඇලී ගැලී සිටීම නුසුදුසුය. ජනතාවගේ ප්‍රතිචාරය අනුව එම නිලතල වල සිටීම හෝ එයින් ඉවත්වීම සිදු කළ යුතුය.

ලොව උතුම්ම පදවිය ලබාගත් බුදුරජාණන් වහන්සේට වුවද වසවත්ති මාරයාගෙන් ගැලවීමට නොහැකි විය. එසේ නම් සෑම කෙනෙක්ම මරණයට පත්වන බව සිතා තම වගකීම් හා යුතුකම් කොටස ඉෂ්ඨ කරමින් මෙලොව පරලොව ජයග්‍රහණය කිරීමට මේ උතුම් පුන් පොහෝ දිනය තුළ අදිටන් කර ගනිමු.

අවුලේගම රණවනයාගම/බමුණුගෙදර ශ්‍රී සඳහම් සෙවණ
බෞද්ධ මධ්‍යස්ථානාධිපති කොබෙයිගනේ පුබ්බිලිය
ශ්‍රී සාරානන්ද පිරිවෙනේ නියෝජ්‍ය පරිවේනාධිපති
ගලගෙදර රතනවංස හිමි

# අකුසල් සිත් ජයගැනීම



පූජ්‍ය මැල්සිරිපුර ධම්මකුසල හිමි

පළමු, දෙවන, තුන්වන, හතරවන ආදී ධ්‍යාන වලින් යුත් එනම් අධි චිත්තයෙන් යුත් පුද්ගලයන්ට රාග, දෝස, මෝහ අරමුණක් තම සිතට පැමිණෙන විට ඒවා ඉවත් කරගෙන සිත පිරිසිදු කරගන්නා ආකාරය, මජ්ඣිම නිකායේ එන විතක්ක සණ්ඨාන සූත්‍රය (බු.ජ.ම.නි.1 - පි.අ.300) තුළින් භාග්‍යවතුන් වහන්සේ දේශනා කර ඇත.

යෝගාවචර ජීවිතයන් ගතකරන බොහෝ දෙනාට භාවනාවේදී එන ප්‍රධාන ගැටලුවක් වන්නේ තම සිතට විවිධ අකුසල විතක්ක පැමිණ තමන්ගේ චිත්ත ඒකාග්‍රතාවය හෙවත් සමාධිය කැඩී බිඳී යාමයි. අධි චිත්තයෙන් හෙවත් අෂ්ට සමාපත්තීන්ගෙන් යුත් අයට පමණක් මෙම සූත්‍රය දේශනා කර ඇත්තේ සාමාන්‍ය ජීවිතයේ සිටින අය අකුසලයන් බව නොදන්නා නිසා අකුසල සිදුවන බවයි.

අකුසලයන් අකුසලයන් බව දැනගැනීමට සිතේ එකඟතාවයක් හෙවත් සමාධියක් අවශ්‍යය. මඩවලක සිටින අයෙකුට මඩ ගෑවුනාට නොදැනෙන්නා සේ සාමාන්‍ය සිතක අකුසලයන් ම ඇති බැවින් ඒවා තේරුම් ගැනීමට නොහැක. කෙසේ වෙතත් අකුසලයන්ගෙන් සිත මුදවාගෙන සිත පිරිසිදු කරගැනිමට ක්‍රම පහක් මෙහි දේශනා කර ඇත.

**අඤ්ඤ නිමිත්ත පබ්බං - අකුසල් අරමුණට එරෙහිව වෙනත් කුසල් අරමුණක සිත පිහිටවීම.**

යම් අවස්ථාවක දී රාග, දෝස හෝ මෝහ සිතක් උපන් විට ඊට එරෙහිව වෙනත් කුසල් අරමුණක් මෙනෙහි කිරීම කළ යුතුය. හරියට ලෑල්ලකට ගසා ඇති විශාල ඇණයකට හාත්පසින්ම ඊට වඩා කුඩා ඇණයකින් පහර දී පසුව අතින් ගලවා දමන්නාක් සේ විශාල වූ අකුසල් අරමුණ කුඩා කුසල් අරමුණක් මෙනෙහි කර සිතෙන් ඉවත් කළ යුතුය. එවිට අකුසල් අරමුණ ඉවත් වී තමන්ගේ සිත ඇතුළත පිහිටයි. මනාව තැන්පත් වේ. නැවත එකඟ වේ. නැවත සමාධිගත වේ.

**ආදීනව පසබං - අකුසල් අරමුණේ ආදීනව මෙනෙහි කිරීම.**

ඒ ඒ අකුසල විතක්කයන්ගේ දෝෂය පිරික්සමින් එනම් එහි ආදීනව දකිමින් එම අකුසලය ඉවත් කළ යුතුය. මෙම අරමුණු අකුසල් අරමුණුය, සාවද්‍යය, දුක් විපාක ඇත, යනාදී වශයෙන් සිහිපත් කරමින් ඉවත් කළ යුතුය.

කණ්නාඩිය ලඟට ගොස් සැරසෙන තරුණයෙකුගේ හෝ තරුණියෙකුගේ කර මත බලුකුණක් හෝ සර්ප කුණක් හෝ මිනිස් කුණක් දැමුවොත් එය පිළිකුල් කර ඉවත් කරන්නේ යම්සේද, ඒ ආකාරයෙන් අකුසල් අරමුණ ලැජ්ජා සහිතව පිළිකුල් සහිතව ඉවත් කළ යුතුය.

යම් රාග (ලෝභ), ද්වේෂ, මෝහ අරමුණක් සිතේ ඇති වූ විට මෙය නැවත නැවත මෙනෙහි කිරීමෙන් එය වචන බවට පෙරලෙන බවත් පසුව එම අරමුණු කායිකව සිදුකරමින් බොහෝ අකුසල් රැස් කරගන්නා බව නුවණින් මෙනෙහි කළ යුතුය.

මෙලොව වශයෙන් අලාභ, නින්දා, කායික දුක්, මානසික පීඩා, රජයේ වධ බන්ධන වලට ලක්වීමත් ආධ්‍යාත්මික වශයෙන් තමන්ගේ සීලය පිරිහීම, සමාධිය පිරිහීම, ප්‍රඥාව පිරිහීම තුළින් නිර්වාණය දුරස්වීම යනාදියත්, පරලොව වශයෙන් සතර අපාය ආදී දුක් වලට පැමිණෙන බවත්, නුවණින් මෙනෙහි කරමින් අකුසලය සිතෙන් ඉවත් කළ යුතුය. එවිට අකුසල් අරමුණ ඉවත් වී තමන්ගේ සිත ඇතුළත පිහිටයි. මනාව තැන්පත් වේ. නැවත එකඟ වේ. නැවත සමාධිගත වේ.

**අසති පසබං - අකුසල් අරමුණ මෙනෙහි නොකිරීම.**

අකුසල අරමුණක් සිතට පැමිණි අවස්ථාවක දී එය මෙනෙහි නොකිරීමෙන් එම අරමුණ ඉවත් කළ යුතුය. රූප දැකීමට අකැමැති ඇස් ඇති පුරුෂයෙක් රූපයක් දුටුවිට ඇස් පියා ගන්නා සේ හෝ වෙනත් යමක් දෙස බලන්නා සේ සිතට පැමිණි රාග, ද්වේෂ, මෝහ , අරමුණු සිහි නොකිරීමෙන් ඉවත් තළ යුතුය.

තමන්ගේ සිතට අකුසල අරමුණක් පැමිණි විට ඒ සමඟම ඊට එරෙහිව "මෙය සිතන්න එපා" යනාදී විධානය නැවත නැවත සිතට ඒත්තු ගැන්වීමෙන් එම අකුසල් අරමුණ මෙනෙහි නොකර ඉවත් කළ හැකිය. මෙසේ දිගින් දිගටම පුහුණු කිරීමෙන් එම අකුසල් අරමුණ ඉවත් වී තමන්ගේ සිත ඇතුළත පිහිටයි. මනාව තැන්පත් වේ. නැවත එකඟ වේ. නැවත සමාධිගත වේ.

**විතක්ක මූලභේද පසබං - අකුසලයේ මූලය සිහි කිරීම**

පැමිණි රාග, දෝස, මෝහ විතක්කයේ මූලය සොයා එම මූල ඉවත් කිරිමෙන් අකුසලය ඉවත් කළ යුතුය. යම් අයෙක් වේගයෙන් දුවන විට ඔහු "ඇයි මේ දුවන්නේ ? මෙතන දුවන්න තරම් කරුණක් නැනේ" යන බව අවබෝධ වූ විට ඔහු දුවන ක්‍රියාව නවතා ඇවිදින්නට පටන්ගනී.

එසේ ඇවිදින විටත් "ඇයි මේ ඇවිදින්නේ ? මෙතන ඇවිදින්න තරම් කරුණක් නැනේ" මේ බව ඔහුට අවබෝධ වූ විට ඔහු සිටින්නට සිතයි. සිටගෙන සිටින විට, එසේ ඉන්න අවශ්‍ය නැති බව තේරුම් ගත්විට ඉඳගන්න කටයුතු කරයි. ඔහු ඉඳගෙන සිටින විට "ඇයි මේ ඉඳගෙන ඉන්නේ ? මෙතන ඉඳගන්න කාරණයක් නැනේ" යන බව අවබෝධ වූ විට ඔහු ඇලවෙයි. මේ ආකාරයෙන් අකුසල මූලය හොඳින් පිරික්සමින් කටයුතු කරයි නම්, එම අකුසලයේ බලය ක්‍රම ක්‍රමයෙන් අඩුවී අකුසලය ඉවත් වේ.

තමන් වාහනයක් මිලදී ගැනීමට ලෝභ සහගත ලෙස වංචාවෙන්, කපටිකමින් මුදල් ඉපයීම් කිරීම සම්බන්ධයෙන් අකුසල් සිත් පරම්පරාවක් පැමිණුන විට එම විතක්කය පැමිණෙනුයේ වෙනත් අය පාවිච්චි කරන වාහන දෙස බලා තමන්ටත් මෙවැනි එකක් තිබුණා නම් හොඳයි යන මූලික අරමුණ පැමිණුන නිසා බව අවබෝධ කරගෙන ඇත්තටම අවශ්‍යතාවය කුමක්ද? යන්න ක්‍රමයෙන් විශ්ලේෂණය කර එම අකුසල් අරමුණ ඉවත් කළ හැකිය.

ගසක අතු ඉවත් කර, කඳ ඉවත් කර, මුදුන් මුල ඇතුලුව සියලුම මුල් ඉවත් කර එම ගස නැවත හට නොගන්නට කටයුතු කරන්නේ යම් ආකාරයකට ද, ඒ ලෙසම අකුසල් විතක්කය ඉවත් කළ යුතු වේ. එසේ කිරිමෙන් තමන්ගේ සිත ඇතුළත පිහිටයි. මනාව තැන්පත් වේ. නැවත එකඟ වේ. නැවත සමාධිගත වේ.

**අභිනිග්ගණ්හත පසබං - ප්‍රභල කුසල් අරමුණකින් අකුසල් අරමුණ තලා පෙලා දැමීම**

යම් ලෝභ, දෝස, මෝහ අකුසල් අරමුණක් සිතට පැමිණි විට එය දැඩි කුසල් අරමුණක් ගෙන තලා පෙලා දමා එම අකුසල් අරමුණ පහ කළ යුතුය. ශක්තිමත් පුරුෂයෙක් තම ශක්තිය යොදාගෙන හීන පුරුෂයෙක් මෙල්ල කරන්නේ යම් සේද, ඒ ආකාරයෙන් අකුසල් අරමුණ තලා පෙලා ඉවත් කළ යුතුය.

රාග සිත් පැමිණි විට අසුභය ද, ද්වේශය පැමිණි විට මෛත්‍රිය ද, ථීන මිද්ධය පැමිණි විට ආලෝකය සහ වීර්යය ද, යනාදී වශයෙන් භාවනා කිරීමෙන් අකුසල් සිත් ඉවත් කළ හැකිය. තවද සතිපට්ඨානය තුළ ඇති මෙවැනි විදර්ශනා භාවනා කමටහන් යොදාගනිමින් අකුසල් සිත් තලා පෙලා දැමූ බවත් ප්‍රකාශ කළ හැකිය. එවිට අකුසල් අරමුණ ඉවත් වී තමන්ගේ සිත ඇතුළත පිහිටයි. මනාව තැන්පත් වේ. නැවත එකඟ වේ. නැවත සමාධිගත වේ. අධි චිත්ත යෙන් යුත් අයෙක් මෙම ආකාර පහෙන් අකුසලයෙන් සිත පිරිසිදු කරගෙන එය වශීභාවයට පත් කරගන්නේ නම් ඔහුට කැමති නම් එම අරමුණ සිතීමටත් අකමැති නම් අරමුණ නොසිතා සිටීමටත් හැකියාව ඇතිවේ. එසේ කරන විට ඔහුගේ තණ්හාව පහ වේ. සංයෝජන ඉවත් වේ.

එබැවින් මානය දුරුකොට සංසාර දුක කෙලවර කරගෙන නිවනින් සැනසේ. එසේ අකුසලයන් ඉවත් කරමින් සංසාර දුක නැති කිරීමට සියල්ලන්ටම ශක්තිය ලැබේවා.

අචින්ති තම්පිහවතිචින්ති තම්පි විනස්සති-නොසිතු දේ සිදුවෙයි සිතු දේ නොසිදු වෙයි.




# බණ අසන වෙනස




රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලියත් 2011 දී රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනි සේවයත් ආරම්භ කිරීම මෙරට ධර්ම සන්නිවේදනයේ සන්ධිස්ථානයක් විය. දවසට පැය 24ක ගුවන් විදුලි සේවයත් පැය 17ක ටෙලිවිෂන සේවයත් මෙරට පමණක් නොව විදේශයන්හිද පවත්වා මහඟු සේවයක් දහම සම්බන්ධයෙන් සළසයි.

සියලු ශාස්තෲන් වහන්සේලාට අනුදැන වදාල දහම ජනගත කිරීම් වස් භාෂණය සන්නිවේදනය ප්‍රයෝජනයට ගත්හ. සැදැහැවත්හු ධර්ම ශ්‍රවණයට ඇලුම් කළහ. පස්වග මහණුන් වහන්සේලා ප්‍රධාන කොට ගෞතම බුදුන් වහන්සේ වෙතින් සසුන් ගතව මහණදම් වඩා රහත්බවට පත්වූ යසකුල, භද්දවග්ගිය, තුන්බෑ ජටිල, සුනීත, සෝපාක, කෝලිත, උපතිස්ස භික්ෂූන් වහන්සේලා දහම ජනතාව අතරට ගෙන යෑමට ගම් දනව් පුරා වැඩම කළහ.

දඹදිව ස්ථාපිත වූ බුදුදහම ඉන් පිටත ව්‍යාප්ත කිරීම සඳහා රාජ්‍ය දායකත්වය ලැබිණි. මහින්ද මහ රහතන් වහන්සේ, සංඝමිත්තා තෙරණින් වහන්සේගේ ලංකාගමනය සිදු වන්නේද එවන් පසුබිමකය. භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා, පිරිස බුදුදහම ජනගත කිරීමේ කොටස් කාරයෝ වූහ.

ගමේ පන්සල බුදුදහම ජනගත කිරීමේ කේන්ද්‍රස්ථානය බවට පත්විය. දහම් දැනුම ලබා ගැනීමට පමණක් නොව ගමේ හැම ඕනෑ එපාකමකටම පන්සලත් එහි වැඩ වාසය කරන භික්ෂූන් වහන්සේ සහසම්බන්ධවීමේ ප්‍රවණතාවක් ස්ථාපිත විය. පොහෝ දින පෙහෙවස් සමාදන්වීමට පන්සලට සතර පොහොයටම උපාසක උපාසිකාවෝ රැස්වූහ. මේ වන විට එය බොහෝ විට මහපෝය නැතහොත් පුරපසළොස්වක පෝයට සීමා වී තිබේ.

මේ නවම් මාසයයි. නවම් පොහොය බොදුනුවන්ගේ ශාසන ඉතිහාසයේ ප්‍රථම සංඝ සම්මේලනය පැවැත්වූ දවස සේ ප්‍රකටය. සැරියුත් මුගලන් මහරහතන් වහන්සේ අගසව් ලෙස පිදුම් ලබන්නේ ද මේ දවසේමය. සියලුම බුදුන් වහන්සේලා ගිය මග යමින් ආයු සංස්කාරය හැරීම ද මේ පොහෝ දින සිදුවිය. බුද්ධත්වයෙන් විසි වසරක් ගෙවුණු කල්හි අවවාද ප්‍රාතිමෝක්ෂ දේශනා කරනු ලැබ ඇත්තේද නවම් පොහෝ දිනකමය.

බුදුරජාණන් වහන්සේ මෙන්ම උන්වහන්සේ ගේ මගෙහිම යමින් මහා සංඝයා වහන්සේලාත් දෙසුමෙන් දහම ප්‍රචාරය කළහ. කල්යත්ම දහම තල්පත්හි ලියවිණි. ග්‍රන්ථාරූඪ කෙරිණි. එතෙක් සවන් දුන් බණ කියවා තේරුම් ගැනීමටත් සෙසු අයගේ පහන් සංවේගය උදෙසා කියවීමටත් හුරුවිය.

ගුගුල්යෙල්මෝ මාකෝනි හා විද්‍යාඥයින් එක්ව හඳුන්වා දුන් රේඩියෝව හා ජෝන් ලොගී බෙයාර්ඩ්ගේ ටෙලිවිෂණයත් සමාජ ජාල වෙබ් අඩවි ද මේ වන විට ධර්ම සන්නිවේදනයයේ ප්‍රාමාණික කොටස්කරුවෝ වී සිටී. ඒ අනුව නිවසේ සිට බණ අහන බලන පරිසරයක් නිර්මාණය වී තිබේ.

1925 දෙසැම්බර් 16 වෙනිදා නිත්‍ය මට්ටමෙන් ආරම්භ වූ ගුවන්විදුලි සේවය 1928 අප්‍රේල් මාසයේදී මුල්වරට බෞද්ධ ධර්ම දේශනාවක් විසුරුවා හැරියේය. දේශකයාණන් වහන්සේ පූජ්‍ය පැළෑනේ වජිරඥාණ හිමියෝය. එය බෞද්ධ කථාවක් ලෙස හඳුන්වා දී තිබේ.

ගුවන්විදුලියෙන් බණ කීම ගැන මුල්කාලයේ විවිධ චෝදනා එල්ල විය. ගමත් පන්සලත් අතර තිබිය යුතු සම්බන්ධතාව හීන කළ හැකි බවත් දායක දායිකාවන් ගෙදරදීම බණ දහම් අහන පරිසරයක් නිර්මාණය වෙතැයි එම චෝදනාය. එහෙත් සිදුවූයේ ගුවන් විදුලියට තව තවත් අලුත් වැඩසටහන් එක් වීමය. බෞද්ධ වැඩසටහන් උපදේශන සභාවක් 1954 දී පිහිටවනු ලැබීය. වජිරාරාමවාසී උපාලි හිමි වූහ. අඹන්වැල්ලේ ශ්‍රී සිද්ධාර්ථ හිමි, ඉඳුරුවේ උත්තරානන්ද හිමි, ඉඳුරුවේ පඤ්ඤාතිස්ස හිමි, එච්. ජිනදාස මහතා සහ වී. එෆ්. ගුණරත්න මහතා මුල් සභාවේ සාමාජිකයෝ වූහ. එච්. ජේ. පෙරේරා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වෙනම අංශයක් ආගමික ලෙස නම් කළේය.

එහි ප්‍රථම සංවිධායකයා වූයේ විජිතනන්ද මැණික්දිවෙල මහතාය. බෝසත් ළමා ළපටියෝ, පන්සිල් හා සෙත් පිරිත්, ධම්ම චින්තා, දවසේ සිතුවිලි, දම් සභා මණ්ඩපය, බෞද්ධ කතා, පිරිත් දේශනා හා පොහෝ දින විශේෂ වැඩසටහන් ද අලුතෙන් එකතු විය. මැදිරි වැඩසටහන් අතරට බෞද්ධ නාට්‍ය, ජාතක දේශනා ද සජීවී වූ බාහිර වැඩසටහන් වඩාත් ජනප්‍රිය විය.

පෞද්ගලික අංශ ගුවන් විදුලි හා රූපවාහිනී සේවා කෙරෙහි උනන්දු වන්නේ නවසියවස ආරම්භයේදීය. ඒ අනුව බුදු දහම සඳහාම වෙන්වූ මාධ්‍ය ආයතනයක් පිහිටුවීමට පුරෝගාමී වන්නේ රංගිරි දඹුල්ල විහාරස්ථානයයි. පූජ්‍ය ඉනාමළුවේ ශ්‍රී සුමංගලාභිධාන මහානායක හිමිපාණන් වහන්සේ එහි නිර්මාතෘවරයාණෝ වෙති.

ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි සේවය ලෙස 2007 දී

**ගුවන් විදුලියෙන් බණ කීම ගැන මුල්කාලයේ විවිධ චෝදනා එල්ල විය. ගමත් පන්සලත් අතර සම්බන්ධතාව හීන කළ හැකි බවත් දායක දායිකාවන් ගෙදරදීම බණ දහම් අහන පරිසරයක් නිර්මාණය වෙතැයි ඒ චෝදනාය. එහෙත් සිදුවූයේ ගුවන් විදුලියට තව තවත් අලුත් වැඩසටහන් එක් වීමය. බෞද්ධ වැඩසටහන් උපදේශන සභාවක් 1954 දී පිහිටවනු ලැබීය.**

ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී
පියදාස රත්නසිංහ



පියල් පරාක්‍රම
විධායක අධ්‍යක්‍ෂක, පරිසර හා සොබා දහම අධ්‍යයන මධ්‍යස්ථානය

# දේශගුණ වෙනස් වීම සඳහා ගෝලීය සංවර්ධන රටාවේ බලපෑම

අද වෙමින් පවතින් දේශගුණ වෙනස් වීම ස්වභාවික ක්‍රියාවක් නොව, පැහැදිලිවම මිනිසාගේ ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලකි. මෙම දේශගුණ වෙනස් වීමට මූලික හේතුව මහ පොළොවේ උණුසුම ඉහළ යාමයි. ඊට ප්‍රධානම හේතුව ලෙස සැලකෙන්නේ වායු ගෝලයට පිටවන කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණය ඉහළ යාමයි. එයට හේතුව පොසිල ඉන්ධන දහනය වර්ධන වීම සහ එම වායුව උරාගෙන වායු ගෝලයේ සමතුලිතතාව පවත්වා ගෙන ගිය වනාන්තර ද ඒ හා සමාන සීඝ්‍රතාවයකින් විනාශ කිරීමයි. පොසිල දහනය ඉහළ යාම සහ වැස්ම පහළ යාම ලෝක සංවර්ධන විග්‍රහයේදී පොදුවේ හඳුන්වන්නේ සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙසයි. ඊට හේතුව මේ හානිකර ක්‍රියා දෙකේම වර්ධන සමඟ ලෝක ආර්ථික වර්ධනයේ මිනුම් දණ්ඩ වන දල ජාතික නිෂ්පාදනයේ අගය ද බටහිර ලෝකයේ ජීවන මට්ටමද ඒ හා සමාන වේගකින් වර්ධනය වීමයි. පොසිල ඉන්ධන දහනයේ වර්ධනය බටහිර ලෝකයේ සංවර්ධන ක්‍රියාදාමය වූ කාර්මික විප්ලවය වර්ධනය සමඟ සිදු විය. එනම් කාර්මික විප්ලවයේ පදනම වූයේ ගල් අගුරු සහ තෙල් දහනය වර්ධනය වීමයි.

අපේ ආසියාතික රටවල සංවර්ධනයේ පදනම වූයේ ගොවිතැනයි. ගොවිතැන ස්වාභාවික සම්පත් මත පවත්වා ගෙන ගිය නිසා එය කිසි විටකත් එම සම්පත් විනාශකාරී ලෙස යොදා ගැනීම හෝ සූරා කෑම සිදු නොකළේය. එය වසර දහස් ගණනක් පවත්වා ගත් සංවර්ධනයක් විය. එය ලොව විනාශයට පත් කළ සංවර්ධන ක්‍රියාදාමයක් නොවුණි. ගොවිතැන හැම විටම පරිසරටය හිතකාමී ලෙසම සිදුවිය. අනෙක් අතින් වන විනාශයට හේතු වූයේ නිවර්තන කලාපයට අයත් රටවල සංවර්ධනය සඳහා කළ බව කියන වැවිලි වගාවන්, ගව පට්ටි, දැව සඳහා වනාන්තර එළි කිරීම ආදි ක්‍රියාවන්ය. පොදුවේ පැවසුවොත් අද මහ පොළොවේ උණුසුම ඉහළ යාමට සහ දේශගුණ වෙනස්වීමට ප්‍රධාන හේතුව වන්නේ බටහිර රටවල ආර්ථික සංවර්ධනය වෙනුවෙන් සිදු කළ ක්‍රියාදාමයයි. මෙය බටහිර රටවල ආර්ථික සංවර්ධනය සඳහා වූ ක්‍රියාදාමය ලෙස හඳුන්වන්නේ මේ ක්‍රියාදාමය පවත්වා ගෙන ගිය යටත්විජිත පාලනය යටතේ අපිට සිදු වූයේ ඊට පෙර පැවති සංවර්ධන තත්ත්වයේ සිට ඌන සංවර්ධිත රටවල් බවට පත් වීම නිසාය.

**වස්කෝදගාමා, ක්‍රිස්ටෝපර් කොලම්බස්, ජේම්ස් කුක් වැනි මුහුදු කොල්ලකරුවන් පෙරදිග රටවල් සොයා පැමිණියේ අපේ රටවල පැවති සම්පත් කොල්ලකෑම සඳහා බව අපේ අධ්‍යාපනය අපට තවමත් උගන්වන්නේ නැත. කෙසේ වෙතත් වස්කෝද ගාමා ඉන්දියාවට පැමිණෙන විට එරට හැඳින්වූයේ 'රත්තරන් කුරුල්ලා' ලෙසයි. පෘතුගීසින් පැමිණෙන විට ලංකාව හැඳින්වූයේ 'පෙරදිග මුතු ඇටය' ලෙසයි. එසේම ලංකාව එවකට හැඳින්වූයේ 'පෙරදිග ධාන්‍යාගාරය' ලෙසටයි. ඊනිසාම මෙම බටහිර මංපහරන්නන් පැමිණෙන විට ලොව සංවර්ධිත ජාතීන් අතරට ලංකාවේ අපිද අයත් වූයෙමු. අවසානයේ යටත් විජිත පාලන සමය නාමිකව ඉවත් වන විට අපි ලොව ඌන සංවර්ධිත රටවල් අතරට එක් වී සිටියෙමු. අපේ සම්පත් කොල්ල කෑ බටහිර රටවල් අද ලොව සංවර්ධිත රටවල් බවට පත්ව ඇත.**

බටහිර රටවලට තම සංවර්ධන මාවත ලෙස ගොවිතැන තෝරා ගැනීමට නොහැකිය. ඊට හේතුව එම රටවල් වසරේ මාස කීපයකම් හිම පතනයට ලක් වන නිසා වසර පුරා ආර්ථික නිෂ්පාදනයක් පවත්වා ගැනීමට නොහැකි වීමයි. ඒ නිසා වසර පුරාම නිෂ්පාදනය පවත්වා ගත හැකි ආර්ථික ක්‍රියාදාමය වන්නේ භාණ්ඩ නිෂ්පාදනය කිරීමයි. එම භාණ්ඩ අලෙවිය සඳහා එතෙක් පැවති පරිසර හිතකාමී අල්පෙච්ච ජීවන රට වෙනුවට භාණ්ඩ ප්‍රමාණය මත ජීවිතයේ උසස් බව දකින මානසිකත්වයක් අපිට ඇති කිරීමයි.

අපට ඇතුල් කළ එම මානසිකත්වයේ ප්‍රතිඵලය වූයේ බටහිර ආර්ථිකයේ වර්ධනයයි. වර්ධනය වන ආර්ථිකය සමඟ බටහිර ජනතාවගේ ජීවිත නිමක් නැති සුබෝපභෝගීත්වයක් කරා රැගෙන යාම සිදුවිය. ඒ නිසා බටහිර ආර්ථික වර්ධනය ලෙස හැඳින්වූයේ,

කාර්මික නිෂ්පාදන සමඟ ඉහළ යන ආර්ථික වර්ධනය,

එම වර්ධනයේ මිනුම් වන දල ජාතික නිෂ්පාදන දර්ශකය,

එම ආර්ථික වර්ධනය සමඟ පවත්වා ගෙන ගිය භාණ්ඩ භාවිතාවේ දර්ශකය වූ සුබෝපභෝගී ජීවන රටාව එම ආර්ථික ආකෘතිය හිස් මුදුනෙන් පිළිගත් අපේ රටවල් ද බටහිර ආකෘතියේ සංවර්ධනයක් කරා යාම වෙනුවෙන් එම මාවත දිගේම ගමන් කිරීම ආරම්භ කළහ. එහි ප්‍රතිඵලය වූයේ

අපේ රටවල් ඌන සංවර්ධිත රටවල් බවට පත්වීම,

අපේ ණය බර වර්ධනය වීම,

වනාන්තර ඇතුළුව සමස්ථ පරිසරය විනාශ වීම,

ගෝලීය උණුසුම වර්ධනය වීම සහ දේශගුණය වෙනස් වීම සහ අවසානයේ මහ පොළොවමත ජීවීන්ගේ පැවැත්මට අහිතකර තත්ත්වයක් බිහිවීමයි.

මේ සංවර්ධන ආකෘතියට අනුව බටහිර රටවල් පෙන්වා දුන් හරිත විප්ලවය පිළිගනිමින් අපි අපේ ගොවිතැන ද යාන්ත්‍රිකරණය කළෙමු. එහි සංකේතය වූයේ මී හරකා මස් කර ට්‍රැක්ටරය වැළඳ ගැනීමයි. ඒ අනුව යමින් අපි පොසිල ඉන්ධන දහන නොමැතිව වසර දහස් ගණනක් කළ ගොවිතැන අත්හැර නවීන ගොවි තාක්ෂණය හරහා මහ පොළොවේ උණුසුම වර්ධනය කිරීමේ කාර්යයට දායක වීම ඇරඹුවෙමු. එහි උපරිම ආර්ථික ලාභය ලැබුණේ ට්‍රැක්ටරය ඇතුළු කෘෂිකාර්මික යන්ත්‍ර නිපද වූ බටහිර සමාගම් වලටය.

අවසන් ප්‍රතිඵලය ලෙස අපි ඌන සංවර්ධිත වෙද්දී බටහිර ලෝකය වැඩි වැඩියෙන් ආර්ථිකව සංවර්ධනය විය. මෙම සංවර්ධන තත්ත්වය මාරු වීම පිළිබඳව ප්‍රකට ඇමරිකානු ආර්ථික විශ්ලේෂකයෙකු වන පෝල් බැරල් විසින් පැහැදිලි කිරීමක් සිදු කර ඇත. ඔහුට අනුව 1830 වන විට ලෝකයේ සමස්ත නිෂ්පාදනයෙන් 60%ක්ම නිපදවනු ලැබුවෙ අද ඌන සංවර්ධිත රටවල් බවට පත්ව සිටින අපේ රටවල්ය. එහි පදනම වූයේ කෘෂි නිෂ්පාදනයයි. කාර්මික විප්ලවයේ කර්මාන්ත ඉදිරියට එද්දී 1860 වන විට අපේ රටවල් නිෂ්පාදන ප්‍රමාණය ලෝක නිෂ්පාදනයෙන් 0.6% දක්වා පහළ ගියේය. අවසානයේ දී බටහිර කාර්මික ආර්ථිකය විසින් අපේ කෘෂි ආර්ථික ගිල ගනු ලැබීය. එහි අනෙක් අන්තය වූයේ මහ පොළොවේ උණුසුම ඉහළ යාම සහ අපේ පැවැත්ම තීරණාත්මක තත්ත්වයකට පත් කරමින් සිටින දේශගුණ වෙනස් වීමයි.

අද අපට දෙන ජාත්‍යන්තර උපදෙස් වන්නේ ගොවිතැන් අත්හැර කාර්මික රටක් ලෙස සංවර්ධනය වන ලෙසය. ඒ සඳහා අවශ්‍ය ජල විදුලිය ප්‍රමාණවත් නොවන්නේ නම්, බටහිර රටවලින් ඉවත් කරන ගල් අගුරු බලාගාර ගෙනවිත් සවිකර විදුලිය නිපදවීමට උපදෙස් ලැබී ඇත. අපි මේ මොහොතේ ද ලෝකයට සිදු වෙමින් පවතින අනතුරු නොදකින නොඇසෙන අන්ධ බීරන් මෙන් ඒ උපදෙස් ක්‍රියාත්මක කරමින් කාබන් ඩයොක්සයිඩ් පිට කිරීමේ කාර්යයට වැඩි වැඩියෙන් දායක වීමට සූදානම් වෙමින් සිටිමු. ඒ ගොවිතැන අත්හැර කාර්මීකරණය වෙමින් සහ පෞද්ගලික ප්‍රවාහනයේ වර්ධනයට යටිතල පහසුකම් ලබා දෙමින්ය.

මේ අනුව බටහිර ආර්ථික සහ දේශපාලන අවශ්‍යතාවය වෙනුවෙන් කරන මග පෙන්වීම මත අපි ගමන් කරමින් සිටින්නේ සංවර්ධන දිශාවට නොව මහ පොළොවේ අවසානය දෙසට බව බුද්ධිමත්ව ලෝකය තේරුම් ගෙන ඇත. එනම් පාර වැරදී ඇති බව තේරුම් ගෙන ඇත. දැන් ආපසු හැරීමට හෝ නිවැරදි මාර්ගයට එළඹීමට කාලය පැමිණ ඇත. ප්‍රශ්නය වන්නේ එය කළ යුතු වන්නේ කෙසේද? යන්නයි. ඒ සඳහා මුලින්ම අපි බටහිර සංවර්ධනය නැමැති මිත්‍යාවට රැවටුනු බව තේරුම් ගත යුතුය. ඩේවිඩ් කොරිල්ටන් පෙන්වා දුන් ලෙස සංවර්ධනය යනු මුදල නොවන බව තේරුම් ගත යුතුය. එනම් සොබාදහමේ ප්‍රාග්ධනය මූලය ප්‍රාග්ධනයට වඩා ස්ථාවර බවයි. සංවර්ධනය යනු දල ජාතික නිෂ්පාදිතයේ වර්ධනය නොවන බව තේරුම් ගත යුතුය. අවසාන වශයෙන් දේශගුණ වෙනස් වීම යනු බටහිර වැරදි සංවර්ධන ක්‍රියාදාමයේ සහ සංවර්ධනය මැනීමේ වැරදි දර්ශක වල ප්‍රතිඵලයක් බව තේරුම් ගත යුතුය. ඒ සඳහා නිවැරදි සංවර්ධන මාවතකට පිවිසීමට අවශ්‍ය සංකල්පීයමය වෙනස සහ එම ගමනේ නිවැරදි බව මැනීමේ සැබෑ දර්ශක මොනවාද? යන්න සොයා ගත යුතුය.

ඒ සඳහා අද බටහිර විද්වත් ප්‍රජාව විසින්ම මිනිසාට පමණක් නොව ලෝකයටම සැබෑ ධරණීය සංවර්ධනයක් කරා පිවිසීමට විකල්ප කිපයක් ඉදිරිපත් කර ඇත. ධරණීය සංවර්ධනය හෙවත් සංවර්ධනයේ සීමාව හඳුනාගෙන ක්‍රියාත්මක වීම එකකි. තවත් එකක් වන්නේ දල ජාතික නිෂ්පාදන මිනුම අත්හැර ඒ වෙනුවට පරිසරයට වන බලපෑම මත ක්‍රියාකිරීමේ සංකල්පයයි. එය සොබාදහමේ පාද සටහන ලෙස හැදින් වෙයි.

ඊටත් වඩා හොඳ සංවර්ධන සංකල්ප වසර දහස් ගණනක් පුරා සංවර්ධිත රටවල් ලෙස පැවති අපට බටහිර ලෝකයට ලබා දීමට හැකියාව ඇත. භාණ්ඩ මත පදනම් වූ සීමාවක් නැති සුබෝපභෝගී ජීවන රටාව වෙනුවට පරිසරය සමඟ බැඳුණු අල්පේච්ඡ ජීවන රටාව එක් සංකල්පයකි. භාණ්ඩ මත සමාජ තත්ත්වය මැනීම සහ දල ජාතික නිෂ්පාදනය ආර්ථිකයේ මිනුම ලෙස යොදා ගැනීමට වෙනුවට නිරෝගි බව පරම ලාභය බවත් සතුට පරම ධනය ලෙසත් සැලකීම තවත් එකකි.

එය කාබන්ඩයොක්සයිඩ් වායුගෝලයට මුදා හැරීම අඩු කරනු ඇත. මහ පොළොවේ උණුසුම සිසිල් කරනු ඇත. දේශ ගුණය වෙනස්වීම පාලන කරනු ඇත. මහපොළොව මත හැම ජීවියාගේම ජීවිත තවත් වසර දහස් ගණනකට වඩාත්ම සුරක්ෂිත ස්ථානය බවට පත්ව කරනු ඇත. සංවර්ධනය යනු එය දැයි සිතා බැලීමට අපට හැකියාව ඇත. මෙම යථාර්තය අමතක කර මහ පොළොවේ දේශගුණ වෙනස පාලනය කිරීමට කරන උත්සාහයන් සහ සමුළු සියල්ලම අරගලයන්ගේ පිරි එකඟතාවයන් නොමැති බලාපොරොත්තු කඩ වීම් ලෙස අවසන් වීම ගැන පුදුම විය යුතු නැත. ඉකුත්දා කෝපන්හේගන්හි සිදු වූයේද එයමය.

ගුණමකුබව දුදන ගතියකි.



# නිවන් මඟ නියත වීමට නම්..

**සත්වයා සසරෙහි බැඳ තබන දස සංයෝජන නම් වූ රැහැන් දහයක් ඇත. එනම්,**

**සක්කාය දිට්ඨි**
**විචිකිච්ඡා**
**සීලබ්බත පරාමාස**
**කාමරාග**
**පටිඝ**
**රූප රාග**
**අරූප රාග**
**මාන**
**උද්දච්ච**
**අවිජ්ජා වේ.**

මේ දහයෙන් මුලින්ම සඳහන් තුන දිට්ඨි නිසා සංයෝජනය වේ. දිට්ඨි යනු වරදවා පිළිගැනීමය. වැරදි මතයට ඒමයි. නොපිටට සිතීමයි. මිථ්‍යා දෘෂ්ටියකි. දිට්ඨිය යනු ඕසයකි. භයානක කෙලෙස් ධර්මයකි. ඒවා නැති කළ හැක්කේ විදර්ශනා භාවනාවෙනි.

සම්බුද්ධ ශාසනයක් පහල වූ කළ සද්ධර්මය ලොවට පහල වූ කළ පමණක් මුලින් උපුටා දැමිය හැකි අන් වෙනත් කිසිම කලෙක එසේ නැති කළ නොහැකි විදර්ශනා වෙන්ම නැති කළ යුතු, දුරු කළ යුතු, සමුච්ඡේදනය කළ යුතු බැහැර කළ යුතු කෙලෙස් ධර්ම තුනකි. ආර්යය භූමියේ මුල්බැස ගැනීමට සම්බුද්ධ ශාසනයේ ස්ථාවර වීමට, ආර්ය ශ්‍රාවක භාවය ලැබීමට නිවනට නියත වීමට සම්බෝධි පරායන වීමට සතර අපායෙන් සදහටම අත්මිදීමට ඉහත කී සංයෝජන මුලින් උපුටා දැමීම අනිවාර්යය වේ.

ඒ සඳහා මුලින්ම කළ යුතු පූර්ව කෘත්‍යයන් හෙවත් පෙර සූදානමක් ඇත. එය සපුරාගත යුතුය. එනම්,

- සත්පුරුෂ සංසේවනය
- සද්ධර්ම ශ්‍රවණය
- යෝනිසෝ මනසිකාරය
- ධම්මානු ධම්ම පටිපදාවයි.

මෙකී ධර්මතා ඔබ වෙත විද්‍යමාන වේ නම් ඉහත කී ප්‍රතිලාභ ලැබීමට ඔබට හැකිය. එසේ නොමැති නම් අද අදම සතියෙන් සිහියෙන් යෝනිසෝ මනසිකාරයෙන් ප්‍රායෝගිකත්වයෙන් ප්‍රතිවේධයට පැමිණ නිවනට නියත වූවෙක් වන්න. සංයුක්ත නිකායේ දුතිය සාරිපුත්ත සූත්‍රයේ මේ බව වඩාත් පැහැදිලි කර දී ඇත.

ශාන්ති නායක බුදුපියාණන් වහන්සේ බුද්ධපුත්‍ර ශාරිපුත්ත මහතෙරුන් වහන්සේගෙන් සොතාපත්ති අංග කවරේදැයි විමසූහ.

*"කථමන්නු බෝ සාරිපුත්ත, සෝතාපත්ති අංගන්ති"*
*සප්පුරිස සංසේවෝ හි භන්තේ සොතාපත්ති අංගඞ්*
*සද්ධම්ම සවණං සොතාපත්ති අංගඞ්*
*යෝනිසෝ මනසිකාරෝ සොතාපත්ති අංගඞ්*
*ධම්මානු ධම්ම පටිපත්ති සොතාපත්ති අංගඞ්"*

එහිදී ඉහත ඇසුරින් සෝතාපත්ති අංග පැහැදිළි කර දෙති. බුදුපියාණන් වහන්සේ සාධුකාරදී එය අනුමත කළහ.

ඉහත දැක්වූ ප්‍රතිපදාවට අනුගතවන ආර්ය ශ්‍රාවකයාට පහත දැක්වෙන ප්‍රතිලාභ ද හිමිවේ.

**සුත්වා ච බෝ භික්ඛවේ අරිය සාවතිකො**
ධර්මය ශ්‍රවණය කරන ආර්ය ශ්‍රාවකයා

**අරියානං දස්සාමි**
ආර්ය උතුමන් හදවතින්ම දකී.

**ආර්ය ධම්මස්ස කෝවිදො**
ආර්ය ධර්මය හඳුනා ගැනීමේ දක්‍ෂ වේ.

**ආර්ය ධම්මේ සුවිනිතෝ**
ආර්ය ධර්මයේ හික්මීම ඇතිවේ.

**සප්පුරිසානං දස්සාමි**
ආර්ය මගඵලලාභීන් දකී.

**සප්පුරිස ධම්මස්ස කෝවිදො**
සත්පුරුෂ ධර්මයේ දක්‍ෂ වේ.

**සප්පුරිස ධම්මේ සුවිනීතො**
සත්පුරිස ධර්මයේ හික්මේ.

**මනසිකරණයේ ධම්මේ පජානාති**
මෙනෙහි කළ යුතු දහම දැනගනී.

**අමනසිකරණියේ ධම්මේ පජානාති**
සිහිනොකල යුතු පාප ධර්මයන් මෙනෙහි නොකරයි.

සක්කාය දිට්ඨිය යනු කුමක්දැයි පළමුව හඳුනාගත යුතුය. සක්කාය යනු පංච උපාදාන ස්කන්ධයට හෙවත් හිතට කියන නමක්. හිත හටගන්නේ ගොරෝසු කය ආශ්‍රිතව ඇති ආයතන හය මුල් කරගෙන ය. මේ හිතත් කයත් දෙක එකතුවූ ජීවිත පැවැත්ම ස්වභාව ධර්මයකි. සුද්ධ ධර්මයන්ගේ හෙවත් ධාතුන්ගේ සාමූහික ක්‍රියාකාරිත්වයකි.

මේ ධර්මතාවය හරිහැටි නොදැන මම, සතා, පුද්ගලයා යනුවෙන් නම් කරගෙන පරිපාලනයට යටත් කරගැනීමට උත්සාහ කර උපාදාන තත්වය ඇති කරගෙන ඇත. සම්මුතිය හා පරමාර්ථය ධර්ම ගැන විද්‍යාත්මක විමසුම මගින් ලෝක ව්‍යවහාරය හා පරමාර්ථ ව්‍යවහාරය පැහැදිළි කර ගැනීමෙන් සක්කාය දිට්ඨිය නැති කරගත හැක.

මජ්ඣිම නිකායේ චුල්ලවේදල්ල සූත්‍රයේත් සංයුක්ත නිකායේ සක්කාය දිට්ඨි සූත්‍රයේත් සක්කාය දිට්ඨිය කුමක්දැයි නිරවුල්ව තේරුම් ගත හැකි ධර්ම විවරණයක් අන්තර්ගතය.

චුල්ලවේදල්ල සූත්‍රයේ ධම්මදින්නා මහ රහත් මෙහෙණින් වහන්සේත් අනාගාමී උපාසකතුමාත් අතර වූ ප්‍රශ්නෝත්තර ධර්ම විවරණය ඉතා වැදගත් තැනක් ගනී.

**විශාඛ උපාසකතුමා -**
*සක්කායෝ සක්කායෝති අයෙය වුච්චති. කතමෝ නු භෝ අයෙය සක්කෝ වුත්තො භගවතා.*

ආර්යාවෙනි, සක්කාය, සක්කාය යයි කියනු ලැබේ. කුමක්ද මේ සක්කාය. භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව ?

**ධම්මදින්නා රහත් මෙහෙණින් වහන්සේ -**
*පංචඛෝඛමේ ආවුසෝ විශාඛ, උපාදානක්ඛන්ධා සක්කායෝ වුත්තො භගවතා.*

විශාඛයෙනි, භාග්‍යවතුන් වහන්සේ පංචඋපාදානස්කන්ධයට සක්කාය යනු දේශනා කරති. සෙය්‍යථීදං ? ඒ කෙසේද යත් දැනගන්න.

**රූපුපාදානක්ඛන්ධො -**
රූප උපාදානස්කන්ධය

**වේදනානුපාදානක්ඛන්ධො -**
වේදනා උපාදානස්කන්ධය

**සඤ්ඤුපාදානක්ඛණෙන්ධො**
- සංඥා උපාදානස්කන්ධය

**සංඛාරූපාදානක්ඛන්ධො -**
සංඛාර උපාදානස්කන්ධය

**විඤ්ඤූපාදානක්ඛන්ධො -**
විඤ්ඤාන උපාදානස්කන්ධය

**සක්කාය දිට්ඨිය යනු කුමක්දැයි පළමුව හඳුනාගත යුතුය. සක්කාය යනු පංචඋපාදාන ස්කන්ධයට හෙවත් හිතට කියන නමක්. හිත හටගන්නේ ගොරෝසු කය ආශ්‍රිතව ඇති ආයතන හය මුල් කරගෙන ය. මේ හිතත් කයත් දෙක එකතුවූ ජීවිත පැවැත්ම ස්වභාව ධර්මයකි. සුද්ධ ධර්මයන්ගේ හෙවත් ධාතුන්ගේ සාමූහික ක්‍රියාකාරිත්වයකි.**

පූජ්‍ය ගම්පහ සිරිසීවලී හිමි

15 පිටුවෙන්....



# මේ, ප්‍රාග් යුගයේ සිට පැවත එන වාර්ගික වෛරයක සෙවනැල්ලක්ද?

කොස්ගොඩ කරුණාදාස
සිල්වා දුනුසිංහ




**ලක්දිව ප්‍රාග්යුගයේ ආදි වාසීන් ලෙස සැලකෙන යක්, නා, සුර හා අසුර ඇදහීම් කළ හෙළයෝ මේ රට හඳුන්වා ඇත්තේ හෙළය වශයෙනි. එදා කොටස් සතරකට බෙදාගෙන ඒ ඒ කොටස්වලට යක් හෙළය නා හෙළය, සුර හෙළය හා අසුර හෙළය වශයෙන් හඳුන්වා ගත් බව පෙනේ. හෙළදිව ආර්යාගමනය සිදු වූ පසු ආර්යයන්ගේ සිංහ නමැති වීර සංකේතය ඊට එකතු කොට සිංහ හෙළය වශයෙන් හඳුන්වා ගත්හ.**

ප්‍රාග් ඓතිහාසික වෘතාන්ත අනුව බලන විට ආර්ය හා අනාර්ය දෙකොටසේ හැල හැප්පීම් එදා සිට අද දක්වාම දැකිය හැකිය. ඉන්දියානු සාහිත්‍යයේ එය බොහෝකොටම සඳහන්ව ඇති බව පෙනේ. අද ඊළාම් සටන සිංහල දෙමළ දෙපිරිස අතර පවතින තරඟයක් සේ පෙනුනත් එහි ආරම්භය ඇති වූ ප්‍රාග් යුගයේ එවකට තිබුණු ප්‍රධාන ගෝත්‍ර දෙක වන ආර්යයන් හා අනාර්යයන් අතරන් පැන නැගුණු විරුද්ධ වාදයක සෙවනැල්ලක් බව සිතන්නට කරුණු තිබේ. එහි මූලික පරමාර්ථය ද දේශපාලන අයිතිය ලබා ගැනීමට කරන ලද උත්සාහයකි.

ඉන්දියානු සාහිත්‍යයට ඇතුළු වී ඇති ප්‍රාග් යුගයේ සිදුවී ඇතැයි සැලකෙන සුරාසුර මහා යුද්ධය, මහා භාරත යුද්ධය රාම රාවණා යුද්ධය යනාදී සෑම යුද්ධයක්ම ආර්ය හා අනාර්ය යන දෙකොටස අතරේ සිදුවූ යුද්ධ ලෙස පැහැදිළිව පෙනේ. ඒ සෑම අවස්ථා වලම අවසානය දැක ඇත්තේ ආර්ය පක්ෂයේ ජයග්‍රහණයෙනි. සුරාසුර සටනේ ජයග්‍රාහී පක්ෂය ලෙස සැලකෙන සුරයන්ගේ කැපී පෙනෙන නායකයා වශයෙන් ක්‍රියා කොට ඇත්තේ ශ්‍රී විෂ්ණුය. හිංදු වේදය අනුව ඔහුට අවතාර දහයක් ඇත. බුද්ධ අවතාරය ඉන් එකකි. අවතාර දහයම අනාර්ය පක්ෂයට පසමිතුරු වූ ආර්ය පක්ෂයට සම්බන්ධ වූ ඒවා බව පැහැදිලිව පෙනේ. උදාහරණයක් ලෙස දක්වතොත් ශ්‍රී ක්‍රිෂ්ණා ආර්ය ක්ෂත්‍රිය කෞරව රජ ආර්ය රජුගේ පුතෙකි. බුද්ධ, මගධයේ සුද්ධෝධන නම් ක්ෂත්‍රිය ආර්ය රජුගේ පුතෙකි. මේ ආදී වශයෙන් අවතාර දහයම ආර්ය පක්ෂයට අයත්ව ඇති බව පෙනේ. ආර්යයන් වන කෞරව ක්ෂත්‍රිය රජදරුවන්මය. රාම රාවණා යුද්ධයේ ජයග්‍රාහකයා ද ආර්ය ගෝත්‍රික රාමාය.

හින්දු වෘතාන්ත වලට අයත් මහා යුද්ධ හැරුණු විට බුද්ධ කාලයෙන් පසු සිදු වූ ධර්මාශෝකයන්ගේ යුද්ධයෙන් දරුණු ලෙස පහරකා ඇත්තේ ද අනාර්ය කොටස්ය. දක්ෂිණ භාරතයේ කාලිංග යුද්ධය නිසා කලිඟු වැසියන් විශාල සංඛ්‍යාවක් ඝාතනය වී ඇත. ධර්මාශෝකයන් ද ආර්ය ක්ෂත්‍රියයෙකි. එවකට ඔහු රාෂ්ට්‍ර තෘෂ්ණාවෙන් අන්ධ වූවෙකු විය.

මහා භාරත දේශයට ආර්යාගමනය සිදු වූ පසු එහි විසූ අනාර්ය ගෝත්‍රික ජනයා ඔවුන්ගේ හිංසා පීඩා වලට ගොදුරු වූ බව පෙනේ. උතුරෙන් පිටුවහල් වූ ඔවුහු ක්‍රම ක්‍රමයෙන් දකුණට තල්ලු වී ගියහ. අද දක්ෂිණ භාරතයේ වෙසෙන දෙමළ මලයාල කාණ්ඩය හා තෙළිඟු යන සතර වර්ගයම එම ගෝත්‍රික පරපුරු වලින් පැවත එන්නන් ලෙස සැලකේ. පසු කාලෙක උත්තර භාරතයේ සිට පැමිණි බ්‍රාහ්මණ ගෝත්‍රික පිරිස් ද දකුණේ ග්‍රාම කීපයක් නිජ බිම කොට ගෙන පැල පදියන් වූ බව ශාලිග්‍රාමය හා කොංකණිය යන පෙදෙස් වල පදිංචි වූ බව ඓතිහාසිකව පෙනෙන්නකි.

කාලිංගයේ පාලන බලය ආර්යයන් යටතේ පැවතුන ද එහි වැසි සාමාන්‍ය ජනතාව අනාර්ය පුරවැසියන් බව සැලකිය හැකිය. කෙසේ වුව ද ප්‍රාග් යුගයේ ආභාෂය අනුව ආර්යයන් බලවත් වුව ද අනාර්යයන් පැමිණි වෛරය නිසා අවස්ථාව ලැබුණුවිට ආර්යයන්ට රහසේ හෝ එළිපිට පහර ගැසීමේ චේතනාවෙන් ක්‍රියා කළ බව පැහැදිලිව පෙනෙන්නට තිබේ.

ලක් දිව රාජ්‍ය පාලනය කළ කාලිංග බාහු නිශ්ශංකමල්ල වැනි ආර්ය ගෝත්‍රික රජවරු ධාර්මික පාලකයෝ ලක් වැසියන් පීඩනයට පත්කොට ඇත්තේ ඒ නිසා විය යුතුය.

ප්‍රාග් යුගයේ සිටම ඉතිහාස ගත වූ හෝ නුවූ සැම ආර්ය අනාර්ය සටනකදීම ජයග්‍රාහක වීරයන් බවට පත් වී ඇත්තේ ආර්ය කොටස්ය.

මුල් කාලයේ අනාර්ය ගෝත්‍රිකයන් විසූ භාරත දේශයට උතුරෙන් ආර්යයන් ඇතුළු වන විට ගෝත්‍රික ජනයා ඔවුන්ගෙන් පහරකා විනාශ වී හෝ එළවනු ලැබ ශේෂ වූ සුළු පිරිස් මඳින් මඳ තල්ලු වී ගොස් දක්ෂිණ ප්‍රාන්ත වලට කොටු විය. එවකට නොදියුණු ම්ලේච්ඡ පිරිසක් ලෙස දිවි ගෙවූ ඔවුන්ගෙන් පැවත ආ කොටස් අද වන විට දෙමළ මලයාල,කාණ්ඩ හා තෙළිඟු යන භාෂා ව්‍යවහාර කරති.

භාරතයේ පමණක් නොව අප්‍රිකාව, ඇමෙරිකාව, ඕස්ට්‍රේලියාව හා යුරෝපයේ බොහොමයක් කුඩා දිවයින් වලත් මහාද්වීප බොහොමයකත් ආදිවාසීන් සේ සැලනෙක නිග්‍රෝවරු, රතු ඉන්දියාන්වරු, ඇබොජිරියන් වරු ආර්ය වරුන්ගේ ආක්‍රමණ වලින් විනාශවී නන්නත්තාර වී ඇත. අද ඒවායේ සම්පූර්ණ හිමි කම් ඇත්තේ ආර්යයන්ටය. ආර්යයන්ගේ මුල් නිජබිම ඉරානය බව ඉතිහාසඥයන්ගේ මතයයි.

කිසිවෙකුට යටත් නොවන අභිමානවත් මනුෂ්‍ය කොටසක් වූ ආර්යයෝ ප්‍රාග්යුගයේ සිටම සෑම කරුණකදීම ජයග්‍රහණයෙහි දක්ෂයන් වූහ. මේ නිසාම වීරයන් බවට පත් වූහ. ලක් දිව විජයාගමනය සිදුවීමටත් පෙර භාරතයේ විසූ නරසිංහ, ප්‍රතාපසිංහ, ගජසිංහ යනාදී සිංහ පදය එකතු කරගත් නම් ව්‍යවහාර කළේ මෙම වීරත්වය හැඳින්වීම සඳහා යොදාගත සිංහ සංකේතය වශයෙනි. මේ අනුව සිංහයා වීරත්වයේ සංකේතය විය. අද ද ආර්ය කොටසක් වූ සික් වරු සිය නම් වල අගට සිංහ (සිංහ) යන්න භාවිතා කරති.

ලක්දිව ප්‍රාග් යුගයේ අදි වාසීන් ලෙස සැලකෙන යක්, නා, සුර හා අසුර ඇදහීම් කළ හෙළයෝ මේ රට හඳුන්වා ඇත්තේ හෙළය වශයෙනි. එදා කොටස් සතරකට බෙදාගෙන ඒ ඒ කොටස්වලට යක් හෙළය නා හෙළය, සුර හෙළය හා අසුර හෙළය වශයෙන් හඳුන්වා ගත් බව පෙනේ. හෙළදිව ආර්යාගමනය සිදු වූ පසු ආර්යයන්ගේ සිංහ නමැති වීර සංකේතය ඊට එකතු කොට සිංහ හෙළය වශයෙන් හඳුන්වා ගත්හ. අදි හෙළයේ විසූ අනාර්ය හෙළයන් ආර්ය වීරයන් අතින් විනාශ වුව ද අතරින් පත් ශේෂ වූවෝ බිම්තැන්න, නාගදීපය හා කැළණිය යන එවකට ප්‍රත්‍යන්ත දේශ වශයෙන් පැවැති වන ගත පෙදෙස් වලට වී සැඟවී වාසය කළහ. අද වන විට ඔවුන් ද නව ජන පදිකයන්ට මිශ්‍ර වීම නිසා ඉතිහාසයෙන් ද මැකී ගොස් ඇත.

ඉන්දියාවේ දකුණු කෙළවරට කොටු වූ සිව් ද්‍රවිඩ පිරිස් ජීවනෝපාය සඳහා පිළිසරණ ලබා ගැනීමට වරින් වර සුළු කාණ්ඩ වශයෙන් ලක්දිවට පැමිණ පැලපදියන් වී ඇතත් ලක් දිව නිජ බිම සංකල්පයක් ගැන කිසිම ඓතිහාසික ශාක්ෂියක් සොයා ගත නොහැකිය. ඔවුන්ට නිජබිමක් ගැන ඓතිහාසිකව පැවසිය හැක්කේ ඉන්දියාවේ දී පමණකි. යක්, නා, සුර හා අසුර යන සිව් කොටසින් ශේෂ වූවන් අද ශ්‍රී ලංකාවේ ජීවත්ව සිටීනම් ඔවුන්ට පමක් ශ්‍රී ලංකාවේ නිජබිමක් ගැන කථා කිරීමේ හැකියාවක් ඇත.

ලක්බිමෙහි ඓතිහාසිකව එන නිජබිම් උරුමයක් නැති ඉන්දියානු ආදි වාසීන්ගෙන් පැවත එන දෙමළ මලයාල කාණ්ඩ හා තෙළිඟු යන භාමා ව්‍යවහාර කරන කිසිවෙකුට මෙම ඊලානාඩුවේ බිම් අයිතියක් නැති බව දැන දැනත් මෙවැනි අයුතු සහගත ලෙස එයට ඉල්ලීම ප්‍රාග් යුගයේ සිට පැවත එන ආර්ය අනාර්ය වෛරය නිසා පාරම්පරික එදිරිවාදී කමකට කරන පළිගැනීමක් බව යයි සිතිය හැකිය. කොටින්ම කියතොත් ඓතිහතාසිකව උරුමයක් තිබෙන ද්‍රවිඩයන්ගේ නිජබිම ඉන්දියාව බවත් සව්වාර්ගික හෙළයන් ඇතොත් ඔවුන්ගේ නිජබිම ශ්‍රී ලංකාව බවත් කිවහැකිය.

පාරම්පරික ප්‍රාග් යුගයේ සිට පැවත එන ආර්ය අනාර්ය වෛරය විජයගේ යුගයේම ආරම්භ වූ බව ඓතිහාසිකවම පෙනෙන්නකි.

මේ ආර්ය ද්‍රවිඩ පිරිස් ප්‍රාග් යුගයේ සිටම වරින් වර ආර්යයන්ගෙන් පලිගැනීමට පටක් ගත්හ. එහෙත් ඔවුන් කිසි කලෙක ජයගත් බවක් නොපෙනේ.

කුවේණියගෙන් පසු විජය පාවාගත් දෙවැනි බිසව වූයේ දකුණු ඉන්දියාව නිජබිම කොටගත් ද්‍රවිඩ අනාර්ය කතකි. විජායි නම් වූ ඇය පාඬි රජුගේ දියණියයි.

මේ නිසා විජයගේ රාජය තන්ත්‍රයට ද්‍රවිඩ බලපෑම් වැඩි විය. උපතිස්ස නමැති ආර්ය බ්‍රාහ්මණයා විජයගේ පුරෝහිතයා හා අගමැති වරයා ලෙස කටයුතු කළ අතර විජයගේ පාලන තන්ත්‍රයේ බොහෝ නිලතල වලට පත්ව සිටියේ බිසවගේ නෑදැයින්ය. විජය මිය ගිය පසු මෙම පාඬි පිරිස් රහසේ සාකච්ඡා පවත්වා ලක්දිව පාලනය ඔවුන් අතට පත් කර ගැනීමට උත්සාහ කළහ. මෙය ඉවෙන් මෙන් දැනගත් උපතිස්සයෝ වගුරටට දූතයන් අත සිරිලක පාලනය භාර ගන්නා ලෙස එහි එවකට රජකළ සුමිත්ත රජුට පණිවුඩ යැවූහ. විජයගේම වයසේ පසු වූ නිවුන් සොයුරෙන් වූ ඔහු ලක් රජය භාර ගැනීමේ දුෂ්කරතාවය පලකොට සිය පුතනුවන් වූ පණ්ඩු වාසදේවල කුමරු මෙහි එවීය. එසේ වුවද පාඬි නිලධාරීන්ගේ රහස් කුමන්ත්‍රණ ගැන වටහා ගත් උපතිස්ස බමුණා පණ්ඩුවාස දේවයන් සමඟ සාකච්චා කොට ඔහුගේ පියතුමාට තත්ත්වය අවබෝධ කර දුන්නේය. එය දඹදිව බෞද්ධ යුගයයි. ශුද්ධොදන රජුගේ සොයුරු අමිතෝදනයන්ගේ පුත්‍රයා වන ශාකය පණුඩු එවකට නේපාලය පාලනය කළේය. ඔහුට පුතුන් සත්දෙනෙක් හා එක දුවක් සිටි අතර දුව පණ්ඩුවාස දේවයන්ට අවාහ කරවාදී ලක්රජය භාරදුන්නේ.

ශාක්‍ය පණ්ඩු ලක් රජය රාෂ්ඨ පාලනය සඳහා තමාගෙන් පසු වැඩිමහල් පුතු සිටිය යුතු හෙයින් ඔහු තවත්වා රාම, උරුවෙල, අනුරාධ, විජිත, දීඝායු හා රෝහණ පුතුන් සදෙනා බෑණාටත් දියණියටත් සහාය වීම සඳහා ලක් දිවට එවීය. එයින් පසු කුමාර වරුන් සදෙනාට රට හයකට බෙදා ප්‍රාන්ත පාලනය කිරීමට සලස්වා අග රජු ලෙස පඬුවස් දෙව් කුමරු රට පාලනය කළේය. පාඬිවරුන්ගේ නිලතල ඉබේටම අහෝසි වී ගොස් ඔවුන්ට පාඬි රටටම යාමට කටයුතු සැලසුනේ භද්ද කච්ඡායනාගේ සොහොයුරන්ගේ පාලන කටයුතු වල සාර්ථකත්වය නිසාය.

පාරම්පරික වාර්ගික වෛරය වූ ආර්ය අනාර්ය භේදයෙන් ප්‍රථමයෙන්ම ලක් දිව ආරම්භ වූ ද්‍රවිඩ ආක්‍රමණය ව්‍යර්ථ වී ගියේ ඒ අයුරිනි.

එවකට බෙංගාලය නේපාලය භාවිතා කළේ ද බුදු රජුන්ගේ බස වූ මාගධියයි. නේපාලයේ භද්ද කච්ඡායනා ද බෙංගාලයේ පඬුවස් දෙව් ද කථා කළ පාලි බස ලක් රජය ආරම්භ වූ පසු ලංකාවේ ද භාවිතා විය. පසුව රටවල් තුනක් ලෙස කල් යාමේ දී මඳින් මද භාෂා තුනක් ලෙස විකාශනය වූ නේපාල බසත් , බෙංගාල බසත්, සිංහල බසත් පාලියෙන් ආරම්භ වුව ද අද පවත්නා තත්ත්යට විකාශනය වී තිබේ. අද වුවද ලෝකයේ භාෂා වලින් එකම අයුරික් ඇකාරය ව්‍යවහාර වන භාෂා ලෙසත් එකකට එකක් වචනවල සමානත්වය හා සංස්කෘතිය බලපාන භාෂා ලෙසත් එම භාෂා තුන සැලකිය හැකිව තිබේ. අද පවතින ද්‍රවිඩ ආක්‍රමණික සෙවනැල්ල ද ආර්ය අනාර්ය භේදය මත එදා සිටම පාරම්පරිකව පැවත එන්නක් බව පෙනෙන්නට තිබේ. එහෙත් ඉතිහාසය අනුව අනාර්යන් කිසි කලෙක ස්ථිර ජයක් අත් කර ගෙන නැත.



රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER

රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.

දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 5361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: rangirinewspapers@gmail.com
වෙබ් අඩවිය: www.rangirisrilanka.lk

## නිදහස් සිතුවිලි සිතනා සිතත් උදාරයි

සෑම වසරකම පෙබරවාරි මාසය එළඹෙන්නේ ශ්‍රී ලංකාව අධිරාජ්‍යවාදීන්ගෙන් යටත් වීමේ උදාර සිතුවිල්ලද අප වෙත ගෙනඑමිණි. 1815 දී ශ්‍රී ලංකාද්වීපය යටත් වීමෙන් අනතුරුව 1818 සහ 1848 සිදුවූ නිදහස් අරගලයන් පසුබිමේ බුදුදහමේ සහ බුදු සසුනේ පැවැත්මට එල්ලවූ දැඩි බලපෑම් ද හේතු වූ බව ඉතිහාසය පෙන්වා දෙයි. 1847 දී ඉංග්‍රීසිහු දළදා වහන්සේගේ භාරකාරීත්වයෙන් ඈත්වීම, වෙහෙර විහාර, දේවාල සඳහා පැනවූ දැඩි නීතිරීති මෙන්ම භික්ෂූන් වහන්සේලාගෙන් පවා බදු අය කිරීමට පෙළඹීම වැනි රුදුරු තීරණ ඒ අතර මුල් තැනක් ගනී.

ඌව වෙල්ලස්සේ සහ මාතලේ දී පිළිවෙලින් 1818 සහ 1848 ඇතිවූ නිදහස් අරගලයන්හිදී ඊට මඟ පෙන්වූ භික්ෂූන් වහන්සේලා සහ වෙහෙර විහාර වෙත ඉංග්‍රීසින් එල්ල කළ රුදුරු ප්‍රහාරයන් ද මෙවැනි මොහොතක සිහිකළ යුතුවේ.

1848 නිදහස් සටනේ කේන්ද්‍රස්ථානය වන්නේ රංගිරි දඹුලු විහාරස්ථානයයි. එකී අරගල හමුවේ ජාතියේ නිදහස උදෙසා දිවි පිදූ භික්ෂූන් වහන්සේලා සිහිපත් කිරීම ද අපගේ වගකීමකි.

බෞද්ධ දර්ශනයට අනුව අප වෙත ජීවන විමුක්තියේ සහන් පණිවුඩය ලැබුනේ මහින්දාගමනයෙනි. සියලු තෘෂ්ණාවන්ගෙන් මිදී සදාකාලික සුවය ඇති නිර්වාණ සුවය ලැබීම බෞද්ධයන්ගේ පරම චේතනාවය. ඉන් මෙහා අප ලබන සියල්ල තුළ ඇත්තේ දුක් සහිත බවය. අස්ථිර බවය.

මිනිස් චින්තනය සර්ව සම්පූර්ණයෙන්ම නිදහස් නිවහල් විය යුතු ආකාරය කාලාම සූත්‍ර දේශනාවෙන් බුදුරජාණන් වහන්සේ මැනවින් පෙන්වා දෙනු ලැබූ සේක.

දේශපාලන, ආර්ථික, සමාජීය, හෝ වෙන අන් කවර හෝ පටු බැඳීමකට කොටු නොවී කටයුතු කිරීමේ ශ්‍රේෂ්ඨ මානව නිදහස එයම වන්නේය.

අධිරාජ්‍යවාදීන්හු නික්ම යන්නේ ආර්ථික, දේශපාලනික සහ අධ්‍යාත්මක වශයෙන් යළි කිසිඳු දිනෙක අත්මිදිය නොහැකි සංකල්ප ජාලයක අපව සිරකර තබමිනි. 72 වසරක් පුරා අප එය දෙතුන් ගුණයකින් නොව හත් අට ගුණයකින් පටලවාගෙන එහිම ගිලී, එහිම සිරවී පවුල, පන්සල දක්වාම බේද කරගෙන අවසන්ය.

මෙවන් මෝහ ඝනාන්ධකාරයන්ගෙන් මිදීමේ ඒකායන මාර්ගය වන්නේද බුදුදහම නිවැරදිව අවබෝධ කරගැනීමය. පිළිපැදීමය. ඒ අනුව ජීවිතය සකස් කරගැනීමය. ඒ සිදුවන තාක් සැබෑ නිදහස අපට තවත් දුරින් දුරය.



## අද ලෝකයට ගැළපෙන



# නූතන වැඩිහිටි රැකවරණ ක්‍රමය

වැඩිහිටි සමාජයට කළ හැකි ප්‍රත්‍යුපකාරය වන්නේ සැනසිල්ලේ ජීවත්විය හැකි පරිසරයක් ගොඩනගා දීමයි. ශාරීරිකව මෙන්ම මානසිකවද පෙරට වඩා දුර්වල තත්වයක සිටින වැඩිහිටියන්ට ලබාදිය හැකි උසස්ම සැළකිල්ල වන්නේ ඉදිරි වසර කීපය තුළ නිදහසේ සැනසිල්ලේ ජීවත්වීමට අවශ්‍ය පරිසරය සකසා දීමය.

මේ සඳහා යෝජනා කරන්නේ Elders ' Society නමැති වැඩසටහනයි.

වැඩිහිටියන් බලාගන්නා සාම්ප්‍රදායික රාමුවෙන් ඉවත් වී වැඩිහිටියන් ජීවත් කරවීමේ නවීන චින්තනය යටතේ මෙය සැකසී ඇත. මෙය ඔවුන් පුනර්ජීවය ලබන වැඩසටහනකි. කාලය ඉකුත් වීමෙන් පැත්තකට විසිකිරීමට නියමිතව තිබූ වැඩිහිටියන්ට ඔවුන්ව අගය කරන, ඔවුන්ව පිළිගන්නා සමාජයක් වෙත නැවත කැඳවාගෙන යාමක් මෙය තුළින් සිදුවේ.

වැඩිහිටියෙකුට ජීවත්වීමට ඉතාම සුදුසු ස්ථානය වන්නේ තමා මෙතෙක් ජීවත් වූ තමාගේම නිවසයි. නමුත් තම නිවසින් තමා බලාපොරොත්තු වන නිදහස, සැනසිල්ල, සතුට රැකවරණය, නිසියාකාරව ලැබෙන්නේ නැතිනම් ඔවුන්ට එවැනි නිදහසක් තිබෙන ස්ථානයකට ගොඩවීම වඩා යහපත් තීරණයක් විය හැකිය. නිවසේ ජීවත්වන දරුවන්ගේ පැත්තෙන් ගත්තත් මෙය නිවැරදි තීරණයත් විය යුතුය. පවතින සමාජ, ආර්ථික රාමුව හමුවේ වැඩිහිටියන් වෙනුවෙන් කැපවීමට ඇති නොහැකියාව තේරුම් ගත යුතුය. දැනට හැකි උපරිමයෙන් වැඩිහිටියන් වෙනුවෙන් වෙහෙසුනත් ඔවුන්ගේ සමාජ හා මානසික අවශ්‍යතා ඉටුකිරීම ඉතා අසීරු වේ.

මේ නිසා සමාජ හර පද්ධතීන් විනාශ වීමට ඉඩ නොදී පවුලේ කාර්යයන් ද රැකගනිමින් වැඩිහිටියන් වෙනුවෙන් ඔවුන්ගේම සමාජයක් ගොඩනැගීම අපේ බලාපොරොත්තුවයි.

වැඩිහිටියන් වෙනුවෙන්ම වෙන්වූ ආයතනයක් ස්ථාපිත කිරීම මෙම Elders' Society නැමැති වැඩසටහනේ බලාපොරොත්තුවයි. මෙම ආයතනය නගරයේ පිහිටුවන අතර ඕනෑම ප්‍රදේශයක වෙසෙන වැඩිහිටියෙකුට මෙහි සේවය ලබාගත හැකිය. වැඩිහිටියන්ට අවශ්‍ය සියලු දේ මෙහි ස්ථාපිත කරන අතර ඔවුන්ගේම ආයතනයක් ලෙස පවත්වාගෙන යාම අරමුණයි. Elder's Society ආයතනයේ මූලික තේමා පාඨය වන්නේ වැඩිහිටියන්ට නිදහසේ සැනසිල්ලේ ඉදිරි කෙටි කාලය ජීවත්වීමට අවශ්‍ය පරිසරය සකසා දීමයි. ඒ සඳහා සියලු දේ ඉටුකිරීමට එම ආයතනය සූදානම්ය.

දරුවන්ගේ අවිවේකී බව නිසා නිවසේ හුදෙකලා වන වැඩිහිටියන්ට මෙම ආයතනය තුළදී තම වයසේ යහළු මිත්‍රාදීන් සමඟ ඉතා සතුටෙන් කාලය ගතකළ හැකිය. තමන්ගේ අදහස්වලට සවන්දෙන පිරිසක් ඒ අදහස් වලට ගරුකරන පිරිසක් මෙහි සිටිති.

එපමණක් නොව ආයතනය සමඟ එකතු වී තම අදහස් ක්‍රියාත්මක කිරීමට ද හැකියාව ඇත.

කෑම බීම, ඉඳුම් හිටුම්, බේත් හේත් වගේම වැඩිහිටියන්ගේ අවශ්‍යතාවලට ගැලපෙන ආකාරයේ සියලු අවශ්‍යතා ඉටුකිරීමට ආයතනය උත්සාහ කරයි. දිනපතාම වැඩිහිටියන් සඳහා ක්‍රියාත්මක කරන වැඩසටහන් රාශියකි. ඒ සියල්ලටම මොවුන්ට සහභාගී විය හැකිය.

වයස අවුරුදු 75 හෝ ඊට වැඩි වැඩිහිටි අය සඳහා වෙනමම සේවක පිරිසක් යෙදවීමට ද බලාපොරොත්තු වේ. මෙම වැඩිහිටියන් මානසික මෙන්ම කායික වශයෙන් දුර්වල තත්වයක පසුවන්නන් නිසා විශේෂ හෙද කාර්ය මණ්ඩලයක් හා උපස්ථායක කාර්ය මණ්ඩලයක් ආයතනය සතු වේ.

ආයතනයට සම්බන්ධව කටයුතු කරන වෛද්‍ය මණ්ඩලයක් ඇති අතර ඕනෑම අවස්ථාවක නේවාසික වැඩිහිටියෙකු වෙනුවෙන් වෛද්‍ය සේවය ලබාගත හැකිය. පවුලේ අය නොසිටියත් අසනීප වන වැඩිහිටියන් සඳහා ඒ අවශ්‍ය සියලු කටයුතු කිරීමට මෙම ආයතනය බැඳී සිටියි.

දරුවන්ට, ඥාතීන්ට තම වැඩිහිටියන් වෙනුවෙන් ඉටුකිරීමට ඇති බොහෝ දේ ආයතනය තුළින් ඉටුකිරීමට උත්සාහ කරයි. වැඩිහිටියන් පිරිසක් ලෙස, කණ්ඩායමක් ලෙස කාලය ගතකරන බැවින් ඔවුන්ගේ තනිකම, කාන්සිය, නැතිවී සැහැල්ලු ජීවිතයක් ගත කරයි.

ඔවුන් කිසියම් ක්‍රියාකාරකමක නිරත වන බැවින් අරමුණක් ඇතිව, බලාපොරොත්තුවක් ඇතිව වැඩ කිරීමට පුරුදු වේ. ඒ නිසා ඊළඟ දවසේ දී කිරීමට බලාපොරොත්තු වන දෙයක් පිළිබඳ බලාපොරොත්තු ඇතිවේ.

ආයතනය දරුවන්ගේත්, ඥාතීන්ගෙන් සහ හිතවතුන්ගෙන් යමක් බලාපොරොත්තු වේ. වැඩිහිටියන් ආයතනයට භාරදුන් පසු ඔහුගේ සුවදුක් බැලීම සඳහා නිතර පැමිණීම ඉතා වැදගත්ය. ඔහුට ඔහුගේ දරුවන්, ඥාතීන්, හිතවතුන් අමතක කළ නොහැකිය. ඔහුට තිබූ මානසික පීඩනය නිසා මෙවන් තැනකට ආවත් නිවසේ අය අමතක කළ නොහැක. ඔහුගේ මනස සමබර වීමට නම් ඒ පවුලේ හිතවතුන් පැමිණිය යුතුය. දුක සැප සොයා බැලිය යුතුය.

දරුවන්ගේ කටහඬ, මුණුබුරු මිණිබිරියන්ගේ දුවන පනින විනෝද වෙන හඬ, මෙය තරම් සිත් ගන්නා දෙයක් තවත් නැත. ඔවුන් ලඟපාතක ඉන්නවා නම් ඊට වඩා දෙයක් නැත. ඔහු තනි වූවා යැයි හැඟීමක් ඇති නොවේ. නිවසේ දී මෙන්ම තවමත් තමන් වටා තම දරුවන් ඉන්නා බවත් ඔවුන්ගේ ආදරය සෙනෙහස ලැබෙන බවත් ඔහුට දැනේ.

පොල්ගොල්ල ශාස්ත්‍රාරවින්ද විද්‍යායතනයේ ආචාර්ය
එල්. වයි. එස්. ගාමිණි

# සඳ සිසිල

සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.

## අරමුණ සොයා යමු බුදු හිමි දෙසූ පරම



කසාවතක අභිමන් මුලු ලොව  රැන්දූ
මුසාබස් නොවේ දෙසූ ඒ මධු  බින්දු
කසාවතම තම පන මෙන් හද  රැන්දූ
වසා දෙනෙත් පිරුණා කඳුලැලි  බින්දූ

දිව ඇද කැපුවත් නොකියූ බොරු  කිසිදා
මව මෙන් රැකගත්ත රට දැය දිවි  පරදා
අවමන් ලබන්නේ නැත විරුවන්  සැමදා
ඔබවන් බුදු පුතෙක් යළි බිහිවෙද  කවදා

මරණය පිළිබඳව හිමි ඔබ කල  දෙසුම
පරවුන මලක් මෙනි ජීවිතයක  අරුම
හිරවුණ ජීවිතය නිදහස් කර  ගැනුම
අරමුණ සොයා යමු බුදු හිමි දෙසූ  පරම

රුවන් පියසිරි බණ්ඩාර දසනායක

## අනඟ හා උරණ වෙයි සීගිරි ලළන

ලවන සිප වැළඳගත් නාදලු  නොයන
නගන හස දසන් දක්වා මුතු  රැඳුන
නයන තුළ නීලමිණි සඟවා  දිලෙන
රැඳුන දේදුන්න ඇත දෙබැමේ  නැමුන

ඉඳුණා දෙළුම් ගෙඩි පැහැ දෙකොපුල්  තෙමන
ලගින අඩසඳට නළලේ ඉඩ  ලැබුන
කවන කිති කියෙඹු දෙසවන් පිරි  මදින
දිලෙන රන් කොතලයක් නිකටේ  රැඳින

පෙනෙන ගෙලේ හර ගිරවුන් ලද  බඳින
සොයන තිසර නිදහස දගනේ  ලගින
පැමිණා ඉනේ හර බැඳි සීගිරි  ලළන
සලන නිතඹ දුණි නාලිය ලෙස  තිළිණා

පුදන පැහැය පරවිය හොටමත  තිබෙන
උලන දෙපාමත නොවෙනස් වී  රැඳෙන
නගන හඬට මිණි කිංකිංණි වන  දෙවන
වඩන සළු තුලින් කුළවමියක්  පෙනිණා

පිරුන කළය නාලාවෙන උකුලේ  හොවන
උවන සම කරන පෑසිසි තුළ  ගගන
අඟන සීගිරියෙ නුඹවෙත අත  වනන
උරණ වෙයි අනඟ හා දුනු හී  ගෙනෙන

එම්.එම්.කුලසිරි ද සිල්වා
සමගිගම
කැකිරාව

## සැමහට සෙතක් වේවයි අප පවසන්නේ

නවම් මහේ පුන්සඳ පායා  එන්නේ
මද සීතලෙන් සමනල සිරිපා  යන්නේ
පිංබර සිතින් සැමදෙන සැනසී  ඉන්නේ
සැමහට සෙතක් වේවයි අප  පවසන්නේ

පරිසරයත් අලංකාරව හැඩ වී  එන්නේ
විහඟු හඬින් මුළු පෙදෙසම නද  වන්නේ
ගත සිත පුබුදුවන හැඟුමන් ඇති  වන්නේ
ආසිරි සමඟ මේ කවිපෙළ  ලියවෙන්නේ

දිනෙන් දිනම දම්රසයම ලැබ  ගන්නේ
එමගින් යහපතක් සැමටම  සැලසෙන්නේ
ඉසිකෝමාන දුරලා සැම  එක්වෙන්නේ
එවිටයි රටට සැමදා සෙත  සෑදෙන්නේ

සුන්දර සිරිලකට එන අණවින  දුරුකරමු
රට ජාතියට නිරතුරුවම පණ  පොවමු
මවුබිම අපේ නිරතුරුවම රැක  ගනිමු
සාමයෙ කොඩිය අතැතිව ඉදිරියට  යමු

එක මවකගේ දරුවන් ලෙස ගත  කරමු
ජාතිය ආගමත් සුරකීමට වෙර  දරමු
පර ගති සිරිත් අප සිත් තුළ  නොරඳවමු
සිරිලක් මෑණියන් වෙත ආසිරි පුද  කරමු

අජන්තා ශිරෝමණී දිසානායක
තලවත්තේගෙදර

## ලොවක් බුදු වදනින් දිනන්නට

මා පැතු ලෝකය දෝත දරාගෙන
ආවෙමි ජීවන සසර පුරා
සෙව්වෙමි දම්හඬ ලොව වෙත ගෙනයන
සඳහම් එළියෙන් අඳුර මකා
යහගුණ මැකිලා පිරිහෙන ලෝකෙක
උදාර සිතිවිලි සිත පහදා
ඇසුවෙමි නිසරට ගෙන යන දම්සුව
''ලොව දිනනා බුදුමග'' වෙතිනා

බුදු වදනක ඇති නිවීම....සැනසුම....
''අරි අට මග'' තුළ බව පහදා
කෙළෙසුන් දුරැ කර සිත රැක ගන්නට
දෙසූ දහම් පද සිත රැකුනා

හටගත් අකුසල් මනසින් දකිනට
''තිලකුණු'' සමගින් පෙන්වාලා
එන කෙළෙසුන් යළි කුසලින් පුරවන
දුන් දිරියෙන් නැණ සිත සකසා

හිමියෙනි ''කස්සප උඩුදුම්බර'' ගුණ
පිරි ගුණ සිල් දම් පිබිදීලා
මෙම බුදු සසුනෙම නිවන් දකින්නට
කුසලින් හිමි නිති සැනසේවා

ඒ.මුණසිංහ
අනුරාධපුර





# සත්වයාගේ පැවැත්ම සඳහා භෞතික පරිසරය දායකවන ආකාරය පිළිබඳ බෞද්ධ විග්‍රහය

ශාඛ, සත්ව ප්‍රජාව, ජලය හා වාතය පාරිසරික සාධක ලෙස බුදුසමය පෙන්වා දෙයි. බුදුසමය හා පරිසරය අතර ඇත්තේ දැඩි මිත්‍රත්වයකි. බුදුරදුන් රහතන් වහන්සේලා සුන්දර පරිසරයට ඇලුම් කළ ආකාරය විවිධ සූත්‍ර දේශනාවන්හි සඳහන් වේ.

සංයුක්ත නිකායේ වන රෝප සූත්‍රයේ වන වගාව, ගස්වැල් සිටුවීම, පාලම් ඒ දඬු තැනීම, ළිං පොකුණු තැනීම පිං වැඩෙන ක්‍රියාවක් වන බව දේශනා කර ඇත. බුදුසමය තුළ විග්‍රහ කරන්නේ පරිසරයට මෛත්‍රී කළ යුතු බවයි. රුක්ඛ සූත්‍රයේ දේශනා කර ඇත්තේ "ගස වනාහී එය විනාශ කිරීමට පැමිණෙන පුද්ගලයාටත් සෙවන සපයයි" යනුවෙනි.

කුටදන්ත සූත්‍රයේ යාග සඳහා යාගස්ථම්භ ඉදිකිරීමට ගස් කැපීමත්, යාග වලට සතුන් බිලි දීමත් හේතුකොට ගෙන භෞතික පරිසරයට හානි සිදුවන බව දේශනා කර ඇත. එමෙන්ම බුදු සමය චක්කවත්තිසීහනද සූත්‍රයට අනුව පෙන්වා දෙන්නේ පක්ෂීන්ට සිවුපාවුන්ට අභයදීම රජුගේද වගකීමක් බවයි.

පංචශීල ප්‍රතිපදාවේ පළමු වැන්නද ප්‍රාණඝාතයෙන් වැළකීම වේ. දැක්කාවූද නොදැක්කාවූද (දිට්ඨාවායේව අද්දිට්ඨා), දිග වූද මහත්වූද (දිගාවායේ මහන්තාවා) ආදී ලෙස සියලු සත්වයන්ට මෙත් වැඩීමට බුදු සමය උගන්වයි. ශාඛ හා සතුන් පමණක් නොව ජල සම්පත රැකගැනීම පිණිස ද බුදුසමය කරුණු පෙන්වා දෙයි.

ජලයට කෙළ ගැසීම, මුත්‍රා කිරීම, ඉදුල් වතුර දැමීම නොකළ යුතු බව උගන්වන බුදු සමය පානීය ජලාශ අසල ආරාම තැනීමෙන් වැළකී සිටීමට ද කරුණු පෙන්වා දී ඇත.

වත්ථක්ඛන්ධකයේ වායු දූෂණය නොකිරීමට උපදෙස් පෙන්වා දී ඇත. වාතයද භෞතික පරිසරයේ අංගයකි. එබැවින් දූවිලි සහිත ඇද ඇතිරිලි උඩු සුළඟට හසු නොවන පරිදි ගසා දැමිය යුතු බව පෙන්වා දෙයි. ජලපය මෙන්ම වාතයද මිනිසාගේ පැවැක්මට අතිශය වැදගත් සාධකයක් බව බුදු සමය විග්‍රහ කරයි.

"අසම්බාධං අවේරං අසපත්තං" තමා ජීවත්වන පරිසරය සම්බාධක සහිත වෛර සහිත, සතුරු වූවක් නොවේයැයි සිතීමට බුද්ධ දේශනාවෙහි සඳහන් කර ඇත.

භෞතික පරිසරය රැකගැනීමට බුදුසමය කරුණු දක්වා ඇති අතර භෞතික පරිසරය හා මිනිස් චර්යාවන් අතර පවතින සම්බන්ධතාවය පිළිබඳව ද සූත්‍ර ඇසුරෙන් දේශනා කර ඇත. අග්ගඤ්ඤ, කුටදන්ත, සප්ත සුරියග්ගමන වැනි සූත්‍ර වල මිනිස් චර්යාවන් පරිසර විනාශය, ලෝක විනාශය සඳහා හේතුවන බව පෙන්වා දී ඇත.

සමුද්දවානී ජාතකයේ පවා සඳහන් වන්නේ මිනිසුන් සදාචාරය නොතකා අධාර්මික ලෙස ජීවත් වන විට සමුද්‍රය කෝප වී මුහුදු ජලය ගොඩ ගලමින් ගම් නියම් ගම් විනාශ වන බවයි. එමෙන්ම මිනිසුන් අධාර්මික වන විට කලට වැසි නොවසී. අකල්හි වැසි වසී. අස්වැන්න විනාශ වේ. ලෙඩ රෝග හට ගනී. පරිසරය විකෘති වේ යනුවෙන් බුදුරජාණන් වහන්සේ අංගුත්තර නිකායෙහි දේශනා කර ඇත.

ඒ අනුව මිනිස් චර්යා හා පරිසරය අතර දැඩි සබඳතාවක් ඇති බවත් මිනිසාගේ පැවැත්මට භෞතික පරිසරය අත්‍යවශ්‍ය සාධකයක් බව පැහැදිලි වේ. මිනිසා පරිසරයට අනුගත විය යුතුය. පරිසරයේ පැවැත්ම රඳා පවතින්නේ මිනිස් චර්යාවෙනි.

මේ නිසා බුදුසමය පරිසරයට ආදරය කරන්නට කරුණාව දක්වන්නට, ගුණධර්ම ප්‍රගුණ කිරීමට පමණක් නොව අල්පේච්ඡ වෙමින් පමණ දැන ආහාර ගැනීමට යථාලාභ සංතෝෂය ඇතිව මූලික අවශ්‍යතාව පරිසරයට හානි නොවන ලෙස සපුරා ගනිමින් ජීවත් වීමට බුද්ධ දේශනාවන්හි පෙන්වා දෙයි.

ඒ අනුව භෞතික පරිසරය මිනිසාගේ පැවැත්ම තහවුරු කරයි.

**පංචශීල ප්‍රතිපදාවේ පළමු වැන්නද ප්‍රාණඝාතයෙන් වැළකීම වේ. දැක්කාවූද නොදැක්කාවූද (දිට්ඨාවායේව අද්දිට්ඨා), දිග වූද මහත්වූද (දිගාවායේ මහන්තාවා) ආදී ලෙස සියලු සත්වයන්ට මෙත් වැඩීමට බුදු සමය උගන්වයි. ශාක හා සතුන් පමණක් නොව ජල සම්පත රැකගැනීම පිණිස ද බුදුසමය කරුණු පෙන්වා දෙයි.**

**ඒ.ජී.හර්ෂණී ප්‍රභා කුමාරි
කැලණිය විශ්ව විද්‍යාලය
ජනසන්නිවේදන අධ්‍යයන අංශය**

## ධම්ම පද ගීතය

("පණ්ඩිත වග්ගය" 81.6 - 83.8 ඇසුරිණි)

### "නැණ පව්ව"

මහා විලක් සේ
ගැඹුරුයි නිමලයි....
කැළඹිල්ලක්.. නෑ....නෑ....
මහා මෙරක් සේ
නිහඬයි නොසැලෙයි
ලතැවිල්ලක්... නෑ..... නෑ...
සඳහම් අනුදත් නැණැති දනා.....

සැප සම්පත් ලුහුබැඳ
නෑ.... යන්නේ.....
දුක සැප මැදහත් සේ
ඉවසන්නේ....
ඉසුරු සැපත් පොදි
වැඩි කර ගන්නට
චාටු බසින් නෑ දන
රවටන්නේ.....

අදමින් දන සම්පත්
අරගන් නෑ....
අදමින් පව්කම්වල
නියැලෙන් නෑ...
සිල්වත් ගුණවත්
සුවඳ හමායන,
මහ පැණසර මිණි පව්වක්
වේ ඔහු....

*පී.එම්. අහංගම*

# " සිල්වත් ගුණවත් උතුමන්ට දැහැමින් උපයාගත් දෙයින් දන් දෙන්න"



යම් පුද්ගලයෙකු විසින් මහත්ඵල මහානිසංස ගෙන දෙන දානයක් පිරිනැමීමේදී ඔහුට තිබිය යුතු ත්‍රිවිධ දාන සම්පත්ති අතුරින් චිත්ත සම්පත්තියත් ඒ අතරට පූර්ව චේතනාව, මූඤ්චන චේතනාව සහ අපර චේතනාව ගැනත් අපර චේතනාව කිළිටි කරගත් අපුත්තක සිටුතුමාගේ කතාවෙන් ඒ ගැන අවබෝධ වන්නට ඇති.

යම් පුද්ගලයෙක් විසින් තවත් පුද්ගලයෙකුට යමක් දීමට නම් තමා සතු දෙයක් තිබිය යුතුයි. එහෙම නැතුව යමක් තව කෙනෙකුට දෙන්නේ කෙසේද? හැබැයි හොරකම් කරල නම් දන් දෙන්නත් හොඳ නැහැ.

ඇත්තෙන්ම අපි දානයක් සඳහා යොදාගන්නා මිල මුදල්, දානයට ගන්නා හැම දෙයක්ම හැම අතින්ම පිරිසිදු වූ ධාර්මික වස්තුවක් විය යුතුයි. එසේ තිබෙන පුද්ගලයාට ත්‍රිවිධ දාන සම්පත්තියේ වත්ථු සම්පත්තිය තිබෙන බවට සැක නැත.

එසේ නොවී හොරමැරකමින්, නොයෙක් වංචා කරමින්, අල්ලස් ගැනීමෙන්, දුරාචාරයේ හැසිරෙමින් මුදල් සපයා ගැනීමෙන් දෙන දානය තුල වත්ථු සම්පත්තිය හෝ පිරිසිදු ධාර්මික බවක් නැත.

බුදු දහමෙහි සඳහන් අන්දමට සතුන්, ආයුධ, මස්, සුරා, විෂ යහපත් කර්මාන්ත නොවන වෙළදාම් පහෙන් උපයාගනු ලබන ධනයෙන් හෝ නීති විරෝධී මාර්ග වලින් උපයන ධනයෙන් දානයක් නොදිය යුතුය.

එසේ නම් පිරිසිදු දාන ධාර්මික වස්තුවක් වන්නේ කුමකින්ද?

ධාර්මික වස්තුව යනු තමන්ගේ මහන්සියෙන් දැහැමි ආකාරයෙන් උපයාගත් වස්තුවකි. නිවැරදි වෙළදාමෙන්, දැහැමි ගොවිතැනින්, යහපත් කර්මාන්ත වලින් සහ නීති ගරුක අවංක රාජ්‍ය සේවයෙන් උපයාගන්නා ධනයයි. යමෙක් විසින් ගන්නා වැටුපට සරිලන සේවයක් නොකරන්නේ නම් එතන ඇත්තේද සොරකමකි. ඔබ එසේ නොවනු ඇත. පෙර රජ දවසේ පැරණි රජවරු තමා සතු කොපමණ ධනය තිබුණත් දානයක් දීමට චිත්ත සම්පත්තිය ලැබුන කල්හි වත්ථු සම්පත්තියද ධාර්මික කරගැනීම සඳහා තමාගේම ශ්‍රමය, දහඩිය වැයකර ධනය උපයාගත් බවට සාක්ෂි ඇත.

කොපමණ ධනය තිබුණත් තමාගේම ශ්‍රමයෙන් උපයාගත් ධනයෙන් දානයක් පිළිගැන්වීමට සිතූ මහාචූළි මහා තිස්ස රජු කිසිවෙක් නොදන්නා නොහඳුන ඈත ප්‍රදේශයකට ගොස් වෙස්වලාගෙන කුලියට ගොයම් කපා එයින් උපයාගත් මුදලින් මහාසුම්ම තෙරුන්ට පිණ්ඩපාතය පූජා කළ බවත් එලෙසම තුන් අවුරුද්දක් උක්සකුරු කම්හලක වැඩ කරමින් එයින් උපයාගත් මුදලින් මහා සංඝයා වහන්සේලාට උක්සකුරු පූජා කළ බවත් මහාවංශයෙහි සඳහන් වෙයි.

ධාර්මික දාන වස්තුව වැඩි වටිනාකමකින් යුක්ත වන්නට අවශ්‍ය නැත. එසේ පිළිගැන්වීමක්ද නැත. අධාර්මිකව උපයාගත් විශාල ධනයක් වැයකර දුන්නත් ඒ දානය මහත්ඵල මහානිසංස නොවේ තමාසතුව ඇති වටිනාකම ඉතාම අඩු අල්පමාත්‍ර දෙයක් වුවද එය ධාර්මික වස්තුවක් නම් එය දන්දීමෙන් ලැබෙන විපාකවල කිසි අඩුවක් නොවනු ඇත. මෙය කියවන ඔබට මෙම කරුණු පහසුවෙන්ම අවබෝධවීම සඳහා සද්ධර්මාලංකාරයෙහි දූතිය ජයම්පතිකා වස්තුවේ එන කතාව මෙසේ කියන්නම්,

## දුගී පවුලක් දුන් දානය

එක්තරා දුගී පුරුෂයෙක් තමාගේ භාර්යාව සමඟ කමත්වල බොල්වී පොළමින්, පිදුරු සොලවමින් මහත් වූ දුකින් උත්සාහයෙන් ජීවත් විය. තමන්ට මේ දුක ඇතිවූයේ තමන් පෙර සංසාරවල පින් නොකල නිසා බව සිතා සිටිමින්ම තමන් කසගින්නේ හෝ සිට කොහොමහරි භික්ෂූන් වහන්සේට දානයක් දිය යුතු බව සිතා ඒ දුගී පුරුෂයා තම බිරිඳ සමඟ තැන්තැන්වල ඇවිද සහල් සපයාගෙන බත් පිළියෙල කර පලා මාළුවක් සමඟ බත් ටික දානයක් ලෙසට අරගෙන භික්ෂූන් වහන්සේ වැඩවසන ආරාම සමීපයට ගොස් දන ශාලාව තුළට යාමට ලැජ්ජාවෙන් තමන් විසින් ඉතාමත් මහන්සියෙන් දුකසේ සපයා සකසාගෙන ගිය දානය වැළඳීම සඳහා භික්ෂූන් වහන්සේට කෙසේ පිළිගන්වමු දැයි කනස්සල්ලෙන් යුතුව භික්ෂූන් වහනසේට පෙනෙන තෙක් මානයේ සිටගත්තේය. ඒසේ ලැජ්ජාවට පත්වූයේ තමන් ඉතා දුප්පත් බැවින් සම්පූර්ණයෙන් විලිවසාගැනීමටවත් රෙදි කඩක් නොතිබීමෙන් අඩක් වසාගෙන සිටි බැවිණි.

**" හොරමැරකමින්, නොයෙක් වංචා කරමින්, අල්ලස් ගැනීමෙන්, දුරාචාරයේ හැසිරෙමින් මුදල් සපයා ගැනීමෙන් දෙන දානය කුල වත්ථු සම්පත්තිය හෝ පිරිසිදු ධාර්මික බවක් නැත "**

එම දාන ශාලාවෙහි වැඩහුන් මහ තෙරුන් වහන්සේ රහත්තෙර නමක් විය. උන්වහන්සේ දුර සිටිනා දුප්පත් දෙමාල්ලන් දැක ඔවුන් කෙරෙහි අනුකම්පාවෙන් ඒ දෙදෙනා රැගෙන ආ බත් හා පලා මාළුව පිළිගෙන අනිත් තෙරුන් වහන්සේලාටද පිළිගන්වා තමන් වහන්සේද වැළඳූ සේක. දාන චේතනාව පිරිසිදු නම් එය වැඩි වටිනාකමකින් යුක්ත හෝ අඩු වටිනාකමකින් යුක්ත බව සැළකිල්ලට ගත යුතුද නැත.

## පටිග්ගාහක සම්පත්තිය

පටිග්ගාහක සම්පත්තිය නමින් හඳුන්වනු ලබන්නේ දානය ලබන අයගේ පිරිසිදු බවයි. පටිගහක ග්‍රාහක ලාභයද එයයි. උසස් ගුණවත්, සිල්වත් පිරිසකට දෙන දානය මහත්ඵල මහානිශංස වන බවත් අදහස් කරයි. අප විසින් කවර පුද්ගලයෙකුට වුවත් දානයක් හැටියට දෙනවානම් එයින් අපට පිනක් අත්වෙනවා හැබැයි අප දානයක් දෙන්නේ සීලයෙන් ගුණයෙන් වැඩි අයටනම් පෙරට වඩා පිනක් අපට අත්වෙනවා.
තෙ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා එතෙසු දින්නානි මහප්ඵලානි" යනුවෙන් ප්‍රකාශ වන්නේ බුද්ධ ශ්‍රාවකයන්ට දෙන දානය මහත්ඵල ගෙන දෙන බවයි.

දන් දෙන්නාවූ සැදැහැවතුන් විසින් ත්‍රිවිධ චේතනාවම සිරිසිදු කරගෙන සිල්වතුන් හැඳිනගෙන දුන් දානයෙත් එසේ හඳුනානොගෙන කාට හෝ දීමට සිතා දුන් දානයෙත් වෙනස එයින් ලැබෙන විපාකයන්ගේ වෙනස දක්වනු පිණිස අංකුර ඉන්දික කථා වස්තුව මෙසේ දක්වමි.

අප සර්ඥයන් වහන්සේ තව්තිසා දෙව්ලොවට වැඩ පාණ්ඩුකම්බලශෛලාසනයෙහි වැඩ හිඳ දෙවියන්ට අභිධර්ම දේශනාව අරම්භකිරීමට සූදානම්වන මෙහොතෙහි අංකුර හා ඉන්දික නම් ඇති දිව්‍ය පුත්‍රයන් දෙදෙනා කල් ඇතිවම එහි පැමිණ බුදුරජාණන් වහන්සේගේ වම හා දකුණු දණ මඬල ලඟම වාඩි වූහ. බුදු රඳුන් ධර්ම දේශනාවට වැඩි බව ඇසූ දස දහසක් සක්වල දේවතාවෝ එහි රැස්වන්නට පටන්ගත්හ. මහානුභාව ඇති දෙවිවරු පැමිණෙන්නට පටන්ගත්හ. මහානුභාව ඇති දෙවිවරු ඔවුන්ට ඉඩ දීමෙන් පසු පස්සට ගියාහුය. අංකුර දිව්‍ය පුත්‍රයා දොළොස් යොදුනක් තැන් පසු බැස ගොස් නතර වූ අතර ඉන්දික දිව්‍ය පුත්‍රයා හුන් තැනින් මඳක් හෝ පසු නොබැස බුදුරඳුන්ගේ දණ මඬල ළඟම හුන්නේය.

එකල්හි බුදුරජාණන් වහනසේ මේ දෙදෙනාගේ පූර්ව චරිත දන්නා නිසා අංකුර දිව්‍ය පුත්‍රයා අමතා අංකුර ඔබ දසදහසක් අවුරුදූ පුරාම මුළු දඹදිවම යාචකයන්ට දන් දුන්නේ නොවේද? දූන් මේ දිව්‍ය සභාවට පැමිණ දොළොස් යෙදුනක් දුර හිඳින්නේ ඇයිද"යි විමසූ සේක. එකල්හී අංකුර තෙම කියනුයේ ස්වාමීනි මම මුළු දඹදිව යාචකයන්ට දස දහසක් අවුරුදූ පුරා දන් දුන්නත් එකම සිල්වතෙකුටවත් ඒ දානය නොලැබුණේය. මා ලද සුළු පිනෙන් මේ දිව්‍ය සම්පත් ලදිමි. එහෙත් මද ආනුභාව ඇති හෙයින් මෙසේ දොළොස් යොදුනක් දුර සිටිමි" කීය. එකල්හි බුදුරජාණන් වහන්සේ තමන් සමීපයෙහි හුන්නා වූ ඉන්දික අමතා ඔබ කවර නම් පිනක් කොට මෙබඳු මහානුභාව සම්පන්න දිව්‍ය සම්පත්තියක් ලැබුයෙහිද"යි විමසූ සේක.

ස්වාමීනි මම පෙර දුගියෙකුව ඉපිද සිඟාගත් බත් හැන්ද අනුරුද්ධ මහා තෙරුන් වහන්සේට පූජා කළ පිනෙන් මෙබඳු මහානුභාව සම්පන්න දිව්‍ය සම්පත්තිය ලද හෙයින් ඔබ වහන්සේ ළඟම සිටියෙමි"යි පිළිතුරු දුන්නේය. බුදුරජාණන් වහන්සේ එබස් අසා අංකුර ඔබ ඒ දුන් දානයට වඩා ඉන්දික දන්දුන් එක බත් හැන්ඳ අනුරුද්ධ තෙරුන්ට පූජා කළ හෙයින් මහත්ඵල ලැබූහ" වදාළ සේක.
පිළිබඳ දැනගනිමු.

ලලිතා හෙට්ටිආරච්චි
දේවහූව.

# බෞද්ධ දර්ශනයේ ශ්‍රේෂ්ඨත්වය



ක්‍රි.පූ. 6 වන ශතවර්ෂයේ භාරතය ගැන සලකා බැලීමේදී එය "දිට්ඨී ගහනං දිට්ඨී කාන්තාරං" දර්ශන වලින් ගහණ වූ දර්ශන කාන්තාරයක් ලෙස හැඳින්විය හැකිය. බ්‍රහ්මජාල සූත්‍රයේ මිසදිටු ආගම් 02ක් ගැන සඳහන් වේ. මෙම සෑම ආගමක්ම දර්ශනයක්ම අභිබවනය කරමින් ඉතා කෙටි කාලයක් තුළදී බෞද්ධ දර්ශනය භාරතීය සමාජයේ මුල්බැස ගන්නා ආකාරය දක්නට ලැබේ.

සමකාලීන අනෙක් ආගම්වලින් වෙනස් වූ දර්ශනයකි. බෞද්ධ දර්ශනය දර්ශනයේ ශ්‍රේෂ්ඨත්වය පමණක් නොව එම නවතම දර්ශනය ඉදිරිපත් කළ බුදුපියාණන් වහන්සේ සතුව පැවති දෙතිස් මහා පුරුෂ ලක්ෂණ වලින් සමන්විත වූ මහා පෞරුෂයක් උන්වහන්සේ සතුව පැවතිනි. මහා කරුණාව වැනි උතුම් වූ මානුෂීය ගුණාංගත් භාරතීය සිත් ඇදගැනීමත් දර්ශනය ව්‍යාප්ත වීමට හේතු වූ සාධකයන්ය.

බුද්ධකාලීන භාරතයේ පැවති බොහෝ ආගම් නිර්මාණවාදය මත පදනම් වූ ආගම්ය. එදා භාරතයේ පැවති ප්‍රබලම ආගමක් වූ බ්‍රාහ්මණ ආගමේ පදනම නිර්මාණවාදයයි. ලෝකය මැවීමත් මිනිසා මැවීමත් සමාජ ක්‍රමය මැවීමත් යන සියල්ලම මහා බ්‍රහ්මයා අතින් සිදුවූ බව එහි සඳහන් කර ඇත. ඍග්වේදයේ 10 වන මණ්ඩලයේ එන 90 වැනි පුරුෂ සූත්‍රයෙන් හෙළි වන ආකාරයට,

*බ්‍රාහ්මණෝසස මුඛවාසීන්*
*බාහු රාජනඃ කෘතඃ*
*ඌරු තදසස යද් වෛශ්‍යඃ*
*පද්භ්‍යාම් ශූද්‍රා ආජායත*

මහා බ්‍රහ්මයාගේ මුවින් බ්‍රාහ්මණ මණ්ඩලයද දෙබාහුවෙන් ක්ෂත්‍රිය මණ්ඩලයද කලවා වලින් වෛශ්‍ය මණ්ඩලයද පා වලින් ශුද්‍ර මණ්ඩලයද උපන් වූ බව පෙන්වා දී ඇත. සියල්ලම මහා බ්‍රහ්මයාගේ තීරණය මත සිදුවන බව පවසා උතුම් මිනිසා අකර්මණ්‍ය අචේතනික වස්තුවක් බවට පත්කර ඇති ආකාරය දක්නට ලැබේ.

නමුත් මිනිසාට පමණක් නොව තිරිසන්ගත සත්වයාට පවා එක හා සමානව සැලකූ බෞද්ධ දර්ශනයේ (සබ්බේ සත්ථා භවන්තු සුඛිතත්තා) කේන්ද්‍රය වන්නේ මිනිසාය. මිනිසාගේ සිතය. එහි නිර්මාණවාදයට ඉඩක් නැත.

කවදාවත් නොදුටු මහා බ්‍රහ්මයෙකු ගැන විශ්වාස කිරීම, නොදුටු අයෙකුට ආදරය කිරීම නුසුදුසුයැයි බුදුන් වහන්සේ දේශනා කර ඇත. උන්වහන්සේ එක් අවස්ථාවක දේශනා කළේ "බ්‍රහ්මාති භික්ඛවේ මාතා පිතු ඵේතං අධිවචතං" යනුවෙනි.

එයින් පැහැදිළි වන්නේ බෞද්ධ දර්ශනයේ බ්‍රහ්ම යනුවෙන් හඳුන්වාදී ඇත්තේ උතුම් පුද්ගලයින් බවයි. මෙසේ බෞද්ධ දර්ශනය නිර්මාණවාදය ප්‍රතික්ෂේප කරන අතර එය හේතුඵලවාදීය. එයින් පෙන්වන්නේ යහපත් ක්‍රියාවන්ට යහපත් ප්‍රතිඵල ලැබෙන බවත් අයහපත් ක්‍රියාවන්ට (පාපී ක්‍රියා) අයහපත් ප්‍රතිඵල ලැබෙන බවත්ය.
"යාදිසං වපතේ බීජං තාදිසං හරතෙ ඵලං" (යම්සේ බීජ වැපුරුවේද එයට අනුව ඵල ලැබන්නේය)

මේ මගින් මිනිසා අකර්මන්‍ය කිරීම වළක්වා ඇත. ඔහුට උත්සාහයෙන් කටයුතු කිරීමට ඉඩ සලසා ඇත. ලෝකයේ පහළ වූ විවිධ ආගම් අතර මිනිස් වර්ගයාගේ ස්වභාවය ඔහුගේ සිතේ ස්වභාවය මතට සිදුවන බව බෞද්ධ දහම අවධාරණය කරයි.

පිරිසිදුකම හෝ අපිරිසිදුකම විමුක්තිය හෝ භෞතික හා ආධ්‍යාත්මික බැඳීම මිනිස් සිත හා සම්බන්ධ බවත් මිනිසාගේ මැවුම්කරු මිනිසාම බවත් (මිනිසාගේ සිත බවත්) මූලික බුදුසමය මනාකොට පැහැදිළි කරයි. මිනිස් සිතේ ස්වභාවය පිළිබඳව කළ දේශනා දර්ශනය පුරාම දක්නට ලැබේ.

*මනෝ පුබ්බංගමා ධම්මා මනෝ*
*සෙට්ඨා මනෝමයා*
*මනසා චේ පදුට්ඨේන භාසතිවා*
*කරෝතිවා*
*තංතං නං දුක්ඛ මන්වෙති*
*චක්කංව වහතෝ පදං"*
(ධම්ම පදය 1 සහ 2)

*පභස්සර මිදං භික්ඛවේ චිත්තෙං*
*තංච ඛො ආගන්තුකෙහි*
*උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං"*
(අංගුත්තර නිකාය 12)

*චේතනාහං භික්ඛවේ කම්මං වදාමි*
*චෙතයිත්වා කම්මං කරෝති කායෙන*
*වාචා මනසා"*
(අංගුත්තර නිකාය 1.103)

මුළු ලෝකයම සිතමත පිහිටා ඇති ආකාරය, චිත්තේන නියතී ලෝකෝ' යන පාඨයෙන් හෙළිවේ. බෞද්ධ දර්ශනය මෙන් සිත පිළිබඳව විග්‍රහ කළ වෙන කිසිදු ආගමක් නැත. ඉහත මා විසින් සඳහන් කළ බුද්ධාගම හා සමකාලීන අනෙක් සියල්ලම පාහේ අන්ත 02ක එල්බගත් ඒවාය.
එනම්,

- කාමසුඛල්ලිකානුයෝගය
- අත්තකිලමතානුයෝගය

යන අන්ත දෙකයි. මෙහිදි පළමුවැන්න නම් සැපෙහි ඇලී ගැලී විසීමත් දෙවැන්න ශරීරයට අපමණ දුක්දීමත් අර්ථවත් වෙයි. බුදුපියාණන් වහන්සේ සිය ප්‍රථම ධර්මදේශනාවෙන්ම අවධාරණය කළ සේක,

*"ද්වේ මෙ භික්ඛවේ අන්තා*
*පබ්බජිතේන*
*න සේවිතබ්බා යෝ වායං*
*කාමේසු*
*කාමසුඛල්ලිකානුයෝගෝ,*
*හීනෝ ගම්මෝ පොථුජ්ජනිකෝ*
*අනරියෝ. අනත්ථසංහිනෝ,*
*යෝ වායං අත්තකිලමතානු*
*යෝගෝ දුක්ඛෝ අනරියෝ,*
*අනත්ථසංහිනෝ.*
*ඒතේ තේ භික්ඛවේ උභෝ*
*අන්තේ අනුපගම්ම මජ්ජේමා*
*පටිපදා තථාගතේන*
*අභිසම්බුද්ධා. චක්ඛුකරණී,*
*ඥාණකරණී, උපසමාය,*
*අභිඤ්ඤාය, සම්බෝධාය,*
*නිබ්බාණය සංවත්තති"*
යන්නයි.

එනම්, මහණෙනි, පැවිද්දහු විසින් සේවනය නොකටයුතු අන්ත හෙවත් කෙළවරවල් දෙකක් ඇත. ඒ දෙක නම්, හීනවූ ග්‍රාම්‍ය වූ පෘථග්ජනයන් විසින් සේවනය කරනු ලබන්නා වූ අනාර්ථ වූ අනර්ථ සන්නිශ්‍රිත වූ කාමසුඛල්ලිකානු යෝගයද දුක්වූ අනාර්ථ වූ අනර්ථසන්නිශ්‍රිත වූ අත්තකිලමතානුයෝගයද යන මේ දෙකයි.

මහණෙනි, මේ ඉහත කී අන්ත දෙක හැර දමා නුවණැස පිරිසිදු කරන ඥානය පහළ කරන කෙලෙස් දුරුකරනු පිණිස පවතින නිර්වාණය සාක්ෂාත් කිරීම පිණිස පවතින මධ්‍යම ප්‍රතිපදාව තථාගත වූ මා විසින් අවබෝධ කරන ලදී." යන්න ධම්මචක්කපවත්තන සූත්‍රාන්ත දේශනාවෙහිදී දේශනා කර ඇත.

සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය බවත් අනිත්‍ය දේ නිත්‍ය ලෙස ගැනීමෙන් දුක ඇතිවන බවත් එනම් අනිත්‍ය තුළ ඇත්තේ දුක බවත් (යද නිච්චං තං දුක්ඛං( ආත්මීය වශයෙන් ග්‍රහණය කර ගැනීමට කිසිවක් නොමැති බවත් බෞද්ධ දර්ශනයේදී අවධාරණය වේ.

මුළු ලෝකයම දුක මත පිහිටා ඇත. "දුක්ඛෝ ලෝකෝ පතිට්ඨිතෝ" මෙම සචේතනික අචේතනික ලෝකධාතුවේ අනිත්‍ය ස්වභාවයන් එහිදී හටගන්නා දුකක් පිළිබඳව නිතරම දේශනාකොට ඇත.

*"ඉදං ඛෝ පණ භික්ඛවේ,*
*දුක්ඛං අරියසච්චං,*
*ජාතිපි දුක්ඛා,*
*ජරාපි දුක්ඛා,*
*ව්‍යාධිපි දුක්ඛෝ,*
*මරණම්පි දුක්ඛං,*
*අප්පියේහි සම්පයෝගෝ*
*දුක්ඛෝ,*
*පියේහි විප්පයෝගෝ දුක්ඛෝ,*
*යදනිච්චං න ලබති තම්පි දුක්ඛං,*
*සංඛිත්තේන*
*පඤ්චුපාදනක්ඛන්ධා දුක්ඛා"*

චතුරාර්‍ය සත්‍ය තුළ දුක, දුකට හේතුව හා දුක නැති කරන මාර්ගය ගැන සඳහන් වේ. මෙම දුකට හේතුව තෘෂ්ණාවයි. (තවත් විටක අවිද්‍යාවද දුකට හේතුවක් ලෙස පෙන්වා දී ඇත) තෘෂ්ණාව, කාම තෘෂ්ණාව, භව තෘෂ්ණාව හා විභව තෘෂ්ණාව ලෙස තුන්වැදෑරුම්ය. මෙම තෘෂ්ණාව නැතිකිරීමෙන් දුක නැතිකළ හැකිය.

"තණ්හක්ඛා යො සබ්බං දුක්ඛං ජිනාති" දුක, දුකට හේතුව, දුක නැති කිරීමේ මාර්ගය වන්නේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි. එමගින් නිර්වාණය ලබාගත හැකිය. පරම සුඛය වන්නේ නිර්වාණයයි. "නිබ්බානං පරමං සුඛං" එහිදී නැවත ඉපදීමක් නැත. එය ශාන්තය. යමක් ශාන්තද එය ප්‍රණීතය. "යන්තං සන්තං ඒතං පණිතං" යනු බුද්ධ දේශනාවයි. එය අවබෝධය පිණිසය.

**ශාස්ත්‍රපති රුවන් ජයවීර**


පඤ්ඤාසිය ජාතක කතා පොතෙහි ඇති... සෙට්ඨිපුත්ත ජාතකය ඇසුරෙනි
ප්‍රථම වෛරය
සැකසුම. චිත්‍ර: ජාලිත සුදු ආරච්චි
4
මොකද දරුවෝ මේ කෑ ගහන්නේ... අඬ...
අනේ ආත්තම්මේ මටත් වළලු අරං දෙන්නකෝ
දරුවෝ වළලු ගන්න.. අපට කොයින්ද කාසි.. අපි බාලු බෙහෙ වර කරල විදුවෙල හොයා ගන්නෙ අපි ජීවත් වෙන්නයෝ
කෑ නොගහ නිහඬ සෙල්ලමක් කරල.. ගන්න දරුවෝ.... කිවුලට වෙලා...
ඕං.. ඊයේ දං බැස්සෙ දුර වැදී වැදී පරණ වලකඩ කාරු තැටියක් ..තිබුන නේද..
වලන්න බිඳුනි.. ඒකවත්
ආත්තම්මේ.. අර දං බැස්සෙ තියෙන්නේ.. පරණ වළකඩ කාරු තැටියක්.. අපි ඒකවත් දීල වළලු ගමු.. ආත්තම්මේ
අපොයි.. මේ දැරිවිගෙ වදේ...
ඒ කුඩා දැරිය වළං බැස්සේ තිබූ දුම් බැඳුනු පරණ තැටිය අතට ගත්තේය.
මේ තියෙන්නෙ මේක ටිකක් පිහිදල දුන්නම මට වළලු ටිකක් ගන්නැකි..
අනේ ආත්තම්මේ මේ පරණ තැටියවත් දීල මට වළලු අරං දෙන්නකෝ
අපොයි මේ කෙල්ලගෙ තියෙන වදයක් කෝ.. වලන්න දරුවෝ.... මෝකට බය ඇලුත්.. ලස්සන වළලු දේවිද..
ඕං දරුවෝ බය වෙලා ඉන්දැට බොහාට කථා කරන්න.. මම නම් හිතන්නෑ.. මෝකට වළලු දේවි ....කියලා....
ඕං.. මේ.... වළලු.... ...වළලු..

7 පිටුවෙන්...

## නිවන් මඟ

# නියත වීමට නම්...

ඉමේ ඛො ආවුසො විසාඛ, පඤ්චුපාදානක්ඛන්ධා සක්කා වුත්තො භගවතාති.

විශාඛයෙනි, භාග්‍යවතුන් වහන්සේ පංචඋපාදානස්කන්ධයට සක්කාය යයි දේශනා කරති.

කය හා සිත එකට පරිබද්ධයි. කය වැඩ කරන්නේ හිතක් හටගත්තොත් පමණී. ඒ හිත හටගැනීමට කය උපකාරී වේ. ලෝකය හෙවත් සිත ක්‍රියාකිරීමට කය අත්‍යාවශ්‍යය. මේ දෙකේ එකතුව සංඛාර ගොඩකි. සමූහයකි. පුංජයකි. හේතුවක් නිසා හටගත් ස්වභාව ධර්මයකි. ශක්ති සමූහයක ප්‍රවර්තනයකි.

වේගයක් නිසා ශක්තියක් හටගනී. ශක්ති හතරක සාමූහිකත්වය රූපයකි. රූප දෙකක් එකතුව විඤ්ඤානයාගේ ප්‍රකට වීමයි. විඤ්ඤානය හටගත් වහාම නාම ධර්ම ප්‍රකට වේ. සමූහිකව ප්‍රවර්තනය වන ශක්ති සමූහයක ඇතිවෙමින් නැති වෙමින් පවතින ග්‍රහවස්තුවක් වේ.

මෙයට සතා, පුද්ගලයා, මම, දෙවියා, බ්‍රහ්මයා වශයෙන් පනවාගෙන පුද්ගල ආරෝපණයක් පනවා ගැනීමක් තරයි. ඒ ලෝක සම්මුතිය වේ. මේ සම්මුතිය නිත්‍ය, සැප, ආත්ම වශයෙන් අනවබෝධයෙන් වැරදි පිළිගැනීම දුෂ්ටි ගතවීම එල්බගැනීම සක්කාය දිට්ඨි වශයෙන් හඳුන්වයි.

රූපය යනු ස්වභාව ධර්මයත් ශක්තීන්ට ආවේණික ක්‍රියාකාරකමක්. වේගයක් නිසා හටගත් දෙයක්. මේ දැනුවත් බව නැති නිසා රූප උපාදානය වේ.

වේදනාව කියන්නේ ස්වභාව ධර්මයක්. හේතු ප්‍රත්‍යයන් නිසා හටගත් දෙයක්. ඊට ආවේණික ක්‍රියාකාරකම් සිදුවීම ස්වභාවිකයි. නොදැනුවත්බව නිසා වේදනා උපාදානය කරගනී.

සංඥාව කියන්නේ ස්වභාව ධර්මයක්. හේතු ප්‍රත්‍යයන් ගෙන් හටගත් දෙයක්. ඊට ආවේණික ක්‍රියාකාරකම් සිදුවීම ස්වභාවිකයි. එහි යථාර්ථය ගැන නොදැනීම, නොදැනුවත් බව නිසා සංඥා උපාදානය කරගනී.


සංඛාර යනු ස්වභාව ධර්මයකි. හටගත්තා වූ අර්ථයෙන් ක්‍රියාකාරක අර්ථයෙන් සංඛාර නම් වේ. හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් දෙයකි. ඊට ආවේණික ක්‍රියාකාරකම් එහි විද්‍යාමාන වේ. මේ යථාර්ථය නොදැනීම නිසා සංඛාර ධර්ම උපාදානය කරගනී.

විඤ්ඤානය යනු ස්වභාව ධර්මයකි. සත්වයා සම්බන්ධව විද්‍යාමාන වන ආයතන හෙවත් ස්වභාව ධර්මයන් ඇසුරු කරගෙන ප්‍රකට වන තවත් ස්වභාව ධර්මයකි. යථාර්ථය හෙවත් ප්‍රකෘතිය මූලස්වභාවය ගැන නොදැන ගැනීම නිසා විඤ්ඤාන උපාදාන ස්කන්ධය හටගනී.

මේ පංච උපාදානස්කන්ධයම ස්වභාව ධර්මයකි. පඨවි ආදී මූල ශක්ති පදනම් ව ප්‍රකට වන්නාවූ, විද්‍යාමාන වන්නාවූ ස්වභාව ධර්මයේ ක්‍රියාකාරිත්වයකි. විදසුන් නුවණින් මේ බව නොදැනීම නිසා නොවෙනස්ව පවත්නාවූ සතෙක් පුද්ගලයෙක් මමෙක් පනවාගෙන නිත්‍ය සැප, ආත්ම සංඥාවෙන් දුෂ්ටි ගතවීම සක්කාය දිට්ඨිය වේ.

අත්දැකීම, විඳගැනීම, හැඳිනගැනීම, ක්‍රියාකාරකම් සළායතන සම්බන්ධයෙන්

# රළු වචන කීමේ විපාකය ලැබූ භික්ෂුව



අප බුදුරජාණන් වහන්සේගේ කාලයේදී කෝකාලික නුවර ඉසුරුමත් කෝකාලික නම් සිටුවරයෙක් විය. ඔහුට කෝකාලික නම් පුත්‍රයෙක් විය. ඔහු සසුනෙහි පැහැදී පැවිදිව සිය පියා විසින් කරවා දෙන ආරාමයෙහි මහන දම් පුරමින් වැඩ වාසය කරයි.

දිනක් මෙම කෝකාලික භික්ෂුව බුදුන් වහන්සේ වෙත ගොස් සැරියුත් මුගලන් දෙනමට පවිටු අදහස් ඇති අයගේ වසඟයට ගොස් වාසය කරති යයි අවමන් කර කීවේය. බුදුරජාණන් වහන්සේ එය අසා කෝකාලික එසේ කියන්ට එපා සැරියුත් මුගලන් තෙරුන් වහන්සේ කෙරෙහි සිත පහදවා ගන්න. සැරියුත් මුගලන් දෙනම ප්‍රියශීලයෝයයි වදාරන ලදී. එය ඇසූ කෝකාලික භික්ෂුව මෙසේ කීවේය. ස්වාමිනි, භාග්‍යවතුන් වහන්ස, විශ්වාස කළ හැක්කේය ඇදහිය යුතු කථා ඇත. එසේ වුවත් සැරියුත් මුගලන් දෙනම පවිටු අදහස් ඇතියහ. පවිටු අදහස් ඇතියවුන් ගේ වසඟයට ගොස් වාසය කරති. දෙවනුවත් රළු වචන කියා අපහාස කළහ. බුදුන් වහන්සේ තුන්වන වද අවවාද කර රළු වචන කීම නවත්වන්නට නොහැකි විය. මෙසේ කෝකාලික භික්ෂුව සැරියුත් මුගලන් දෙනමට රළුවචන කියා අපහාස කොට එතැනින් නැගිට බුදුරජාණන් වහන්සේට වැද යන්ට ගියේය. එසේ ගිය විට ටිකවේලාවකින් කෝකාලික භික්ෂුවගේ මුළු සිරුර පුරාම අබ ඇට පමණ ගෙඩි හට ගත්තේය. ඒවා ක්‍රමයෙන් ලොකු වී බෙලි ගෙඩි පමණ විය. ඒවා පුපුරා සැරව ද ලේද වැගිරෙන්නට විය. එම ගෙඩි හැදී මෙලොවදී බොහෝ දුක් විඳ කලුරිය කොට පදුම නරකයෙහි උපත ලැබීය. රළු වචන කීමේ විපාකය කෝකාලික භික්ෂුවට ලැබිණි.

කළුවච්චිමුල්ලේ
ධම්මරක්ඛිත හිමි

## රංගිරි ශ්‍රී ලංකා බොදු පැන විසඳුම් - (අන්තර්ජාල කලාපය ප්‍රශ්න අංක 04)

### පෙබරවාරි - නවම් මස පොහොය ප්‍රශ්නය:-

බොදු පැනයට පිළිතුරු එවා වටිනා දහම් පොත් පාර්සලයක් දිනාගන්න.

**04)සම්බුදු සසුනේ සඳහන් වන ප්‍රථම ශ්‍රාවකයාත්,අවසාන ශ්‍රාවකයාත් නම් කරන්න.**

කූපනය

නම : ..................................................

ලිපිනය : ..................................................

පිළිතුර : ..................................................

දුරකථනය අංකය :..................................................

දිනය : ..................................................

අත්සන : ..................................................

ඔබේ විසඳුම් තැපැල්පත්වල පමණක් ලියා **'රංගිරි ශ්‍රී ලංකා බොදු පැන විසඳුම්', රංගිරි ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය, අංක 130, නුවරපාර, දඹුල්ල.** යන ලිපිනයට **2020-02- 20 දිනට පෙර** එවිය යුතුය.

**ජයග්‍රාහිකයින් තෝරා ගැනීම කුසපත් ඇදීමෙන් තෝරා ගැනේ.**

සාහිත්‍ය

## සුරස අතිරේකය




# වියරු රැදු වදන් ඇසේය මිනිස් පුරවරින්...

මිනිස් කමට නම්බු නාම
දුන් මිනිස් මුවින්
මිනිස්කමට නිගා ගෙනෙන
වියරු රුදු වදන්
ඇසේය මිනිස් පුරවරින්

කල්පනා සොඳය මනුපුර
බෝසතුන් මවන තරමට
කල්පයේ දැවෙන සිත්නෙත්
නිවාලන ලෙසා
කප්තුරෙත් සැදෙයි පිළිලද
මල් මගෙත් සිටීත් දෙබරුද බල
සහසකුත් අසති දෙව්දත් දනන්ගේ මුසා...

පිල් හැපී අඬන මොනරුද
බිඳී තැවෙන කෙසරුද
කලියුගේ හොඳත් නොහොදයි
නිගා දෙනු අසා
නියගයත් වැසිත් සදන අහස සේම
විඳිමු ගැරහුම්
මුනිවරුත් බොරළු රළු මග
ඇවිද ගිය නිසා....

ගේය පද - වසන්ත කුමාර කොබවක
ගැයුම හා ස්වර - ආචාර්ය රෝහණ වීරසිංහ



ආචාර්ය රෝහණ වීරසිංහ



වසන්ත කුමාර කොබවක

ලොව වෙසෙන මිනිසුන් අතරින් කිසිවෙකුත් සම්පූර්ණයෙන් ම නිවැරදි පුද්ගලයෝ නොවෙති.
එමෙන් ම කිසිවෙකුත් සම්පූර්ණයෙන් ම නරක පුද්ගලයෝ නොවෙති.

එනම් සුදුත් නොවන කලුත් නොවන සුදු හා කලු විවිධ ප්‍රමාණයෙන් මිශ්‍ර වූ අළු පාට චරිතයන් ය අපට හමුවනුයේ. රහසත් පව් නොකරන පුද්ගලයන් වන්නේ බුදුවරු සහ රහතුන් පමණි. කෙලෙස් නොනැසූ සියලුම මිනිසුන් හොඳ නරක සුසංයෝගයකින් සැදුණු පුද්ගලයෝ වෙති.

ජීවිතයේ විවිධ අවස්ථා වල දී ප්‍රකට කරන්නා වූ හැසිරීම් අනුව "හොඳ" හෝ "නරක" යැයි පුද්ගලයින් ව නාමකරණය කෙරේ.
සිග්මන් ෆ්‍රොයිඩ් පවසන්නේ ද මිනිසා යනු සදචාරයට වසන්ව තම නොසන්සිඳෙන ආශාවන් යටපත් කරගත් ජීවියෙකු ලෙස ය ."මිනිස් හට සොඳුරු ගුණ හා නුගුණ ඇත, නිදොස් කෙනෙක් මෙදියත උපදනේ නැත"

යනුවෙන් සුභාෂිත කතුවරයා පවසන්නේ ද මිනිස් සිතේ ස්වභාවයයි. ගරු බුහුමන් කර පුද පූජා කළ හැකි උසස් වූ මනුසත් ගුණයම විටෙක මිනිස්කමට නොගැලපෙන පහත් ක්‍රියාවන්ගෙන් යුක්තවෙයි.

තම දෙමාපියන් පණ මෙන් රැක ගන්නා දූ පුතුන් මෙන්ම මව පියා මහළු මඩමක හෝ මහ මග අතරමං කර යන දරුවන්ද අද අපේ සමාජයේ බහුලව හමු වේ. මේ කෲරකම් සිදුවන්නේ වත්මන් සමාජයේ පමණක් යැයි පැවසුව ද රාජ්‍ය ලෝභිත්වයෙන් පියා මැරූ අජාසත්ත වැනි පුතුන් බුද්ධ කාලීන භාරතයේ ද විසූහ.

එනම් මිනිස් සිතේ කලු සුදු ස්වභාවය අතීත අනාගත වර්තමාන තුන් කාලයටම පොදු වූ මිනිස් ස්වභාවයක් බව පැහැදිලි ය.

මිනිමැරුම්, මංකොල්ලකෑම්, අල්ලස් ගැනීම්, ස්ත්‍රී දූෂණ , ළමා අපයෝජන ආදී නොයෙකුත් සමාජ විරෝධී ක්‍රියා රැසක් අපට ජනමාධ්‍යයෙන් නිතරම අසන්නට දකින්නට ලැබෙයි. මෙවන් සමාජ අපගාමී සිදුවීම් නිරන්තරයෙන් ප්‍රචාරය කිරීම තුළ එය පුද්ගලයාගේ මනසට අභ්‍යන්තරීකරණය වී පසුව සාමාන්‍යකරණය වෙයි.

එනම් මෙම දුරාචාරයන් පොදු ජනතාවට සාමාන්‍ය සිදුවීම් බවට පත් වේ.
යුද්ධය, සුනාමි ව්‍යසනය ආදී සිදුවීම් වල ලේ වැගිරීම්, සමූහ මරණ ආදිය මිනිසුන්ට සාමාන්‍ය සිදුවීම් බවට පත් විය. එනිසා අපරාධ වලට පෙළඹීම් ද වැඩි විය.

එබැවින් ජනමාධ්‍ය අපරාධ වාර්තාකරණයේ දී ස්වයං වාරණයක් මෙන්ම ජනමාධ්‍ය ආචාර ධර්ම වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

එමෙන්ම ජනමාධ්‍ය මෙන්ම සමාජය විසින් වැඩි ඉඩකඩක් ලබා දෙනුයේ සමාජ විරෝධී ක්‍රියා උලුප්පා පෙන්වීමටය. එක් පුද්ගලයෙකු හෝ කණ්ඩායම් මගින් සිදුකරන යහපත් ක්‍රියාවන්ට ලැබෙන ප්‍රචාරය අඩුය.

මේ නිසා යහපත් දේ යටපත්ව අයහපත් දේ ඉස්මතු වෙයි. බුදුවරු බෝසත්වරු දැවෙන සිත් සනසාලන්නට කොතෙකුත් උපදෙස් දුන්න ද ලෝකයම රවටන දෙව්දත්වරුන්ගේ උපදෙස් වලට ද මිනිස්සු රැවටෙති. ලෝකයේ ස්වභාවය එයයි. එනිසා හොඳ නරක සත්‍ය අසත්‍ය අඩු වැඩි වශයෙන් ඇති ලෝකය තුළ අප අවධි වූ මනසකින් යුතුව ක්‍රියා කළ යුතු ය.

යහපත යටපත් වී අයහපත ඉස්මතු වන ලෝකය තුළ තම බලය අහිමි වූ නායකයෝ ද බලවන්තයෝ ද තැවෙමින් මනසින් දැවෙමින් සිටිති. එමෙන්ම සාධාරණය ඉටු නොවීම නිසා කෝපයටත් වේදනාවටත් පත් මිනිසුන් ද බොහෝ ය. යහපත වෙනුවට අයහපත රජයන කලියුගයේ මේ සියල්ල සාමාන්‍ය යැයි සිතා උපේක්ෂාවෙන් සිටින්නට අපට සිදුවෙයි. නියඟය නිසා දෝෂාරෝපණ අසන අධික වර්ෂාව නිසාත් දොස් අසන අහස සියළු ගැරහුම් විඳිමින් ඉවසන්නා වූ අහස සේ අප ද මැදහත් සිතින් සිටිය යුතුය.

දිවැස් ලාභීන් ද තම සෘධිය පාවිච්චි කර අහසෙන් නොයා රළු බොරළු මාවතේ ගමන් කිරීම තෝරා ගත්හ. එනිසා හොඳ නරක මැද නොසැලී නොවැටී සිටින්නට අප අධිෂ්ඨානය කළ යුතු ය.
ගේය පද රචක වසන්ත කුමාර කොබවකයන් සමාජයේ යථාර්ථය අපට පෙන්වා දෙමින් නොසැලී සිටින්නට උපදෙස් දෙයි. අචාර්ය රෝහණ වීරසිංහයන්ගේ ස්වර සංයෝජනය හා ගැයුමද මැනවින් සුසංයෝජනයව ඇත.

ලාභ අලාභ යස අයස මැද ගලන මේ ජීවිත ගමන නොසැලී සිටින්නට බුදු දහම පෙන්වා දෙන මැදුම් පිළිවෙත අපට වඩාත් යෝග්‍ය වන බව මෙයින් පැහැදිලි ය.

චාමිකා ජනානි ද සිල්වා



# බොදු ආගමික සිද්ධස්ථාන හා පාරිසරික ප්‍රබෝධය ගැන ලියැවුණු



# "ග්‍රැමෆෝන් ගී"

**ඉපැරණි ගී තැටි 17497 ක් සහ එදා මෙදා ගැයුණු අතිශය දුර්ලභ ගීත 38300ක් පණ දෙවෙනි කොට සුරකිමින් හෙළ ගී කෙත සුරක්ෂිත කිරීමේ යුග මෙහෙයක නිරත හේමාල් යශනාථ විජේසිංහ මහතා රංගිරි ශ්‍රී ලංකා පුවත්පත වෙත විශේෂයෙන් ලියන ලිපියකි .**

ග්‍රැමෆෝන් තැටි පරීක්ෂා කිරීමේදී බොදු ආගමික සිද්ධස්ථාන හා පාරිසරික ප්‍රබෝධය ගැන ලියැවුණු ගීත විශාල ප්‍රමාණයක් හමුවේ. දශක ගණනාවක් ගතවී ඇතත් එම ගී වල වටිනාකම මඳක් හෝ හීනවී ගොස් නොමැත.

දඹදිව ජේතවනාරාමේ විහාරය ගැන 1940 දශකයේදී ඇලන් රත්නායක ශිල්පියා විසින් ගායනා කර ඇති මේ ගීතය දෙස බලන්න.

*"ජේතවනාරාමේ - අති රමණී -
ජේතවනාරාමේ
අනාත පිණ්ඩික ඒ සිටාණෝ
ලෝ කෝත්තර ශ්‍රී ධර්මේ අසාලා
පිදුවේ මුනිඳුටා ඒ විහාරේ*

*සුදර්ශනාවේ සංඝාරාමේ
සඟ සතු කාළය මෙසේ සිටාණෝ
ජේතවනාරාමේ*

*සංසාරේ ඝෝර දීපයෙහි
මිදෙනා සේ බැති පෙම පා බෝමා
නිවනේ සැපතා
මේ නිවනේ පතා පතාලා
ජේතවනාරාමේ"*

සොබා දහමෙන් අපට ලබාදී ඇති මහගු දායාදයක් වන ''දුන්හිඳ දිය ඇල්ල දෙස විදෙස් සංචාරකයින්ගේ අවධානය යොමු වූ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙලේ දිය ඇල්ලකි. සරත්චන්ද්‍ර ආටිගලයින් විසින් පද රචනා කළ ලතා වල්පොළ ගායිකාව විසින් ගයන ලද මෙම ගීතය එහි ස්වභාවය මනා ලෙස කියාපායි.

*" දුන්හිඳ හැලෙන
සැම තැන නැගෙනා
දුන්හිඳ දිය - සැලෙනා දිය
හැමතැන නැගෙනා
දුන්හිඳ දිය හැලෙනා දිය
ගල්පරවල හැපෙනා
ලලිත මිහිරි කොමළ සිනා
රැලි නැඟ එන්නේ
ළඟට ඇසෙන බමර - කොවුල් හඬ
පරදන්නේ
හැලෙන සුනිල් ජලය ගලා - ගඟට
හැරෙන්නේ
නැගෙන ඒ දුම අවට බලා
මිහිර සොයන්නේ*

HMV තැටියක් ඔස්සේ ශ්‍රාවකයින්ට ශ්‍රවණය කිරීමට ලැබුණු එම ගීතයට සංගීතය සපයා දී ඇත්තේ P.L.A සෝමපාල මහතාය. ''කොලොම්බියා'' ලේබලයට සෝමපාල ගායිකාව විසින් මෙම ගීතය ගායනා කර ඇත. එහි සංගීතයද PLA සෝමපාල මහතාය. චිත්‍රා සෝමපාල ඔහුගේ බිරිඳ වන අතර ඔහුගේ හඬද පසුබිමින් ඇසේ. රස වින්දනය ඔස්සේ සිතන විට ලතා වල්පොල මහත්මිය ගායනා කළ ගීතය වඩා රසවත්ය.

''කොලොම්බියා'' ලේබල ග්‍රැමෆෝන් තැටියකට ARM ඉබ්‍රාහිම් මහතා ගායනා කල මුතියංගණා වෙහෙරේ - ලංකාවේ '' ගීතය තවත් බොදු ආගමික ස්ථානයක් ගැන ලියවුණ ස්ථානයකි.

*"මුතියංගණා වෙහෙරේ ලංකාවේ
මුණි රජතුමාගේ දීප පද දිනු
මුතියංගණා වෙහෙරේ*

*සීතල සෝබන නිල් ජල දහරේ
සිරිපද යුගයේ දිනු මුනින්දා
සමනල කන්දෙහි සිරි පද ලාංජන
පිහිටෙව් ලෝනා පාරි ශුද්ධෙ
මුනි රජතුමාගේ - දීප පද දිනු
මුතියංගණ ශ්‍රී රූපේ*

(මෙම ගීතයේ සංගීතය හා පද මාලාව ගැන තොරතුරු නොමැත.)

පාරිසරික ප්‍රබෝධය වෙනුවෙන් ලියැවුනු ගිත අතුරින් එවකට ඉතා ජනප්‍රිය වූ ගීතයකි. ''පියකරු නුවර වැවේ''

සුනිල් ශාන්තයන් විසින් පද රචනා කළ සූර්ය සංකර් මොල්ලිගොඩ මහතා විසින් සංගීතය සැපයූ මෙම ගීතයේ තනුව හා ගායනය සිදුකළේ සුනිල් ශාන්තයන් විසිනි.

*"පියකරු නුවර වැවේ
දිය රැලි සඳපානේ
ලෙලවෙයි - නැලවෙයි - හා හා සිරියා
මේ හෙල සිහින ලොවේ*

*බලනු අනේ අර බලනු අනේ අර
දළදා මැදුරේ සිරියා
සුදු සොම් සඳ රැස් එමනේ වැටී
රැස් දහරා එමනේ වැටී
දළදා සමිඳුන් වඩිනා සැටියකි
බොදු දන වෙත පැහැදී*

*ඇහැලේපොළ නිලමේ කළ වරදට
ඇහැලේ පොල දේවී
බෝගම්බර වැව් පතුලේ හෙලී - කළ ජීවිත
පූජා
සිහිකොට තුරුලිය වැලපෙන රඟ පා
පිණි පොද පොද බේරී*

*වනමල් පිපිලා වැව්දිය අතුරින්
නැග එන මද පවනේ
ඒ සුදු මුදු හෙල සුවඳ වැදී
දළදා මැදුර පෙනේ
මේ කදු පිරිමැද මහද සනසන
මගේ උඩරට මැණිකේ*

අනුරාධපුරය පූජනීය නගරයෙකි. මෙම පූජනීය නගරය ගැන ලියැවුණ මෙම ගීතය රචනා කර ඇත්තේ කරුණාරත්න අබේසේකර මහතාය. සංගීතය සපයා ඇත්තේ ආර්. ඒ. චන්ද්‍රසේන මහතාය. ලතා වල්පොල ශීල්පිණිය HMV ලේබල තැටියකට මෙම ගීතය ගායනා කර ඇත.

*"සිරි අනුරාපුර ශ්‍රියාව පේනා
ඈත අතීතයේ ප්‍රබෝධ පානා
සම්බෝධි ඥාණය හිමි ලැබුවේ
බෝධි රාජා ශ්‍රී මහ බෝ හිමිවේ
ශාන්තිය ගෙන දේ
ථූපාරාමේ ගල් කුලුණු පෙනේවි
මේ හෙළ දීපේ පැරණි විහාරේ
සාදු ජනා නිති පූජා පානා
පූජනීය බුදු විහාර පේනා*

*මහමෙව්නාවේ කාන්තිය විහිදේ
රන්වැලි සෑ හිමි ශාන්තිය දේවී
මහමෙව්නාවේ කාන්තිය විහිදේ
නැග එන සොම්බර සුපුන් සඳෙනි
සෝබමාන වැව් පොකුණු ද සේනා
හංස සේරු එහි සැනසෙනි පීනා*

සීගිරිය ආගමික සිද්ධස්ථානයක් නොවුනත් පාරිසරික ප්‍රබෝධයට තුඩුදුන් වැදගත් ස්ථානයකි. එහි සංස්කෘතික වැදගත්කම විදේශ රටවල පවා ප්‍රචලිතව ඇත.

මහගම සේකරයන් විසින් පද රචනා කළ පණ්ඩිත් අමරදේවයන් තනුව සැකසූ සීගිරිය ගැන කියැවෙන මෙම ගීතය විශිෂ්ඨතම නිර්මාණයකි. පණ්ඩිත් අමරදේවයන් මෙම ගීතය ගායනා කරන්නේ වජිරා බාලසූරිය නම් ප්‍රවීණ ගායිකාව සමඟය. HMV ලේබලය යටතේ වෙළඳ තැටියක් වශයෙන් නිකුත් විය. ඊට පෙර ජාතික ගුවන් විදුලියේ සරළ ගී වැඩසටහන් සඳහා තැටි ගතකර ඇත.

*"සීගිරියේ සිතුවම් රමණී
අති නිර්මල ගීතේ දැරූ ලෝකේ
සෝබන මේ - සෝබන මේ - නයන රසේ දර්ශනවේ
අති නිර්මල ගීතේ දැරූ ලෝකේ
මහා ගලේ සැදී ලෙන තුලෙහි
සැමතින් පුදුමා වූයේ
සීගිරියේ සිතුවම් රමණී*

*ලෝ තුලෙහි කීර්තිය පෑ
නොනැසෙන සේ
නාරි දේහේ ලාලිත භාවේ
සෝභා ශාන්ති පතුරුවනා*

*අති නිර්මල ගීතේ දැරූ ලෝකේ
සීගිරියේ සිතුවම් රමණී*

ග්‍රැමෆෝන් තැටි පරීක්ෂා කිරීමේදී බොදු ආගමික සිද්ධස්ථාන හා පාරිසරික ප්‍රබෝධය ගැන ලියැවුණු ගීත විශාල ප්‍රමාණයක් හමුවේ. දශක ගණනාවක් ගතවී ඇතත් එම ගී වල වටිනාකම මඳක් හෝ හීනවී ගොස් නොමැත.

දඹදිව ජේතවනාරාමේ විහාරය ගැන 1940 දශකයේදී ඇලන් රත්නායක ශිල්පියා විසින් ගායනා කර ඇති මේ ගීතය දෙස බලන්න.

"ජේතවනාරාමේ - අති රමණී - ජේතවනාරාමේ
අනාත පිණ්ඩික ඒ සිටාණෝ
ලෝ කෝත්තර ශ්‍රී ධර්මේ අසාලා
පිදුවේ මුනිඳුටා ඒ විහාරේ

සුදර්ශනාවේ සංඝාරාමේ
සඟ සතු කාළය මෙසේ සිටාණෝ ජේතවනාරාමේ

සංසාරේ ඝෝර දීපයෙහි
මිදෙනා සේ බැති පෙම පා බෝමා
නිවනේ සැපතා

සටහන
හේමාල් යශනාථ විජේසිංහ




පරලෝ සැපත් විශ්‍රාමික සංස්කෘතික අධ්‍යක්ෂ ඩී.එම්.එච්.කරුණාරත්න මහතාට උපහාර පිණිස එතුමාගෙ මෙම ලිපිය පළකෙරේ.

# යුරෝපියෝ

පුනරුදය යනුවෙන් අර්ථ ගන්වා ඇත්තේ යළි පිබිදවීමයි. බොහෝ ඉතිහාසඥයින්ගේ ආකල්පය අනුව යුරෝපයේ මධ්‍යකාලීන යුගය අවසන් වීම හා නූතන යුගය ආරම්භ වීමට පෙර එම යුගයන් දෙක අතර වකවානුව පුනරුද කාලපරිච්ඡේදයක් ලෙස පැවති බවයි. ඉහත සඳහන් කළ ආකාරයට පුනරුදය (Renaissance ) යන ප්‍රංශ වචනයේ අර්ථය වන්නේ යළි පිබිදීමයි. බොහෝ ඉතිහාසඥයෝ මධ්‍යකාලීන අඳුරු යුගයට පසුව නවෝදයක් සිදුවූ බවක් ඇඟවීම සඳහා මෙම යළි පිබිදීම පිළිබඳ සංකල්පය යොදාගෙන ඇත. අනෙක් අතට මෙම යළි පිබිදීම යනු යුරෝපයේ සංස්කෘතික, දේශපාලනික, සමාජීය, ආගමික ආර්ථික හා විද්‍යාත්මක ආදී සෑම අංශයකටම ඇතිවූ නව ප්‍රබෝධය හා විකාශනය ලෙසද අර්ථකතනය කළ හැකිවේ.

පුනරුදය ඇතිවීමට බලපාන ලද සාධක කිහිපයක් වූ අතර ඉන් ආසන්නතම හේතුව වූයේ ක්‍රි.ව 1453දී ඔටෝමන් තුර්කිවරුන් විසින් නැගෙනහිර රෝම අධිරාජ්‍යයේ අගනුවර වූ කොන්ස්තන්තීනෝපලය අල්ලා ගැනීමයි. මධ්‍යතන යුගයේ පැරණි ග්‍රීක රෝම සාහිත්‍යය හා දාර්ශනික කෘතින් ආරක්‍ෂා වී පැවතියේ මෙම කොන්ස්තන්තිනෝපල් නගරයේ පුස්තකාල හා විද්වතුන් මතය. කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කින්ගේ ආධිපත්‍යයට නතුවීම නිසා ක්‍රිස්තු භක්තික විද්වත්හු ඔවුන් සතුව පැවති ග්‍රීක, රෝම සම්භාව්‍ය ග්‍රන්ථ හා ලේඛන ද රැගෙන පලාගොස් බටහිර යුරෝපයේ පදිංචි වූහ. අනතුරුව යුරෝපය පුරා මෙම ග්‍රීක, රෝම ශාස්ත්‍රීය කෘති වැඩි වැඩියෙන් පරිශීලනය කිරීම නිසා ග්‍රීක රෝම සංස්කෘතින්හි යළි පිබිදීමක් ඇතිවිය.

යුරෝපයේ පුනරුදය ඇතිවීමට තුඩුදුන් දීර්ඝකාලීන හේතු සාධක ද බොහෝමයක් පැවතුනි. ඉන් සුවිශේෂී වූ කරුණක් නම් 12 වන සියවසේ පමණ සිට යුරෝපයේ වාණිජ කටයුතු සම්බන්ධයෙන් ඇතිවූ ප්‍රවණතාවයයි. වෙළඳ කටයුතු නිසා ඉතාලි නගරවල ධනවත් වෙළඳ හා බැංකුකරුවන් පිරිසක් බිහිවිය. මොවුනට ශාස්ත්‍රිය අංශය කෙරෙහි අවධානය යොමු කිරීමට අවශ්‍ය විවේකය තිබුණු අතර අනුග්‍රහය දැක්වීමට අවශ්‍ය තරම් ධනයක් ද ඔවුන් සතුවිය.

මීට නිදසුන් ලෙස මේලානයේ ස්ෆෝසා, ප්ලෝරන්ස්හි මෙඩිචි, පුරාහි එස්ටේ සහ මාන් මුවාහි ගොන්සාගා වැනි ධනවත් පවුල් මේ සඳහා අනුග්‍රහය දක්වන ලදී. එසේම 5 වන නිකලස් පාප්තුමා 6 වන ඇලෙක්සැන්ඩර්, දෙවන ජූලියස්, 10 වන ලියෝ වැනි පාප්වරුද ඉතාලිය කලාත්මක පුරවරයක් කිරීම සඳහා අනුග්‍රහය දැක්වූහ. 12වන සියවසේ සිට ඉතාලියේ බිහිවී තිබුණු විශ්ව විද්‍යාල මගින් ශාස්ත්‍රීය නවෝදයට අවශ්‍ය බුද්ධිමය පරිසරය ද ගොඩනැගීම නිසා ඉන් නිදහස් චින්තනයට මඟ විවර විය.

යුරෝපයේ මධ්‍යතන යුගයේදී ආගමික මුහුණුවරක් ගත් කලාව හා සාහිත්‍ය පුනරුදයේ බලපෑම නිසා ලෞකික මුහුණුවරක් ගත් අතර පුද්ගලයා වැදගත් කොට සැලකීම දක්නට ලැබීම විශේෂත්වයක් විය. මේ නිසා මානව වාදය ඉස්මතු වූ අතර මිනිසා තර්කයට හා බුද්ධියට මෙන්ම රසඥතාවයට මුල් තැන දෙමින් සාහිත්‍යය කලා, ඉතිහාසය නීතිය, තාරකා විද්‍යාව වැනි විෂයන් අධ්‍යයනය කිරිමට පෙළඹුනි. මේ යුගයේදී ග්‍රීක හා ලතින් භාෂාවල ඇතිවූ දියුණුවත් සමඟ ග්‍රීක නාට්‍ය සාහිත්‍ය පිළිබඳ ව නව ප්‍රබෝධයක් ඇතිවිය. මේ වකවානුවේ යුරෝපයේ සිටි වැදගත් කතුවරයින් ලෙස එංගලන්තයේ තෝමස් මුවර්, ප්‍රැන්සිස් බේකන් හා විලියම් ෂේක්ස්පියර් ද ඕලන්දයේ ඉරාන්මස්ද දැක්විය හැකිය.




එසේම චිත්‍ර කලා අංශයෙන් ලෝ පතල මැසෙක් සියෝ, බොට්ටිබෙල්ලි, ලියනාඩෝ ඩාවින්චි, රපායල් සහ මයිකල් ආන්ජිලෝ ද සුවිශේෂී නිර්මාණ කරුවෝ වූ අතර පෙට්රාක්, බොකැෂියෝ හා ඩාන්ටේ යන විද්වතුන් ද ප්‍රමුඛස්ථානයක් ඉසිලූ අය වූහ.

මෙම පුනරුද්යේ තවත් විශේෂ ලක්‍ෂණයක් ලෙස විද්‍යාත්මක ක්‍ෂේත්‍රයේ ඇතිවූ විශාල ප්‍රබෝධය දැක්විය හැකිය. ඒ අනුව විද්‍යාත්මක තොරතුරු රාශියක් මේ නිසා අනාවරණය කරගත හැකිවිය. ඒ අනුව පෝලන්ත ජාතික නිකලස් කොපර්නිකස් විසින් පෘතුවිය ගෝලාකාර බවත් සූර්යයා වටා අනිකුත් ග්‍රහයන් පරිභ්‍රමණය වන බවත් සොයා ගන්නා ලදී. එසේම ජොහැන්ස් කෙප්ලර් නම් විද්‍යාඥයා විසින් සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක සූර්යයා වටා ඉලිප්සාකාරව ගමන් ගන්නා බවත් සොයා ගත්තේය. ඉතාලි ජාතික ගැලීලියෝ ද දුරදක්කය නිපදවූ අතර අයිසෙක් නිව්ටන් විසින් ගුරුත්වාකර්ෂණ නියමය සොයා ගන්නා ලදී.

තවද වෛද්‍ය විද්‍යාවේ නවෝදයක් ඇති කරමින් වෛද්‍ය විලියම් හාවි විසින් රුධිර සංසරණය පද්ධතිය ගැන තොරතුරු හෙළිකළ අතර වෛද්‍ය පැරසල්සන් හා මයිකල් සර්වෙටන් ආදීන් රෝග සෑදීමට හේතු හා රෝග චිකිත්සක ක්‍රමද සොයා ගත්හ. එසේම ක්‍රි.ව 1447 දී ජර්මන් ජාතික ගුටන්බර්ග් විසින් මුද්‍රණ යන්ත්‍රය නිපදවන ලදී.

පුනරුදය සමඟ ඇතිවූ මෙම දියුණුව සහ ශාස්ත්‍රාලෝකය ග්‍රීක, රෝම, ශිෂ්ඨාචාරවල අංග ලක්‍ෂණ යළි පණගැන්වීමත් පමණක් නොවීය. එය 8වන සියවසේ පමණ සිට වැඩෙමින් පැවැති ආසියානු හා අරාබි ශිෂ්ඨාචාරවල වැදගත් අංග ලක්‍ෂණ රාශියක ආභාෂය ලැබීය. විශේෂයෙන් මේ නිසා වීජ ගණිතය, රේඛා ගණිතය, මිනින්දෝරු විද්‍යාව, තාරකා ශාස්ත්‍රය, ආරෝග්‍ය ශාලා ක්‍රමය ආදී බොහෝ දෑ යුරෝපා ජාතින් අරාබින් මගින් ලබා ගනී.

මෙසේ මධ්‍යතන යුගයේ ඇතිවූ පුනරුදයේ සුවිශේෂී වූ ප්‍රතිඵලයක් වූයේ යුරෝපය තුළ ඇතිවූ දේශගවේෂණ ව්‍යාපාරයයි. පුනරුදය නිසා යුරෝපයේ සංස්කෘතික, දේශපාලනික, සමාජීය, ආගමික හා ආර්ථික මෙන්ම විද්‍යාත්මක ක්‍ෂේත්‍රවල විශාල ප්‍රබෝධයක් ඇතිවිය. මෙහිදී විද්‍යාත්මක අංශයේ වූ පිබිදීම සුවිශේෂී විය. නිදසුනක් ලෙස දක්වතොත් ටොලමිගේ ලෝක සිතියම මගින් ලෝකය ගෝලාකාර බව සොයාගත් අතර නාවිකයින්ගේ මුහුදු ගමන් වලදී දිසාව හඳුනා ගැනීමට උපකාරී වූ මාලිමා යන්ත්‍රය නිපදවීම, තමා සිටින ස්ථානයේ සිට තාරකා වලට ඇති දුර තීරණය කිරීමට අවශ්‍ය වූ උතුරු තරු මාපකය නිපදවීමට මුද්‍රණ යන්ත්‍රය නිපදවීම යන ආකාරයට විද්‍යාත්මක ක්‍ෂේත්‍රයේ ඇතිවූ නව ප්‍රබෝධය නිසා යුරෝපයේ එපිට දේශ ගවේෂණයට විශාල උද්යෝගයක් ජනිත විය.

මෙම පිබිදීමේ ප්‍රතිඵලයක් වූයේ නව ලෝකය සොයා යුරෝපියයන් ගවේෂණ ව්‍යාපාරයේ

# ඇතිවූ විද්‍යා පුනරුදය හා දේශ ගවේෂණ ව්‍යාපාරය

නිරතවීය. ඒ අනුව බර්තොලමියුඩයස් නැමැත්තා විසින් අප්‍රිකාවේ කුණාටු තුඩුව ද, කොළොම්බස් විසින් හිස්පැනියෝලාවද වෙස්පුචි විසින් ඇමරිකාවද, කැරිබ් පියපුතු දෙදෙනා කැනඩාවද, වස්කෝද්ගාමා ඉන්දියාවද, මැගලන් පිලිපීනයද සොයා ගන්නා ලදහ. මෙසේ දේශගවේෂණ කටයුතු වල නිරත වූ පෘතුගාලය, ස්පාඤ්ඤය, ඕලන්දය, ඉතාලිය, ප්‍රංශය, එන්ගලන්තය යන රටවල් එකී රටවල ස්වකීය ආධිපත්‍ය තහවුරු කිරීමට උත්සාහ ගන්නා ලදී. මීට විද්‍යා පුනරුදයෙන් බිහිවූ නව නිපදවීම් බෙහෙවින් බලපාන ලද බව පෙනේ.

දේශගවේෂණ ව්‍යාපාරය ඇතිවීම කෙරෙහි බලපාන ලද තවත් වැදගත් සාධකයක් වූයේ යුරෝපයේ වාණිජ අංශයේ ඇති වූ විපර්යාසයයි. ක්‍රි.ව 1453 දී සිදුවූ කුරුස යුද්ධ හේතුවෙන් පෙර අපර දෙදිග ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානයක් වූ කොන්ස්තන්තිනෝපලය තුර්කීන් සතුවීම නිසා ඔවුන් විසින් වෙළද ද්‍රව්‍ය වල මිල ඉහල දැමීම, තීරුබදු වැඩි කිරීම, අත්‍යවශ්‍ය භාණ්ඩ කලට වේලාවට ලබානොදීම ආදී වෙළඳ සම්බාධකයන් පැනවූහ. මේ බව අවබෝධ කරගත් යුරෝපියයෝ තමන්ම ආසියාතික වෙළඳාම්වල යෙදීමටත් එමගින් මුස්ලිම්වරුන්ගේ ආර්ථිකය කඩා බිඳ දැමීමටත් අරමුණු කර ගනිමින් ආසියාවට පිවිසීමේ නව මුහුදු මාර්ග සෙවීමට පෙළඹීමේ ප්‍රතිඵලය වූයේ දේශගවේෂණ ව්‍යාපාරයට නැඹුරුවීමයි.

තවද අද්භූත ජනක අත්දැකීම් ලබාගැනීමේ උනන්දුවක් සහ විවිධ දේ ගැන සොයා බැලීමේ කුතුහලයක් පුනරුද සමයේ යුරෝපා ජාතීන් තුළ ඇතිවී තිබුණි. ක්‍රි.ව 1453 දී කුරුස යුද්ධ ඇතිවීමට පෙර හා පසුවද ඉතාලි ජාතිකයෝ අරාබීන් සමඟ සරුසාර වෙළඳ සම්බන්ධතා පැවත්වූහ. 13 වන සියවසේ අවසාන භාගයේදී මාර්කෝපෝලෝ ගේ නායකත්වයෙන් යුතු වෙළඳ කණ්ඩායමක් ගොඩබිම ඔස්සේ ගමන්කොට චීනයට ලඟාවී එවකට එහි සිටි මෝගල් පාලකයා වූ කුබිලයි ඛාන් සමඟ මිත්‍ර වී එතැනින් ජපානයටද කුලුබඩු දිවයින් වලටද ගිය මෙම වෙළෙඳ කණ්ඩායම ආරක්ෂා සහිතව ආපසු වැනීසියට ලඟාවූහ. එම වෙළඳ කණ්ඩායමේ ගමන් විස්තරය සහ ආස්වාදජනක අත්දැකීම් ලබාගැනීමේ ආශාවක් සහ තොරතුරු සොයායාමේ කුතුහලයක් ගොඩනැගී තිබුණි. එතැන් පටන් දුරබැහැර ප්‍රදේශ සොයා ගොඩබිම ඔස්සේ පමණක් නොව මහා සාගරය ඔස්සේද යාමට උනන්දුවක් ඇතිවීමද දේශ ගවේෂණයට තුඩුදුන් සාධකයක් විය.

දේශගවේෂණ ව්‍යාපාරයේ විකාශනය සඳහා ඉවහල් වූ තවත් වැදගත් සාධකයක් වූයේ නාවුක ක්ෂේත්‍රයේ ඇතිවූ ප්‍රගමනයයි. පෘතුගාලයේ නාවුක හෙන්රි (ක්‍රි. ව. 1394 - 1460) රජු විසින් ආරම්භ කොට පවත්වාගෙන යන ලද නාවික කටයුතු පිළිබඳ පර්යේෂණ ආයතනය හේතුකොටගෙන නාවිකයන්ට සුළඟ, මුහුදේ වඩදිය - බාදිය, සැඩ පහර පිළිබඳව පුළුල් අවබෝධයක් ලබාගත හැකිවූ බැවින් ආරක්ෂා සහිතව මුහුදු ගමන්වල යෙදීමට හැකිවිය. මෙම නාවික මධ්‍යස්ථානය වෙත යුරෝපයේ දක්ෂතම නාවිකයෝ තාරකා විද්‍යාඥයෝ හා භූගර්භ විද්‍යාඥයෝ ආදීහු ඇදී ආහ. මෙම නාවික මධ්‍යස්ථානය මගින් වාර්ෂිකව අප්‍රිකාවේ බටහිර වෙරළ ඔස්සේ නාවික ගවේෂණ කණ්ඩායම් පිටත්කර හරින ලදී. මේ නාවිකයෝ "මදීරා" දිවයින් සොයාගත් අතර සෙනගල් හා සූඩාන් ප්‍රදේශවලටද ඔවුහු ලගා වූහ. එම ප්‍රදේශවල සිට වහලුන් හා රත්රන් යුරෝපයට ගෙනඒමට හැකිවූ අතර පෘතුගීසි අධිරාජ්‍යයක් ගොඩනැගීමේ මංපෙත්ද විවරණ විය.

ක්‍රි.ව 1498 දී ඉන්දියාවේ කැලිකට් වණයට ලඟාවූ වස්කෝද ගාමා කුලුබඩු හා ක්‍රිස්තියානීන් සොයා පැමිණි බව යනුවෙන් කළ ප්‍රකාශයට අනුව ක්‍රිස්තියානි ආගම පැතිරවීමේ අභිලාෂයද දේශගවේෂකයින් තුළ පැවැති බැව් ගම්‍යමාන වේ. ඊට තුඩුදුන් වැදගත් කරුණක් වූයේ මේ වන විට පෙස්ටස්ජෝන් නමින් හැඳින්වූනාමික රජ කෙනෙකු පාලනය කළ විශාල ක්‍රිස්තියානි රාජ්‍යයක් පෙරදිග තිබෙන බවට මිථ්‍යා විශ්වාසයක් ක්‍රිස්තු භක්තිකයින් අතර පැවැති අතර එම ක්‍රිස්තු රාජ්‍ය සොයා ගෙන ක්‍රිස්තු ධර්මය ප්‍රචාරය කිරීම මගින් එවකට යුරෝපයේ ව්‍යාප්ත වෙමින් තිබූ ඉස්ලාම් ධර්මය ප්‍රචලිත කිරීමේ ව්‍යාපාරය වැළැක්වීමට කල්පනා කිරීම ද යුරෝපියයෝ දේශ ගවේෂණ ව්‍යාපාරයට යොමු කිරීමට බලපෑ සාධකයක් ලෙස පෙන්වා දිය හැක.

දේශගවේෂණ ව්‍යාපාරයේ ප්‍රතිඵල සමස්ත ලෝකය කෙරෙහිම බලපාන ලද අතර ඉතාම පුළුල් හා අතිශය වැදගත් දීර්ඝකාලීන ප්‍රතිඵලයක් වූයේ යුරෝපයේ වෙළඳ හා වාණිජ කටයුතු සම්බන්ධයෙන් සිදුවූ ප්‍රගමනයයි. මෙහිදී දක්නට ලැබුණු වැදගත් කරුණක් වූයේ මධ්‍යකාලීන අවධියේ යුරෝපයේ වැදගත් වෙළඳ මධ්‍යස්ථාන ලෙස ක්‍රියාත්මක වූ ඇලෙක්සැන්ඩ්‍රියා, පීසා, ජිනෝවා සහ වෙනීසිය වැනි නගරවලට තිබූ තත්වය ලිස්බන්, කේඩීස්, සැවිලේ, ලන්ඩන් හා ඇන්ටවර්ස් වැනි අලුතින් බිහිවී වෙළඳ මධ්‍යස්ථාන වලට හිමිවීමයි. එසේම පෙර අපර දෙදිග වෙළඳ කටයුතු වලට ප්‍රධාන වශයෙන් භාවිතා කළ මුහුදු මාර්ගයට වැදගත් කමක් හිමිවිය.

එමෙන්ම ඇමරිකාව සහ ආසියාව කරා යාමට නව මුහුදු මාර්ග සොයා ගැනීම නිසා එතෙක් යුරෝපා ජාතින් නොදැන සිටි වෙළඳ භාණ්ඩ රාශියක් ඔවුන් වෙත හඳුන්වා දීමට හැකිවිය. අර්තාපල්, කොකෝවා, දුම්කොල, ක්විනීන්, උක්, තල්මස් තෙල් සායම් වර්ග, ඉන්ඩිගෝ, තේ, කෝපි, පිඟන් භාණ්ඩ යනාදිය ඒ අතරින් වැදගත් වූ අතර ඉන්දීය රෙදිපිළි සහ පර්සියානු බුමුතුරුණු වලටද යුරෝපීය වෙළඳ පොළේ විශාල ඉල්ලුමක් ඇතිවිය.



යුරෝපා ජාතීන් අතර ගොඩනැගුණු අධිරාජ්‍යවාදී සංකල්පය දේශගවේෂණ ව්‍යාපාර තුළින් හටගත්තාවූ අයහපත් ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැක. මුලදී වෙළඳ සබඳතා මත යුරෝපීය බලවතුන් ඇමරිකා, අප්‍රිකා, මහාද්වීප කරා ලගා වූ අතර අවසානයේදී ඔවුහු එම ප්‍රදේශවල ස්වාමිවරු වශයෙන් පෙනී සිටින්නට වූහ. එම ප්‍රදේශ තමන්ගේ යටත් විජිත බවට පත්කරගෙන දේශපාලනික හා ආර්ථික වශයෙන් එම රටවල් සූරාකන ආකාරයක් දක්නට තිබුණි. විශේෂයෙන් කාර්මික විප්ලවයෙන් පසුව යුරෝපීය රටවලට අමුද්‍රව්‍ය ලබාගැනීමට සහ ඔවුන්ගේ නිෂ්පාදිත භාණ්ඩ අලෙවි කරගැනීම සඳහා මෙම යටත් විජිත යොදා ගන්නා ලදී. යුරෝපයේ නව මධ්‍යම පංතියක උපත සිදුවීම, අසහාය රාජාණ්ඩු පිහිටුවීම, යුරෝපීය ජනතාව වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීම හා ක්‍රිස්තියානි මිෂනාරී ව්‍යාපාරයේ කටයුතු පුළුල්වීම දේශගවේෂණයෙන් උදාවූ නව ප්‍රවණතාවයක් ලෙස දැක්විය හැක.

ඩී.එම්.එච්. කරුණාරත්න
විශ්‍රාමලත් සහකාර සංස්කෘතික අධ්‍යක්ෂ
අලුවිහාරය - මාතලේ

රංගිරි ශ්‍රී ලංකා
සත්‍ය ගවේෂී බෞද්ධ හඬ
රංගිරි ශ්‍රී ලංකා 2020 පෙබරවාරි- 2563 නවම් කලාපය

# සංයුක්ත නිකායේ තිබෙන දාර්ශනික පසුබිම පිළිබඳ විමසුමක්



බුදුරජාණන් වහන්සේ පන්සාලිස් වසක් මුළුල්ලේ දේශනා කළ අසූහාර දහසක් වූ ධර්මස්කන්ධය ත්‍රිපිටකය වශයෙන් බෙදා කොටස් තුනක් ඔස්සේ සංගායනා තුලින් බෙදා වෙන් කර ත්‍රිපිටකය පරිපූර්ණ වශයෙන් සංගායනා කළහ.

ඒ අනුව ත්‍රිපිටකය තුළ පළමු පිටකය වූ සූත්‍ර පිටකය පරීක්ෂා කර බැලීමේදී එය නැවත කොටස් 05කට බෙදා දක්වා ඇත.එනම්,

1.දීඝ නිකාය
2.මජ්ඣිම නිකාය
3.සංයුක්ත නිකාය
4.අඞ්ගුත්තර නිකාය
5.ඛුද්දක නිකාය වශයෙනි.

ඉහත බෙදීමට අනුව සූත්‍ර පිටකයට අන්තර්ගත කෘතියක් ලෙෂ සංයුක්ත නිකය හැඳින්වීමට පුළුවන. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑමෙන් තුන් මසකට පසු බුද්ධ ශාසනයේ පළමු ධර්ෂ සංගායනාව පවත්වන ලදි. මහා කාශ්‍යප හිමියන් ප්‍රධාන කොටගත් භික්ෂූන් වහන්සේලා පන්සිය (500) නමක් එකතුවෙන් දේශ, කාල, නිදාන වශයෙන් විසිරී පැතිරී තිබූ ධර්මය හරියට මල් ආසනයක විසිරී පැතිරී තිබූ මල් ඒකරාශී කොට පිළිවෙලට සැකසුවාක් මෙන් සියලු ධර්ම කොටස් ඒකරාශී කිරීම සංගායනාවේ ප්‍රධාන කාර්යක් වූවාට කිසිඳු සැකයක් නැත.

''සතත සුතත සහසසානි
සතත සුතත සතානිච
මාසටඨ චෙව සුතතනතා
එසො සංයුතත සඞගහො''

යන ගාථාව තුලින් ප්‍රකාශ කරනු ලබන්නේ ''සත්දහස් සත්සිය හැට දෙකක් (7762) සූත්‍රයන්ගෙන් සංගෘහිත වූයේ සංයුක්ත නිකාය නම් වේ'' යනුවෙනි. සූත්‍ර ගැන අවධානය යොමු කිරීමේදී ඒවා දීර්ඝ,මධ්‍යම,කෙටි වශයෙන් පවතී. ඒ තුලින් කෙටි යැයි පැවසුවද දීඝ,මජ්ජිම,අඞ්ගුත්තර යන කිසිවකට නොබැස ඒ සියල්ල එක් රැස්කොට ගෙතූ නිසා සංයුක්ත යැයි කීමටද පුළුවන.බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් හා මහ රහතන් වහන්සේලාගේ වදනින් දේශනා කළ සූත්‍ර රාශියක් අන්තර්ගත වී තිබීම මෙහි සුවිශේෂී ලක්ෂණයක් වේ. මෙම සූත්‍ර පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීමේදී පුද්ගලාර්ථ හා සමාජාර්ථ සාදනය කිරීමට උත්සාහයක් දරා ඇති බවක් දක්නට ලැබේ.

සංයුක්ත නිකාය පිළිබඳ වැඩිදුරටත් කරුණු පරීක්ෂා කර බැලීමේදී එය වග්ග වශයෙන් නැවත කොටස් 05කට බෙදා දක්වා ඇත.එනම්,

1.සගාථ වග්ග 2.නිදාන වග්ග 3.ඛන්ධක වග්ග 4.සළායතන වග්ග 5.මහා වග්ග වශයෙනි.

සගාථ වග්ගය සංයුක්ත වශයෙන් කොටස් 11කට බෙදා දක්වා ඇත.

1.දේවතා 2.දේවපුත්ත 3.කෝසල 4.මාර 5.භික්ඛුනි 6.බ්‍රහ්ම 7.බ්‍රාහ්මණ 8.වඞ්ගීස 9.වන 10.යක්ඛ 11.සක්ක

නිදාන වග්ගය සංයුක්ත වශයෙන් කොටස් 09කට බෙදා දක්වා ඇත. එනම්,

1.අභිසමය 2.ධාතු 3.අනමතග්ග 4.කස්සප 5.ලාභසක්කාර 6.රාහුල 7.ලක්ඛණ 8.ඔපම්ම 9.භික්ඛු

ඛන්ධන වග්ගය සංයුක්ත වශයෙන් කොටස් 13කට බෙදා දක්වා ඇත.එනම්,

1.ඛන්ධ 2.රාධ 3.දිට්ඨි 4.ඔක්කන්ති 5.උප්පාද 6.කිලෙස 7.සාරිපුත්ත 8.නාග 9.සුපණ්ණ
10.ගන්ධබ්බ 11.වලාහක 12.වච්ඡගොත්ත 13.ඣාන

සළායතන වග්ගය සංයුක්ත වශයෙන් කොටස් 10කට බෙදා දක්වා ඇත.එනම්,

1.වෙදනා 2.මාතුගාම 3.ජම්බුඛාදක 4.සාමණ්ඩකානි 5.බල 10.අබ්‍යාකත
6.මොග්ගල්ලාන 7.චිත්ත 8.ගාමණි 9.අසඞ්ඛත

මහා වග්ග සංයුක්ත වශයෙන් කොටස් 12කට බෙදා දක්වා ඇත.එනම්,

1.මග්ග 2.බොජ්ඣඞ්ග 3.සතිපට්ඨාන 4.ඉන්ද්‍රිය 5.සම්මප්පධාන 6.බල 7.ඉද්ධිපාද 8.අනුරුද්ධ 9.ඣාන 10.ආනාපාන
11.සොතාපත්ති 12.සච්ච

මේ අනුව සංයුක්ත නිකයේ වග්ග කොටස් කිරීමට පුළුවන. නැවතත් මෙම වග්ග සියල්ල අතුරු වග්ග වලට බෙදී වග්ග 228ක්ව පවතී.අක්ෂර වශයෙන් ගත් තල්හි සංයුක්ත නිකායේ අක්ෂර ලක්ෂ 08ක් සඳහන් වී ඇත.බණවර වශයෙන් ගත් කල්හි බණවර 100 ක් පවතී. මේ සියල්ලම එකතුව සංකලනයක් වශයෙන් සූත්‍ර 7762ක් වී ඇති බව දැක්වීමට පුළුවන.

**''අත්තානං සුඛනතො සුවත්තතො සවනතො සුදන්තො සුත්තණා සුත්ත සභාගතාවස සුත්තං සුත්තිනි අක්ඛාතං''** යන පාලි පාඨය විග්‍රහ කර බැලීමේදී මෙම සූත්‍රයන් තුළ ඇති වැදගත්කම විදහා දක්වයි.

අර්ථයන් උපදවනු ලබයි.
මනා කොට දේශනය කරනු ලබයි.
මනා කොට ශ්‍රවණය කරනු ලබයි.
සියලු ලෝ වැසියා වෙත් කරුණා, මෛත්‍රී පතුරවනු ලබයි.
මනා කොට ආරක්ෂාව ඇති කරනු ලබයි.
බුද්ධ ධර්මයේ ප්‍රමාණාත්මක භාවය තීරණය කර ගැනීමට සූත්‍ර යන්න ප්‍රමාණවත් වනු ලබයි.

සංයුක්ත නිකාය විශාල සූත්‍ර සමුදායකින් සැදුම්ලත් කෘතියක් වශයෙන් සැලකේ. ඒ අනුව විශාල යථාර්ථයක් සමාජයට දීමට එවක සිටි භික්ෂූන් වහන්සේලා උත්සාහ දරා ඇත. ගිහි-පැවිදි,උපාසක-උපාසිකා යන කාට වුවද ඇති වන අඩු-පාඩු වගේම පුද්ගල චර්යා ධර්ම විස්තරාත්මකව දැන ගැනීමට එම සූත ඉවහල් කර ගත හැකිය.

**''ආගමිස්සන්ති අත්තතථපරතථාදයො එතෙනා' ති ආගමො''**

යන පාලි පාඨය විමසා බැලීම තුලින් අවබෝධ වන දෙයක් නම් ආ පූර්ව ගම් ධාතෘඥවෙන් කනට ඇසීම තුලින් ආත්මාර්ථය නැති කිරීම තුලින් පරාර්ථය ඇති වන බවයි. තෘෂ්ණාව නැති වීමට ද එය හේතුවක් වේ. සංයුක්ත නිකාය පිළිබඳ කරුණු විග්‍රහ කර බැලීමේදී සූත්‍ර ඉතා කෙටි මෙන්ම සරල භාවයක් දක්නට ලැබේ. වඞ්ගීස, සාරිපුත්ත, නිකඛන්ත, අරති, පෙසල, අතිමඤ්ඤ, ආනන්ද, සුභාසිත ආදී සූත්‍ර පරීක්ෂා කර බැලීමේදී ඒබ ව වැඩි දුරටත් තහවුරු වේ. ඊට අමතරව ශ්‍රද්ධා ගුණය ගෙන දීර්ඝාමයත්,පරමාදමතනය, ධම්කථිකනයනට විචිත්‍ර ප්‍රතිභාභනය ගෙන අඞ්ගෝතර වර්ණනාවත් කරනු ලබයි.බුද්ධඝෝෂ ආචාරීන්ට ඥාණය විමසන්නට සංයුක්ත නිකායෙන් ගාථාවක් දී උන්වහන්සේගේ ඥාණය විමසූහ. එම ගාථාවේ ඵලය නම් ත්‍රිපිටක මැදුරෙහි නොනිවෙන පහනක් බඳු විසුද්ධි මාර්ගය රචනා වීමයි. විසුද්ධි මාර්ගය මහා සාංඝික ආදී සත්ත දස නිකාය වාසින් හා හේමවතාදී වන නිකාය වාසීන්ගේ ප්‍රහාර වළක්වමින් මහා විහාරයට රැකවල් ලත් බලකොටුව වන විසුද්ධි මාර්ගය සංයුක්ත නිකායේ එක් ගාථාවකින් මතු කර දුන් ධර්ම විෂයන්ගේ ඥාණ ප්‍රභේද පෙන්නුම් කරන ශක්ති විශේෂයක් සේ කියවේ. සංයුක්ත නිකායේ විශේෂත්වය නම් විදර්ශනා පමණක් නොව ඒ ඒ කාරණයන් පිළිබඳ විශිෂ්ඨ ප්‍රතිභාවද එළිදැක්වීමයි.මෙහි විශේෂත්වය නම් ප්‍රථම සංගායනාවේදී ප්‍රධාන වූ මහා කසුප් තෙරුන්ට සංයුක්ත නිකාය බාර දුන්හ. උන් වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර සංයුක්ත නිකාය අර්ථ දරමින් රැකගෙන ආහ. පළමුවෙන් මෙය සංගායනා කිරීමද මෙහි විශේෂ ලක්ෂණයකි.

බුද්ධ භාෂිත ශ්‍රාවක භාෂිත, දේවභාෂිත,ඍෂි භාෂිත වචනයන් උවමනා වූ විට සංයුක්ත නිකාය නිධානයක් බඳුය. ඒ ඒ කරුණු සඳහා ඉහත දැක්වූ සතර දෙනාම මෙහි දැක්වේ.ලෞකිකයන්ට හා ශාසනික වූවන්ට ආත්මාර්ථ හා පරාර්ථ සංසිද්ධිය පිණිස උපදෙස් සිය ගණනින් මෙහි අන්තර්ගතය. ස්කන්ධ,ධාතු,ආයතන,ඉන්ද්‍රිය,සප්ත,බොජ්ඣංග,ආර්ය සත්‍ය,ප්‍රත්‍යා ධර්ම මාර්ග ෂතරෙහිම සරල උපදෙස් අතින් බැලුවද සංයුක්ත නිකාය පරිපූර්ණය. නොයෙකුත් උපදේශයන්ගෙන්ද සංයුක්ත නිකාය අංග සම්පූර්ණවේ. දේශකයන්ටද,උපදේශකයන්ටද,උපදේශ කතා කීමට සුදුසු වූ මනෝහර පද වලින් යුක්ත ප්‍රමාණයෙන් අබැටක් පමණ වූ වීර්යෙන් පැතිර සිටිනා මහා වෘක්ෂයක් මෙන් ධර්ම විශේෂයෙන් සෑම කල්හිම සංයුක්ත නිකාය වැඩදායක වේ.

රතනසෙල ඓතිහාසික මහ පිරිවනෙහි,
ගලගෙදර රතනවංශ හිමි